2022 අගෝස්තු 24
2022 ஆகஸ்ட் 24
24 August 2022

NAOSL

# 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන විගණකාධිපති ත්‍රෛවාර්ෂික වාර්තාව

# 2018 இன் 19 ஆம் இலக்க தேசிய கணக்காய்வு அதிகாரச்சட்டத்தின் 14 ஆவது பிரிவின் பிரகாரம் பாராளுமன்றத்திற்கு சமர்ப்பிக்கப்படுகின்ற கணக்காய்வாளர் தலைமை அதிபதியின் மூன்றாண்டு அறிக்கை

# Triennial Report of the Auditor General presented in parliament in terms of Section 14 of the National Audit Act, No. 19 of 2018

එකොළොස් වන කාණ්ඩය - **06** (iii)
பதினோராவது தொகுதி - 06 (iii)
Eleventh Volume - 06 (iii)

## ප්‍රාදේශීය සභා
## பிரதேச சபைகள்
## Pradeshiya Sabhas

**ජාතික විගණන කාර්යාලය**
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



# 2018 ,2019 හා  2020 වර්ෂ සඳහා

## ත්‍රෛවාර්ෂික වාර්තාව

# ප්‍රාදේශීය සභා

# පටුන


| | හැඳින්වීම | පිටු අංකය |
|---|---|---|
| 01. | කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාව | 10 |
| 02. | කැකිරාව ප්‍රාදේශීය සභාව | 10 |
| 03. | කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව | 11 |
| 04. | ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව | 11 |
| 05. | තලාව ප්‍රාදේශීය සභාව | 12 |
| 06. | තිරප්පනේ ප්‍රාදේශීය සභාව | 13 |
| 07. | නොච්චියාගම ප්‍රාදේශීය සභාව | 14 |
| 08. | පදවිය ප්‍රාදේශීය සභාව | 14 |
| 09. | මැදවච්චිය ප්‍රාදේශීය සභාව | 15 |
| 10. | මිහින්තලය ප්‍රාදේශීය සභාව | 15 |
| 11. | රඹෑව ප්‍රාදේශීය සභාව | 16 |
| 12. | හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව | 16 |
| 13. | දිඹුලාගල  ප්‍රාදේශීය සභාව | 17 |
| 14. | ඇලහැර ප්‍රාදේශිය සභාව | 17 |
| 15. | හිඟුරක්ගොඩ ප්‍රාදේශිය සභාව | 18 |
| 16. | ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව | 19 |
| 17. | ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව | 20 |
| 18. | අයගම ප්‍රාදේශීය සභාව | 20 |
| 19. | ඇහැලියගොඩ  ප්‍රාදේශීය සභාව | 21 |
| 20. | ගලිගමුව  ප්‍රාදේශීය සභාව | 24 |
| 21. | දෙහිඕවිට  ප්‍රාදේශීය සභාව | 24 |
| 22. | රුවන්වැල්ල  ප්‍රාදේශීය සභාව | 25 |
| 23. | මාතලේ ප්‍රාදේශීය සභාව | 25 |
| 24. | දඹුල්ල ප්‍රාදේශීය සභාව | 26 |
| 25. | විල්ගමුව ප්‍රාදේශීය සභාව | 26 |
| 26. | මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව | 26 |
| 27. | උඩපළාත ප්‍රාදේශීය සභාව | 26 |
| 28. | පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව | 27 |
| 29. | තුම්පනේ ප්‍රාදේශීය සභාව | 27 |

| | | |
|---|---|---|
| 30. | පූජාපිටිය ප්‍රාදේශීය සභාව | 28 |
| 31. | පාතහේවාහැට ප්‍රාදේශීය සභාව | 28 |
| 32. | අකුරණ ප්‍රාදේශීය සභාව | 28 |
| 33. | මැදදුම්බර ප්‍රාදේශීය සභාව | 29 |
| 34. | පන්විල ප්‍රාදේශීය සභාව | 29 |
| 35. | මිනිපේ ප්‍රාදේශීය සභාව | 29 |
| 36. | උඩුදුම්බර ප්‍රාදේශීය සභාව | 30 |
| 37. | කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව | 31 |
| 38. | කොටගල ප්‍රාදේශීය සභාව | 32 |
| 39. | කොත්මලේ ප්‍රාදේශීය සභාව | 32 |
| 40. | හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව | 34 |
| 41. | අක්මීමන ප්‍රාදේශීය සභාව | 34 |
| 42. | ඇල්පිටිය ප්‍රාදේශීය සභාව | 35 |
| 43. | කරන්දෙණිය ප්‍රාදේශීය සභාව | 35 |
| 44. | බද්දේගම ප්‍රාදේශීය සභාව | 36 |
| 45. | බලපිටිය ප්‍රාදේශීය සභාව | 37 |
| 46. | බෙන්තොට ප්‍රාදේශීය සභාව | 37 |
| 47. | හබරාදුව ප්‍රාදේශීය සභාව | 38 |
| 48. | දෙවිනුවර ප්‍රාදේශීය සභාව | 39 |
| 49. | කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව | 41 |
| 50. | කොටපොළ ප්‍රාදේශීය සභාව | 42 |
| 51. | දික්වැල්ල ප්‍රාදේශීය සභාව | 42 |
| 52. | හක්මන ප්‍රාදේශීය සභාව | 43 |
| 53. | සූරියවැව ප්‍රාදේශීය සභාව | 43 |
| 54. | කටුවන ප්‍රාදේශීය සභාව | 44 |
| 55. | ජාඇල ප්‍රාදේශීය සභාව | 44 |
| 56. | කටාන ප්‍රාදේශීය සභාව | 48 |
| 57. | මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව | 49 |
| 58. | බියගම ප්‍රාදේශීය සභාව | 49 |
| 59. | අත්තනගල්ල ප්‍රාදේශීය සභාව | 49 |
| 60. | බේරුවල ප්‍රාදේශීය සභාව | 51 |
| 61. | දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව | 51 |
| 62. | බුලත්සිංහල ප්‍රාදේශීය සභාව | 52 |


| | | |
|---|---|---|
| 63. | මදුරාවල ප්‍රාදේශීය සභාව | 52 |
| 64. | හෝමාගම ප්‍රාදේශීය සභාව | 53 |
| 65. | පොතුවිල් ප්‍රාදේශීය සභාව | 54 |
| 66. | අඩ්ඩාලච්චේනයි ප්‍රාදේශීය සභාව | 54 |
| 67. | නින්දවූර් ප්‍රාදේශීය සභාව | 55 |
| 68. | ආලෙයියඩිවේම්බු ප්‍රාදේශීය සභාව | 55 |
| 69. | නාවිදන්වෙලි ප්‍රාදේශීය සභාව | 56 |
| 70. | තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාව | 57 |
| 71. | සමන්තුරේ ප්‍රාදේශීය සභාව | 57 |
| 72. | කාරෙයිතිවු ප්‍රාදේශීය සභාව | 57 |
| 73. | දමන ප්‍රාදේශීය සභාව | 57 |
| 74. | නාමල්ඔය ප්‍රාදේශීය සභාව | 58 |
| 75. | ඉරක්කාමම් ප්‍රාදේශීය සභාව | 58 |
| 76. | වෙරුගල් ප්‍රාදේශීය සභාව | 59 |
| 77. | තඹලගමුව ප්‍රාදේශීය සභාව | 60 |
| 78. | ත්‍රිකුණාමලය නගර හා කඩවත් සතර ප්‍රාදේශීය සභාව | 60 |
| 79. | මූතූර් ප්‍රාදේශීය සභාව | 60 |
| 80. | මොරවැව ප්‍රාදේශීය සභාව | 62 |
| 81. | කුච්චවේලි ප්‍රාදේශීය සභාව | 63 |
| 82. | කින්නියා ප්‍රාදේශීය සභාව | 64 |
| 83. | හලාවත ප්‍රාදේශීය සභාව | 66 |
| 84. | වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව | 67 |
| 85. | නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව | 69 |
| 86. | වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව | 70 |
| 87. | කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව | 71 |
| 88. | පන්නල ප්‍රාදේශීය සභාව | 72 |
| 89. | බිංගිරිය ප්‍රාදේශීය සභාව | 72 |
| 90. | ඉබ්බාගමුව ප්‍රදේශීය සභාව | 73 |
| 91. | කුරුණෑගල ප්‍රාදේශීය සභාව | 75 |
| 92. | ගල්ගමුව ප්‍රාදේශීය සභාව | 75 |
| 93. | ගිරිබාව ප්‍රාදේශීය සභාව | 76 |
| 94. | නිකවැරටිය ප්‍රාදේශීය සභාව | 77 |

| | | |
|---|---|---|
| **95.** | පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව | **78** |
| **96.** | බුත්තල ප්‍රාදේශීය සභාව | **78** |
| **97.** | තණමල්විල ප්‍රාදේශීය සභාව | **79** |
| **98.** | බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව | **80** |
| **99.** | වැල්ලවාය ප්‍රාදේශීය සභාව | **80** |
| **100.** | කතරගම ප්‍රාදේශීය සභාව | **81** |
| **101.** | බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව | **81** |
| **102.** | මහියංගණය ප්‍රාදේශීය සභාව | **82** |
| **103.** | සොරණාතොට ප්‍රාදේශීය සභාව | **82** |
| **104.** | රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව | **83** |
| **105.** | වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාව | **83** |
| **106.** | කරෙයිනගර් ප්‍රාදේශීය සභාව | **84** |
| **107.** | නල්ලූර් ප්‍රාදේශීය සභාව | **84** |
| **108.** | වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය සභාව | **84** |
| **109.** | වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාව | **85** |
| **110.** | වලිකාමම් උතුර ප්‍රාදේශීය සභාව | **85** |
| **111.** | වලිකාමම් නිරිත ප්‍රාදේශීය සභාව | **85** |
| **112.** | වේලනෙයි ප්‍රාදේශීය සභාව | **86** |
| **113.** | පූනාකරි ප්‍රාදේශීය සභාව | **87** |
| **114.** | වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව | **87** |
| **115.** | පච්චිලෙයිපල්ලි ප්‍රාදේශීය සභාව | **88** |
| **116.** | කරච්චි ප්‍රාදේශීය සභාව | **88** |
| **117.** | වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව | **90** |

ශ්‍රී ලංකාවේ කුඩාම පළාත් පාලන ආයතනය ප්‍රාදේශීය සභා වේ. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් මෙම පළාත් පාලන ආයතනයන් පිහිටුවා ඇත. පරිපාලන හා සංවර්ධන කටයුතුවලට අදාලව තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී ජනතාවට පළාත් මට්ටමින් සහභාගී විම සඳහා අවස්ථාවන් සලසා දීම සඳහා ප්‍රාදේශීය සභා පිහිටුවා ඇත. මේ වනවිට දිවයින තුළ ප්‍රාදේශීය සභා 276 ක් පිහිටුවා ඇත.

ප්‍රාදේශීය සභාවලට අයත් මූලික කාර්යය වනුයේ එක් එක් ප්‍රාදේශීය සභා ප්‍රදේශය සඳහා සංස්ථාගත කරන ලද ප්‍රාදේශීය සභාව එම ප්‍රදේශය ඇතුළත පළාත් පාලන ආයතනය විය යුතු අතර, මහජන සෞඛ්‍යය, පොදු උපයෝගීතා සේවාවන්ට සහ පොදු මංමාවත්වලටද, සාමාන්‍යයෙන් එම ප්‍රදේශය ඇතුළත ජනතාවගේ සුබ විහරණය, පහසුව, සුභ සාධනය සහ සියලු පහසුකම් ආරක්ෂා කිරීමට හා ප්‍රවර්ධනය කිරීමටද අදාල සියලු කරුණු විධිමත් කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම ඊට අයත් විය යුතුය. ප්‍රාදේශීය සභාවක් සභාපතිවරයෙකුගෙන්, උප සභාපතිවරයෙකුගෙන් හා එම ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් ප්‍රාදේශීය සභා ප්‍රදේශයක් සඳහාද ඒ ප්‍රදේශයේ ප්‍රමාණය, ජනගහනය හා ආර්ථික සංවර්ධන මට්ටම ගැන සැලකිලිමත්ව අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පල කරනු ලබන ලබන නියමයක් මඟින් තීරණය කරනු ලබන තෝරා පත්කරගත් සභික සංඛ්‍යාවකින් සමන්විත වේ.

ශ්‍රී ලංකාව තුළ ප්‍රධාන පළාත් සභාවන් ආවරණය වන පරිදි ප්‍රාදේශීය සභාවන් 276 ක් පිහිටුවා ඇත. බස්නාහිර පළාත සඳහා ප්‍රාදේශීය සභා 28 ක්ද ,දකුණු පළාත සඳහා ප්‍රාදේශීය සභා 42 ක්ද, වයඹ පළාත සඳහා ප්‍රාදේශීය සභා 29 ක්ද, උතුරු මැද පළාත සඳහා ප්‍රාදේශීය සභා 25 ක්ද, මධ්‍යම පළාත සඳහා ප්‍රාදේශීය සභා 37 ක්ද ,නැගෙනහිර පළාත සඳහා ප්‍රාදේශීය සභා 37 ක්ද ,උතුරු පළාත සඳහා ප්‍රාදේශීය සභා 28 ක්ද ,ඌව පළාත සඳහා ප්‍රාදේශීය සභා 25 ක්ද, සබරගමුව පළාත සඳහා ප්‍රාදේශීය සභා 25 ක් බැගින්ද පිහිටුවා ඇත .බස්නාහිර පළාතට අයත් කළුතර දිස්ත්‍රික්කය තුළ මිල්ලනිය ප්‍රාදේශීය සභාව 2018 මාර්තු 20 දින සිට ක්‍රියාත්මක වන පරිදි පිහිටුවා තිබුණි. පහත රූපසටහන ප්‍රකාරව පළාත් අනුව මෙම ප්‍රාදේශීය සභාවල ව්‍යාප්තිය දැක්වේ.




ඡායාරූපය (1)

2019 ,2018හා 2020වර්ෂ තුන සඳහා ප්‍රාදේශීය සභා 276 ක මූල්‍ය ප්‍රකාශන ප්‍රකාරව සමස්ථ ආදායම රුපියල් මිලියන 97,762 ක් වූ අතර ,මෙම වර්ෂ තුන සඳහා මූල්‍ය ප්‍රකාශන ප්‍රකාරව සමස්ථ වියදම රුපියල් මිලියන 92,708 ක් විය 2018 .වර්ෂයට සාපේක්ෂව 2020වර්ෂය වනවිට මෙම ප්‍රාදේශීය සභා 276 හි ආදායම වර්ධනය 26 % ක් වූ අතර ,එම වර්ෂයට සාපේක්ෂව වියදමේ වර්ධනය 19 % ක් විය 2018 . වර්ෂයේ ප්‍රාදේශීය සභා 68 ක මූල්‍ය ප්‍රකාශන ප්‍රකාරව ඌනතාවයක් පෙන්නුම් කළ අතර ,එම ඌනතාවල සමස්ථ එකතුව රු .මිලියන 1311 ක් විය 2019 .වර්ෂය වනවිට මෙම ප්‍රාදේශීය සභා අතුරින් ප්‍රදේශීය සභා 86 ක මූල්‍ය ප්‍රකාශන ප්‍රකාරව ඌනතාවයක් පෙන්නුම් කළ අතර ,එම ප්‍රාදේශීය සභාවල සමස්ථ ඌනතාවය රු .මිලියන 1,882 ක් විය .කෙසේ වුවද 2020 ,වර්ෂය වනවිට මෙම ප්‍රාදේශීය සභා අතුරින් ප්‍රාදේශීය සභා 98 ක මූල්‍ය ප්‍රකාශන අනුව ඌනතාවයක් පෙන්නුම් කළ අතර ,එම සමස්ථ ඌනතාවය රු . මිලියන 1974 ක් විය .මෙම ඌනතාවය විග්‍රහ කිරීමේදී කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ 2019 ,2018හා 2020වර්ෂයන්හි ප්‍රාදේශීය සභා 19 ක අඛණ්ඩ ඌනතාවයක් පෙන්නුම් කිරීමයි. මෙම ප්‍රාදේශීය සභා අතුරින් ප්‍රාදේශීය සභා 24 ක ,2018වර්ෂයට සාපේක්ෂව 2019 හා 2020වර්ෂ 2 සඳහාම අතිරික්තයේ අඛණ්ඩ වර්ධනයක් පෙන්වා තිබුණි .

ප්‍රාදේශීය සභා විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ප්‍රාදේශීය සභා 276 ක් තුළ මුලු වත්කම් ප්‍රමාණය 2018වර්ෂයේ රු .මිලියන 91,438 ක්ද 2019 ,වර්ෂයේ රු .මිලියන 104,579 ක්ද 2020 ,වර්ෂයේ රු . මිලියන 140,874 ක් ද වශයෙන් නියෝජනය විය .මේ අනුව 2018වර්ෂයට සාපේක්ෂව 2020වර්ෂය

වනවිට මෙම ප්‍රාදේශීය සභාවල මුලු වත්කම්වල වර්ධනය 54 %ක් විය 2018 .වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂය වනවිට කොටිකාවත්ත මුලලේරියාව ප්‍රාදේශීය සභාවේ මුලු වත්කම් ප්‍රමාණය රු .මිලියන 7,881 කින්ද, හොරණ ප්‍රාදේශීය සභාවේ එම ප්‍රමාණය රු. මිලියන 652 කින්ද, අගලවත්ත ප්‍රාදේශීය සභාවේ එම ප්‍රමාණය රු. මිලියන 790 කින්ද, දොම්පේ ප්‍රාදේශීය සභාවේ එම ප්‍රමාණය රු. මිලියන 1510 කින්ද, බියගම ප්‍රාදේශීය සභාවේ එම ප්‍රමාණය රු. මිලියන 913 කින්ද, අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ එම ප්‍රමාණය රු. මිලියන 3,953 කින්ද මුලු වත්කම් වටිනාකමෙහි වර්ධනයක් නිරීක්ෂණය විය 2020 .වර්ෂයේ සිට බස්නාහිර පළාත තුළ වූ පළාත් පාලන ආයතනවල පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව ගිණුම් පිළියෙල කිරීම නිසා පළාත්පාලන ආයතනවල වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම් තැබීම හා ඉඩම් හා ගොඩනැගිලි ගිණුම්ගත කිරීම මෙම වැඩිවීමට ප්‍රධාන ලෙස බලපා තිබුණි.

ප්‍රාදේශීය සභා විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ප්‍රකාරව ප්‍රාදේශීය සභා 276 න් මුලු වගකීම් ප්‍රමාණය 2018 වර්ෂයේ රු.මිලියන 13,430 ක්ද, 2019වර්ෂයේ එම ප්‍රමාණය රු. මිලියන 14,292 ක්ද, 2020වර්ෂයේ එම ප්‍රමාණය රු. මිලියන 16,326 ක්ද විය. 2018 වර්ෂයට සාපේක්ෂව 2020වර්ෂය වනවිට මුලු වගකීම් ප්‍රමාණය2 2 %කින් වර්ධනය වී තිබුණි.

2020දෙසැම්බර් 31දිනට ප්‍රාදේශීය සභා 276 හි ශුද්ධ වත්කම් ප්‍රමාණය රු .මිලියන 124,548 ක් විය .මේ ප්‍රාදේශීය සභා අතුරින් කොටිකාවත්ත මුල්ලේරියාව රු. මිලියන 10,939 ක වැඩිම ශුද්ධ වත්කම් ප්‍රමාණයක් නියෝජනය වූ අතර, අඩුම ශුද්ධ වත්කම් ප්‍රමාණය නියෝජනය වූයේ ආගරපතන ප්‍රාදේශීය සභාව වූ අතර, එම ප්‍රමාණය රු. මිලියන 19 ක් විය.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018අංක 19දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර සියලුම ප්‍රාදේශීය සභා විසින් මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි .එම 2019 ,2018හා 2020වර්ෂයන්ට අදාලව ,මූල්‍ය ප්‍රකාශන විගණනය කර විගණන පනතේ (1)11හා (2)11ප්‍රකාර මතය ඇතුළත් සම්පිණ්ඩන වාර්තා හා කළමනාකරණ වාර්තාවන් සියලුම සභාවන් වෙත ඉදිරිපත් කර ඇත 2018 .වර්ෂයේ ප්‍රාදේශීය සභා 270 ක් සඳහා තත්ත්වාගණනය කළ මතයද , උඩුනුවර ප්‍රාදේශීය සභාව සඳහා අහිතකර මතයද ප්‍රකාශ කර තිබුණි .වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව හා ඉපලෝගම ප්‍රාදේශීය සභාව සඳහා තත්ත්වාගණනය නොකළ මතයක් ප්‍රකාශ කර තිබුණි. පන්නල, ගලෙන්බිඳුණුවැව හා තලාව ප්‍රාදේශීය සභාවන් සඳහා මතය ව්‍යාවනය කර තිබුණි. 2019 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභා 260 ක් සඳහා තත්ත්වාගණනය කළ මතය ප්‍රකාශ කර තිබුණු අතර, වැලිවිටිය, දිවිතුර, රාජාංගනය, පදවිය හා කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවන් සඳහා තත්ත්වාගණනය නොකළ මතයක්

ප්‍රකාශ කර තිබුණි. ප්‍රාදේශීය සභා 10 ක් සඳහා අහිතකර මතයක් ප්‍රකාශ කර තිබුණ අතර, පන්නල හා හොරොව්පතාන ප්‍රාදේශීය සභා සඳහා මතය ව්‍යාවනය කර තිබුණි. 2020 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභා 267 ක් සඳහා තත්ත්වාගණනය කළ මතය ප්‍රකාශ කර තිබුණ අතර, කොටගල, ගඟ ඉහළ කෝරළේ වවුනියාව උතුර හා වෙන්ගලාවෙඩ්ඩිකුලම් ප්‍රාදේශීය සභාවන් සඳහා තත්ත්වාගණනය නොකළ මතය ප්‍රකාශ කර තිබුණි. උඩුනුවර, මිහින්තලය හා හිඟුරක්ගොඩ සභාවන් සඳහා අහිතකර මතයද, ලග්ගල හා ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාවන් සඳහා මතය ව්‍යාවනය කර තිබුණි.

2018අංක 19දරන ජාතික විගණන පනතේ 14වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් සෑම මුදල් වර්ෂ තුනක කාලසීමාවක් අවසන් වීමෙන් පසුව මාස නවයක් ඇතුළත සෑම විගණනය කරනු ලබන අස්ථිත්වයකම තත්ත්ව වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබිය යුතුය .මෙම වාර්තාවේ ඇතුළත් විය යුතු කරුණු අතර හඳුනා ගත් ප්‍රධාන ඌනතා ,ඒ සඳහා විගණකාධිපතිවරයා විසින් කරන ලද නිර්දේශ සහ විගණනය කරනු ලබන අස්ථිත්ව විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග තිබිය යුතු අතර , පාර්ලිමේන්තුවට ඒ වාර්තාව භාරදෙන අවස්ථා වනවිට ඒ පිළිබඳ පැවති තත්ත්වය ගැනද සඳහන් විය යුතුය .ඉහත පනත ප්‍රකාරව මෙතෙක් නොවිසඳී ඇති ප්‍රාදේශීය සභා 117 ක විගණන නිරීක්ෂණ පහත දක්වා ඇත .

**01. කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාව**

| විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| මස්කඩ ,මාළු ලැලි හා රථගාල් බදුදීම වෙනුවෙන් 2004 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා අයවිය යුතු රු 1,452,928.ක් අයකර ගෙන නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර හිඟ අයකර ගැනීමට කටයුතු කළයුතුය. | හිඟ මුදල් මෙම වර්ෂයේදී අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | 2022 පෙබරවාරි 08 දින වනවිට රු.1,014,818 ක් අයකරගත යුතුව ඇත. |

**02. කැකිරාව ප්‍රාදේශීය සභාව**

| විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනුලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| උතුරු මැද පළාත් ,පළාත් පාලන කොමසාරිස්ගේ 2020අගෝස්තු 28 දිනැති අංක NCP/LG/DE/04/04/2020 දරන ලිපිය ප්‍රකාරව සභාවේ යන්ත්‍ර උපකරණ ණය පදනම මත කුලියට ලබාදීම නොකරන ලෙස උපදෙස් ලබාදී තිබියදී සභාවේ යන්ත්‍ර 04ක් අවස්ථා 240කදී ණය පදනම මත ලබාදීම නිසා ලැබිය යුතු යන්ත්‍ර කුලී ආදායම් රු.1,061,500 ක් අයවී නොතිබුණි. | වාහන කුලී ආදායම් අයකර ගැනීමට ක්‍රියාකළයුතු වේ. | අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | රු.1,061,500 ක් අයවිය යුතුව ඇත. |

**03. කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| 2017 වර්ෂයේ රු.45,000,000 ක් වැයකර කැබිතිගොල්ලෑව බස් නැවතුම්පළ වෙළඳ සංකීර්ණ භූමියේ කඩ කාමර 46 ක් ඉදිකර තිබුණු නමුත් සභිකයන් විසින් විවෘත ටෙන්ඩර් කිරීමට විරුද්ධවීම නිසා කඩ කාමර 19 ක් 2022 පෙබරවාරි 28 දින වනවිටත් නිශ්කාර්යව පැවතුණි. | මෙම කඩකාමර බඳුදීමට කඩිනමින් ක්‍රියාකළයුතු වේ. | ටෙන්ඩර් කර කඩ කාමර ලබාදීමට කටයුතු කරමින් පවතී. | කඩ කාමර 25 ක් පමණක් 2022 ජනවාරි 01 දින සිට ටෙන්ඩර් කර ලබාදී ඇත. |

**04. ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| පොකුණු ව්‍යාපෘතියට අදාළව නඩු තීන්දුව ප්‍රකාරව සභාවේ දේපල වෙන්දේසි කර මුදල් ගෙවා තිබුණු අතර තවත් රු.4,245,707 ක් ගෙවිය යුතුව පැවති අතර 2012 වසරේ සිට 2020 වර්ෂය දක්වා වසර 08 ක් ගතවීත් ගෙවිය යුතු ඉතිරි මුදල් සම්බන්ධව කළමනාකාරිත්වය අදාළ පාර්ශවයන් සමඟ විධිමත් නෛතික එකඟතාවයකට පැමිණ නොතිබුණි. | විධිමත් නෛතික ක්‍රියාමාර්ග ගත යුතුවේ. | නීති උපදෙස් ලබාගෙන ඉදිරි කටයුතු කරන බව දන්වා ඇත. | නීති උපදෙස් ලබාගැනීමට කටයුතු කර ඇත. |

## 05. තලාව ප්‍රාදේශීය සභාව

| | | | | |
|---|---|---|---|---|
| (අ) | සභාවට අයත් ටිපර් රථයේ 2019 ජනවාරි 07 දින සිට හඳුනාගත් තිරිංග පද්ධතියේ අළුත්වැඩියාව සිදුනොකර ධාවනයේ යෙදවීම නිසා 2019 ජනවාරි 31 දින අනතුරකට භාජනය වීමෙන් රු.933,500 ක පාඩුවක් සිදුවී තිබුණි. | අළුත්වැඩියාවන් නිසි කාලවකවානුවල කිරීමෙන් ඇතිවිය හැකි පාඩු අවමකර ගැනීමට ක්‍රියාකළ යුතුවේ. | වාහන අළුත්වැඩියා කටයුතුවල ප්‍රමාදයක් සිදුවී ඇත. | වර්තමානය වන විටත් අළුත්වැඩියා කරමින් පැවතුණි. |
| (ආ) | වටිනාකම රු.6,390,000 ක් වූ සභාවට අයත් කැබ්රථයක් 2019 අප්‍රේල් 15 දින අනතුරකට භාජනයවීම නිසා රු.3,400,520 ක අලාභයක් සිදුවී තිබුණද එම අනතුර සම්බන්ධ තොරතුරුවල සාවද්‍ය තත්ත්වය සහ අවභාවිතයන් පදනම්ව රක්ෂණ වන්දි ප්‍රතික්ෂේප වී තිබුණු අතර වාහනය දේශීය නියෝජිතයාගේ ප්‍රාදේශීය අළුත්වැඩියා මධ්‍යස්ථානයක රඳවා තිබුණි. | කඩිනමින් පරීක්ෂණ පවත්වා අවශ්‍ය කටයුතු සිදුකර අලාභය අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | මේ සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු සිදුකරමින් පවතී. | මෙයින් සියයට 90 ක් සභාපතිතුමාගෙන්ද සියයට 10 ක් රියදුරාගෙන්ද අයකර ගැනීමට තීරණය කර ඇති නමුත් අයකරගෙන නැත. |
| (ඇ) | කරගහවැව කසළ අංගනය ඉදිකිරීම සඳහා 2012 සිට 2017 දක්වා වූ වර්ෂවලදී මධ්‍යම පරිසර අධිකාරියෙන් සභාවට රු.3,446,848 ක් ලැබී තිබුණු අතර ඉන් රු.1,121,026 ක මුදලක් වියදම් කර තිබුණි. එහෙත් කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ | කරගහවැව කසළ අංගනය ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළයුතු වේ. | ඔරුගලයාය කසළ අංගනය ස්ථිරවම සභාවේ කසළ බැහැර කිරීම සඳහා යොදාගනු ලැබේ. | මෙය තවදුරටත් ප්‍රයෝජනයට ගනු නොලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| | ඉදිකිරීම් අවසන් නොකිරීම නිසා එම කසළ මධ්‍යස්ථානයෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට නොහැකිවී තිබුණි. | | | |
| (ඈ) | 2017 වර්ෂයේදී රු.9,500,000 ක් වියදම් කර ඉදිකර තිබුණු තඹුත්තේගම සතිපොළ ගොඩනැගිලි පද්ධතිය ප්‍රයෝජනයට නොගෙන වල් බිහිවීමට ඉඩහැර නිශ්කාර්යව පැවතුණි. | ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළයුතු වේ. | මෙහි පවතින අඩුපාඩු සකස් කිරීමෙන් පසු ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරමි. | වර්තමානය වන විටත් එය ප්‍රයෝජනයට ගෙන නොපැවතුණි. |
| (ඉ) | ප්‍රාදේශීය සභාව විසින් රු.5,421,890 ක් වැයකර 2018 දෙසැම්බර් 31 දින වනවිට ඉදිකිරීම් අවසන් කර තිබුණු එප්පාවල ආදාහනාගාරය ඊට අවශ්‍ය උදුන් සවි නොකිරීම නිසා ප්‍රයෝජනයට නොගෙන පූර්ව වර්ෂ 02 ක් ඉක්මවූ කාලයක සිට නිශ්කාර්යව පැවතුණි. | ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළයුතු වේ. | 2021 වර්ෂයේදී මෙය ජනතා අයිතියට පත්කිරීමට කටයුතු කරමි. | වර්තමානය වන විටත් එය එම තත්ත්වයේම පවතියි.උදුන් සවිකර නොමැත. |

## 06. තිරප්පනේ ප්‍රාදේශීය සභාව

| | | | | |
|---|---|---|---|---|
| (අ) | ආදායම් උත්පාදනය කිරිමේ අරමුණෙන් මාන්කුලම, දිවුල්වැව ගමෙහි 2019 වර්ෂයේදී රු.1,344,000 ක් වියදම් කර ඉදිකර තිබුණු ජල පිරිපහදු යන්ත්‍රය 2020 වර්ෂයේදී ගලවා ඉවත් කර සභා භූමියේ සවි කිරීම නිසා අපේක්ෂිත අරමුණ ඉටුවී නොතිබුණි. | මෙම ජල පෙරන යන්ත්‍රය ආදායම් උත්පාදන මාර්ගයක් ලෙස යොදාගත යුතු වේ. | ප්‍රාදේශීය සභා භූමියේ ස්ථාපනය කර ඇත. | අපේක්ෂිත අරමුණට යොදවා නැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | සභා බල ප්‍රදේශයේ පිහිටි සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි වී තිබුණ හෝටලයකින් 2019 වර්ෂය සඳහා ලැබිය යුතු රු.3,332,341 ක බදු මුදල ගෙවීම පැහැරහැරීම නිසා සභාව විසින් 2020 නොවැම්බර් 12 දින නඩුවක් පවරා තිබුණු නමුත් එම මුදල් අයවී නොතිබුණි. | වෙළඳපල බලපත්‍ර ආදායම් අයකරගත යුතු වේ. | නඩු තීන්දුව අනුව කටයුතු කරමි. | මුදල අයවී නොතිබුණි. |

**07. නොච්චියාගම ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| 2019 සැප්තැම්බර් මාසයේදී රු.16,938,732 ක වියදමින් ඉදිකරන ලද කොම්පෝස්ට් නිෂ්පාදන මධ්‍යස්ථානය නිශ්කාර්යව පැවතුණු අතර වර්ෂය තුළ රු.1,299,378 ක් දරා රැගෙන එන කසළ කොම්පෝස්ට් අංගනය අසල අක්කර 04 ක භූමියේ ගොඩගසා ගිණි තැබීම සිදුකර තිබුණි. කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා අවශ්‍ය, යන්ත්‍ර සූත්‍ර මිලදී ගෙන නොතිබුණි. | කසළ කළමනාකරණ සඳහා අවශ්‍ය යන්ත්‍ර උපකරණ ලබා ගැනීමට ක්‍රියාකළයුතු වේ. | අවශ්‍ය උපකරණ ලැබුණු පසු විධිමත් ලෙස කසළ කළමනාකරණය සිදු කරමි. | යන්ත්‍ර සූත්‍ර මිලදීගෙන නොමැති බැවින් කොම්පෝස්ට් නිෂ්පාදනය සිදුනොකරන අතර කසළ ගිණි තැබීම සිදුකරමින් පවතී. |

08. **පදවිය ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| 2019 අගෝස්තු 16 දින ගිනි ගැනීමට ලක්වී පිළිසරු ව්‍යාපෘතියේ බේල් කිරීමේ යන්ත්‍රයේ රු.800,000 ක අලාභය අයකර ගැනීම සඳහා එයට වගකිවයුතු පාර්ශවයන් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම අලාභයට වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන එම අලාභ අයකර ගත යුතු වේ. | මේ සඳහා මූලික විමර්ශනයක් පැවැත්වීමට පළාත් පාලන කොමසාරිස් විසින් නිලධාරියකු පත් කර ඇත. | මේ සඳහා 2021 පෙබරවාරි 23 දින විමර්ශනයක් පැවැත්වීම සඳහා පරීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇතත් විමර්ශන කටයුතු සිදුකර නැත. |

**09. මැදවච්චිය ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| පුර නැගුම ව්‍යාපෘතිය මගින් ඉදිකර සභාව වෙත භාරදී තිබුණු කඩ කාමර 46ක් කුලී පදනම මත ගිවිසුම්ගතව ලබාදී තිබුණු නමුත් අදාළ කඩකාමර සඳහා අයවිය යුතු රු19.,250, 000ක කුලී අයකරගෙන නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව හිඟ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | කඩකාමර සඳහා අයවිය යුතු හිඟ මුදල් ලබාගැනීම සඳහා නීතිමය පියවර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | අයකර ගෙන නැත. තක්සේරු මුදල වැඩි ලෙස දක්වා කුලී අඩුකරන ලෙස ඉල්ලීම් කර ඇත. මේ වනවිට ඒ සඳහා කටයුතු කරමින් පවතී. |

**10. මිහින්තලය ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| මිහින්තලය පුස්තකාලය හා ශ්‍රවණාගාරය ඉදිකිරීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් රු.3,958,710 ක ණය මුදලක් ලබාගැනීම වෙනුවෙන් වූ රු.50,150 ක ණය වාරිකයක් මාසිකව ගෙවමින් පැවති නමුත් එම ශ්‍රවණාගාරය ඉදිකිරීම ආරම්භ කර නොතිබුණි. | ශ්‍රවනාගාරයේ ඉදිකිරීම් කටයුතු අවසන්කර භාවිතයට ගැනීමට පියවරගත යුතුවේ. | කුමන හෝ ව්‍යාපෘතියක් යටතේ ඉහළ මාලය සංචාර නිකේතනයක් ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂාවෙන් සිටිමි. | ශ්‍රවනාගාරය ඉදිකර නොමැත. |

## 11. රඹෑව ප්‍රාදේශීය සභාව

| | | | | |
|---|---|---|---|---|
| (අ) | වාහන/ යන්ත්‍ර කුලී පදනම මත ලබාදීමෙන් 2019 දෙසැම්බර් 31 දිනට රු.2,159,775 ක හිඟ වාහනකුලී අයකර ගතයුතු පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි. | අදාළ පාර්ශවයන් හඳුනාගෙන හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අයකර ගත යුතු පාරශ්වයන් හඳුනා ගැනිමට කටයුතු කරමි. | 2021 දෙසැම්බර් 16 දක්වා අයකරගෙන නොතිබුණි. |
| (ආ) | සභාවට අයත් වටිනාකම රු.6,390,000 ක්වූ කැබ්රථය 2019 මැයි 16 දින අනතුරට පත්වීම සම්බන්ධයෙන් එයට වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකරගත යුතු රු.1,583,250 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදල් එයට වගකිවයුතු පාර්ශවයන්ගෙන් කඩිනමින් අයකරගත යුතුවේ. | මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කර ඇත. | රු.100,000 ක මුදලක් පමණක් අයකරගෙන ඇත. තවත් රු.1,483,250 ක් අයකරගත යුතුව ඇත. |
| (ඇ) | සභාවේ පැරණි පුස්තකාල ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමට රු.2,978,302 ක් වැයකර තිබුණද එහි වැඩ නිමකර ඵලදායී ලෙස භාවිතා කළ හැකි තත්ත්වයට පත්කිරීමට කටයුතු කර නොතිබුණි. | භාවිතා කළ හැකි තත්ත්වයට පත්කළ යුතු අතර ඉතිරි වැඩ ඉටුනොකර අතරුදවූම් මුදල් ගෙවූ නිලධාරීන්ගෙන් එම මුදල් අයකළ යුතුවේ. | කළවැඩ වෙනුවෙන් රු.2,978,302 ක් සභාවෙන් ගෙවා ඇති අතර අතරුදවූම් රු.324,148 ක් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් නිදහස් කර ඇත. | වැඩ නිම කර භාවිතා කිරීමට හැකි තත්ත්වයට පත්කර නොමැත. |

## 12. හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව

| | | | | |
|---|---|---|---|---|
| | සභාවට අයත් පොදු වෙළඳපල කඩ කාමර 09ක් වර්ෂ 08 කට අධික කාලයක සිට අළුත්වැඩියා කර බදුදීමට කටයුතු නොකිරීම නිසා | අදාළ කඩ කාමර අළුත්වැඩියා කර ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | LDSP ව්‍යාපෘතිය මගින් මෙම වෙළඳ සංකීර්ණය ඉදිකිරීමට යෝජනා කර ඇත. | 2020 දෙසැම්බර් 31 දින වනවිට අලාභය රු.988,800 ක් වී තිබුණි. |

| | | | |
|---|---|---|---|
| 2019 වර්ෂයේ දෙසැම්බර් 31දින වනවිට සභාවට රු.840,000 ක තක්සේරුගත අලාභයක් සිදුවී තිබුණි. | | | |

**13. දිඹුලාගල ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| 2016 ජූනි සිට 2017 ජූනි 28 දක්වා කාලය තුල ජල ගාස්තු අයකිරීමේදී ලැබීම් කුවිතාන්සිවල මුල් පිටපතේ සඳහන් මුදලට වඩා අඩු මුදලක් අනුපිටපතෙහි සඳහන් කර රු.2,625,660 ක් බැහැර කරගැනීම පිළිබඳව විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මූලික විමර්ශනයක් සිදුකර පාඩුව අයකර ගත යුතුවේ. | මූලික විමර්ශනයක් උතුරු මැද පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරෙමින් පවතී. විමර්ශන කටයුතු කඩිනම් කරදෙන මෙන් 2020.05.21 දින ලිපියක් මගින් ඉල්ලා ඇත. | මේ වන විට පොළොන්නරුව උසාවියේ නඩුවක් පැවතෙන අතර විගණන නිලධාරියකු සාක්ෂිකරුවකු ලෙස ඉදිරිපත් කර ඇත. |

**14. ඇලහැර ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| 2015 සිට 2017 දක්වා කාල සීමාව තුළ දුරගමන් සේවා බස් නැවතුම්පලක් හා වෙළඳ සංකීර්ණයක් ඉදි කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා සභා අනුමැතියකින් හා ශක්‍යතා අධ්‍යනයකින් තොරව කලු ගලක් කඩා ඉවත් කිරීම සඳහා විධිමත් මුල්‍ය පටිපාටි අනුගමනය නොකර ගෙවූ රු 15,675,708.ක | නිෂ්කාර්යය මුදල හා අනෙකුත් අසම්භව්‍ය බැරකම් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවේ අවධානය යොමු කර වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | පළාත් පාලන දෙපාර්තමේන්තුවේ විමර්ශණ වාර්තාව මත කටයුතු කරන බව දක්වා ඇත. | මේ සම්බන්ධව පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් විමර්ශනයක් පවත්වා ඇතත් වර්තා ඉදිරිපත් කරනොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | මුදල නිෂ්කාර්යය වියදමක් වී තිබූ අතර,තවදුරටත් අය විය යුතු රු.16,200,000 ක හිඟ මුදලක් ඉල්ලා කොන්ත්‍රාත්කරු විසින් සභාවට එරෙහිව නඩු පැවරීමද සිදු කර තිබුණු නමුත් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | | | |
| **15.** | **හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභාව** | | | |
| (අ) | හිඟුරක්ගොඩ මහේස්ත්‍රාත් අධිකරණ භූමියේ ඉදිකරන ලද නීතිඥ කාර්යාල පරිශ්‍රයට අදාළ ඉඩම පවරාගෙන ඉදිකර තිබූ කඩකාමර 16 ක් සඳහා අයකර ගතයුතුව තිබූ ටෙන්ඩර් ගාස්තු රු.3,465,325 ක් හා මාසිකව අයකර ගතයුතුව තිබූ රු.720,000 ක කුලී මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගත යුතුවේ. | පිළිගනිමි. ඉදිරි කටයුතු කඩිනමින් ක්‍රියාත්මක කරමි. | මුදල් අය කර ගැනිමට කටයුතු කර නැත. |
| (ආ) | කල්බදු පහසුකම් යටතේ ලබාගෙන තිබූ කැබ් රථයක් 2015 වර්ෂයේදී අනතුරට ලක්වී තිබූ අතර, රක්ෂණ හිමිකම් ලෙස සභාවට ලැබී තිබූ රු.3,300,000 මුදලක් ජංගම ගිණුමේ දිගින් දිගටම | පූර්ණ වන්දිය ලබාගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ වන විට කල්බදු ගෙවීම් අවසන් කර ඇති අතර, වාහනයේ පරම අයිතිය ලබාගෙන වෙන්දේසි කිරීමටත්, නව වාහනයක් ලබාගැනීමටත් අදාල ලේඛන පළාත් පාලන | නිවැරදි වී නොමැත. |

| | | | |
|---|---|---|---|
| නිෂ්කාර්යව රඳවා තිබුණි. වාහනය සඳහා පූර්ණ වන්දිය ලෙස ලැබිය යුතු ඉතිරි රු.3,000,000 ක මුදල ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ලබාගෙන නොතිබුණි. | | දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. | |
| **16. ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව** | | | |
| 2011 වර්ෂයේදී මගනැගුම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරන ලද මාර්ග සංවර්ධන ව්‍යාපෘති 07 ක ඉදිකිරීම් කටයුතු පවරා දී තිබුණු ප්‍රතිපාදක සංවිධාන වෙත එම කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය සපයාදීමට සභාවේ කිසිදු බැදියාවක් නොතිබියදී සහා අනුමැතියකින්ද තොරව සභාපතිවරයා විසින් පෞද්ගලික සමාගමක් සමග ගිවිසුම්ගත වී අවශ්‍ය කුට්ටිගල් සපයා දී තිබුණි. ඊට අදාලව එම සමාගමට ගෙවිය යුතුව පැවතුණු රු.2,088,000 ක් අඩුකර ගැනීමකින් තොරව කර්මාන්ත 04 ක අවසන් බිල්පත් හා රැඳවුම් මුදල් අදාල සමිති වෙත ගෙවීම් කර තිබුණි. එම කර්මාන්ත 04 ට අදාලව කුට්ටි ගල් සැපයූ සමාගම වෙත ගෙවිය යුතු රු.1,308,780 ක් නොගෙවීම හේතුවෙන් අදාල සමාගම විසින් සභාවට විරුද්ධව නඩු පවරා තිබුණු අතර, 2021 වර්ෂය අවසාන වනවිට | විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිවයුත්තන් හඳුනාගත යුතුවේ. | මෙම නඩුව දැනට අධිකරණයේ විභාගවෙමින් පවතින අතර ඒ වෙනුවෙන් පෙනී සිටින නීතීඥවරයාට සභා අනුමැතිය මත නිතීඥ ගාස්තු ගෙවා ඇති බව දන්වමි. | මෙම නඩුව දැනට විභාගවෙමින් පවතින බව. |

| | | | | |
|---|---|---|---|---|
| | අදාල නඩුවේ නීතිඥ ගාස්තු ලෙස රු.461,500 ක් වැයකර තිබුණි. | | | |

**17. ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව**

| | | | | |
|---|---|---|---|---|
| | 2015 සහ 2017 වර්ෂයන්හිදී පඹහින්න සතිපොළ සංවර්ධනය සඳහා රු.4,561,397 ක් වැයකර තිබුණද, පොළ පැවැත්වීමට සුදුසු පරිදි සංවර්ධන කටයුතු සිදුකර නොතිබුණු අතර 2020 වර්ෂය තුළදීද අදාළ අරමුණු කරා ළඟාවීමට සභාව අපොහොසත්ව තිබුණි. | ප්‍රතිපාදන සපයා ගෙන පොළ පැවැත්වීමට සුදුසු පරිදි සංවර්ධනය කළ යුතු වේ. | මෙම පොළ භූමියේ ඉතිරි වැඩ නිම කිරිම සඳහා 2018 වර්ෂයේ දී පළාත් පාලන අමාත්‍යාංශය වෙත ඇස්තමේන්තු අනුමැතියට යවා ඇති අතර, මුදල් ප්‍රතිපාදන ලැබුණු පසු සතිපොළ වෙළඳුන්ට පරිහරනය කළ හැකි පරිදි සකස් කිරිමට කටයුතු කරන බව . | 2021 දෙසැම්බර් වන විටත් සතිපොළ සංවර්ධනය කර නොතිබුණි. |

**18. අයගම ප්‍රාදේශීය සභාව**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | එකතුව වර්ග අඩි 2077 ක් වූ අයගම සතිපොල කඩකාමර 16 ක් සහ කෘෂි බෝග අලෙවි මධ්‍යස්ථානයේ කඩකාමර සඳහා අයවිය යුතු පෙර ගෙවුම් මුදල් (Key Money) පිළිවෙලින් රු.716,000 ක් සහ රු.1,460,000 ක් 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | 2020 මාර්තු මස සිට කොරෝනා රෝගය ව්‍යාප්ත වීමත් සමඟ එම මුදල් අයකර ගැනීමට නොහැකි විය. කඩිනමින් එම මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | ලිපි මඟින් පෙර ගෙවුම් මුදල් ගෙවන ලෙස දැනුවත් කර ඇත. මෙම වාර්තාවේ දින දක්වා අය වී නොතිබුණි. |
| (ආ) | සභා බල ප්‍රදේශය තුල 2020 වර්ෂයේදී ඝන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 324 ක් පමණ බැහැර කිරීම සඳහා රු.882,122 ක පිරිවැයක්, කාර්යය මණ්ඩල සේවකයින් 06 දෙනෙකු ද වාහන සහ යන්ත්‍ර | විධිමත් කසළ කළමනාකරණ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. | ප්‍රාදේශීය සභාව මඟින් මේ වනවිටත් කසළ බැහැර කිරීමට ඉඩමක් මිලදී ගැනීමට කටයුතු යොදමින් පවතින බවත් එය සිදුකර අවසන් වූ | කසළ බැහැර කිරීම සඳහා අවශ්‍ය ඉඩම මිලදී ගැනිමේ කටයුතු කරන |

| | | | |
|---|---|---|---|
| උපකරණ 02 ක් ද යොදවා තිබුණි. එසේ වුවද, එම අපද්‍රව්‍ය බැහැර කිරීම විධිමත් හා පරිසර හිතකාමී ක්‍රමවේදයකින් බැහැරව භූමියේ වලවල් හාරා ඒ තුළ අපද්‍රව්‍ය බැහැර කර වලවල් වසා දැමීම මගින් පාරිසරික ගැටළු රාශියක් මතු වී තිබුණි. | | වහාම විධිමත් කසළ බව. කළමනාකරණ වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කරන බව. | |

**19. ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ලද ග්‍රාමීය ප්‍රදේශ වල මාර්ග කිලෝමීටර් 1000 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන 2017 - යටතේ සභා බල සීමාව තුල මාර්ග සංවර්ධන ව්‍යාපෘති 02 ක් ක්‍රියාත්මක කිරීම සඳහා 2017 අගෝස්තු 02 දින රු . 58,905,292 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. රු 120,750 .ක් වැයකර ප්‍රසම්පාදන දැන්වීමක් පළකර තිබුණද ,ඒ පිළිබඳව නොසළකා සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය වෙත ඉදිකිරීම් කටයුතු පවරා තිබුණි . නියමිත දිනට ව්‍යාපෘති අවසන් කිරීමට නොහැකි වීමෙන් ව්‍යාපෘති | ලැබී ඇති ප්‍රතිපාදන පළාතේ සංවර්ධනය සඳහා ඵලදායී ලෙස උපයෝජනයට අවශ්‍ය සියළු ක්‍රියාමාර්ග ගතයුතු වේ. | ප්‍රධාන අමාත්‍යාංශයේ 2017 සැප්තැම්බර් 29 දිනැති ලිපියට අනුව මෙම ව්‍යාපෘති 02 සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය වෙත පවරා ඉටුකර ගැනීමට තීරණය කරන ලදී .ඉතා කෙටි කාලසීමාවක් තුල ව්‍යාපෘති දෙක ඉටු කළ යුතු වීම හා පළාත් පාලන ඉංජිනේරුවරයා ස්ථාන මාරු වී යාම ,ගිවිසුම් කාලය දීර්ඝ කිරීම , ව්‍යාපෘති දෙක දුෂ්කර ප්‍රදේශවල පිහිටීම යන කරුණු මත ව්‍යාපෘතිය | 2021 වර්ෂය අවසානය දක්වා ව්‍යාපෘතිය නිමකර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | අවලංගු කරන දිනය වනවිට ඒ සඳහා රු 13,054,363 .ක මුදලක් වැයකර තිබුණි 2018 .නොවැම්බර් මස ප්‍රතිපාදන ආපසු පවරා ගෙන තිබුණි. | | අවසන් කිරීමට නොහැකි විය. | |
| (ආ) | ඇහැලියගොඩ නගරයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යටතේ නගරයේ පාරට මායිම්ව පිහිටි ගොඩනැගිලි කොටස් ඉවත් කිරීමේදී, එම සුන්බුන් අවශ්‍ය ස්ථාන වලට රැගෙන යාමේ ප්‍රවාහන වියදම් ප්‍රාදේශීය සභාව මඟින් දැරීමට හා පසුව එම වියදම් නාගරික සංවර්ධන අධිකාරිය මඟින් ප්‍රතිපූර්ණය කර ගැනීමට ඇති කරගෙන තිබූ වාචික එකඟතාවය මත 2013 වර්ෂයේදී අත්තිකාරම් වශයෙන් රු 900,000 .ක් සභා අරමුදලින් ගෙවා තිබුණද, 2020 වර්ෂය අවසන් වනවිටත් එකී මුදල ප්‍රතිපූර්ණය කර ගැනීමට අපොහොසත් වී තිබුණි .<br>තවද කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු රු 4,390,000 .ක් වූ ඉතිරි මුදල් පිළිබඳ එළඹ තිබූ බැරකම පියවීමට නොහැකි වීම හේතුවෙන් හිඟ මුදලට අමතරව සිදුවූ අලාභය ලෙස රු 2,634,000 .ක වන්දි මුදලක්ද | ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරිමට පෙර ගිවිසුම්ගත වී විධිමත්ව ඉටු කළ යුතුය. | ඇහැළියගොඩ නගර සංවර්ධන ව්‍යාපෘතිය ඉතා කඩිනමින් සිදුකල යුතු ව්‍යාපෘතියක් වූ බැවින් ගිවිසුම් අත්සන් නොකර හිටපු සභාපති සභාව දැනුවත් කර අදාල කටයුතු කර ,බිල්පත් ලැබීමෙන් පසු ගිවිසුම් අත්සන් කර ඇති බවත් මේ සම්බන්ධයෙන් අධිකරණයේ නඩුවක් පවතින බව . | 2022පෙබරවාරි වනවිට අධිකරණ කටයුතු අවසන්ව නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ඉල්ලමින් කොන්ත්‍රාත්කරු විසින් අධිකරණ ක්‍රියාමාර්ගයකට එළඹ තිබුණි . | | | |
| (ඇ) | ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ රු 39,281,227 .ක් වැයකර 2012 දෙසැම්බර් මස වැඩ අවසන් කර තිබූ ගැටහැත්ත බහුකාර්යය ගොඩනැගිල්ල 2018 වර්ෂය දක්වා නිෂ්කාර්යයව පැවති අතර, 2018දෙසැම්බර් 31 දින රු 100,000 .ක මාසික කුළියකට වර්ෂයක කාලයක් සඳහා ගොඩනැගිල්ලේ පළමු මහල හා බිම් මහල බදු දී තිබුණි .කෙසේ වුවද බදුකරු විසින් ගොඩනැගිල්ලෙහි විවිධ අඩුපාඩු දක්වා ඒවා පිළිසකර කර දෙන ලෙස ඉල්ලමින් කුළී මුදල් ගෙවීම පැහැර හැර තිබූ අතර, සභා අරමුදලින් රු 2,331,013 .ක් වැය කර සියළු අලුත්වැඩියා කටයුතු නිම කර දී තිබියදී අරමුණුගත කාර්යය සඳහා ගොඩනැගිල්ල යෙදවීමට හා ගිවිසුම් ප්‍රකාරව කුළී ගෙවීමට කටයුතු කර නොතිබුණි .<br><br>බදුකරු වැඩ ආරම්භ කළ දින සිට බදු මුදල් අයකර ගැනීමට 2019 | සභාව සතු වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතු අතර හිඟ කුලී අය කර ගත යුතුය. | බදුකුලී ගෙවන ලෙස වරින් වර බදුකරු වෙත ලිඛිත දැන්වීම් කළ බවත් බදුකරුට අයත් උපකරණ ද සමඟ මේ වනවිට ගොඩනැගිල්ල සභාව වෙත පවරා ගෙන ඇති බවත් බදුකරු විසින් පැහැර හරින ලද මුදල් අයකර ගැනීම සඳහා ගොඩනැගිල්ල තුල ඇති සෞඛ්‍ය උපකරණ පිළිබඳව තක්සේරුවක් ලබා ගැනීමට ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයෙන් නිලධාරීන් කණ්ඩායම් ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා ඇති බවත් මේ පිළිබඳව බදුකරු ද දැනුවත් කර ඇති බවත් මේ වනවිට මෙම ගොඩනැගිල්ල නැවත ටෙන්ඩර් කිරීම සඳහා | 2022පෙබරවාරි වනවිටද අදාළ කටයුතු නිමකර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| ඔක්තෝබර් 08 දින පැවති මහා සභාවේ හදිසි යෝජනා යටතේ අනුමත කර තිබීම හේතුවෙන් 2020 දෙසැම්බර් වනවිටත් සභාවට කුළී ආදායම් අයකර ගැනීමට නොහැකි වී තිබූ අතර, අහිමි වී තිබූ ආදායම රු 2,400,000 ක් විය. | | අවශ්‍ය තක්සේරු වාර්තාවක් ලබා දෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇති බව. | |

**20. ගලිගමුව ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| ගවමස් කඩයෙන් 2014 වර්ෂයේ සිට ලැබිය යුතු රු.525,146 ක හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. | නඩු තීන්දුව අනුව මුදල් අයකර ගතයුතු වුවත් ඔහු සතුව වත්කම් නොමැති බව අධිකරණයට වාර්තා කර ඇති බව දන්වා තිබුණි. | හිඟ මුදල් අය වී නොතිබුණි. |

**21. දෙහිඕවිට ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| 2019 වර්ෂය අවසානයට පැවති හිඟ අක්කර බදු ශේෂයෙන් රු. 1,656,808 ක් වසර 5 ට වැඩි කාලයක සිට පැවතියද අය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වා තිබුණි. | හිඟ ශේෂ අය වී නොතිබුණි. |

**22.** **රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය හා සබරගමුව පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ අංක 2005/04 හා 2005 ජූනි 01 දිනැති චක්‍රලේඛයේ 3(iv) හා 3(x) වගන්ති ප්‍රකාරව ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයෙන් විස්තර ලබාගෙන කට්ටිකර විකුණන ඉඩම්වල විකුණුම් වටිනාකමින් සියයට එකක බදු මුදලක් සභාවට අයකරගතයුතු වුවත් කට්ටි කරන ලද ඉඩම්වලින් තක්සේරු වටිනාකම මත පමණක් 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා බදු රු.1,121,730 ක් අයකරගෙන තිබුණි. | පනත හා චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුයි. | අලෙවි වී ඇති ඉඩම් සම්බන්ධයෙන් විස්තර ආදායම් පරීක්ෂක වෙත ලබාදී ඒ අනුව කටයුතු කරමින් පවතින බව දන්වා තිබුණි. | සත්‍ය විකුණුම් මත අයකලයුතු ගාස්තු අයකර නොතිබුණි. |

**23.** **මාතලේ ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| 2020 වර්ෂය අවසානයට අයවිය යුතු මුළු හිඟ ජල ගාස්තු ආදායම රු.3,709,745 ක් විය. | හිඟ ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | ඉදිරියේදී හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කිරීම. | හිඟ මුදල් අයකර ගෙන නොමැත. |

**24. දඹුල්ල ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| 2020 වර්ෂයේ අවසානයට තිබුණු රු 12,587,598.ක අවිනිශ්චිත ගබඩා ගිණුමේ හර ශේෂය නිරවුල් නොකර ඉදිරියට ගෙනවිත් තිබුණි. | අවිනිශ්චිත ගබඩා ගිණුමේ ශේෂය ඇතිවීමට වූ හේතුන් සොයාගෙන නිවැරදි කළ යුතු වේ. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත. | නිවැරදි කර නොමැත. |

**25. විල්ගමුව ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| 2018 වර්ෂයේ ආරම්භයට පැවති රු 3,068,983.ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂයට 2018 වර්ෂයේ වැරදි හර හා බැර සටහන් කිරීමෙන් පසුව අවසාන ශේෂය ලෙස රු1,501,54.5 ක බැර ශේෂයක් තිබුණු අතර අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිවැරදි කිරිමට කටයුතු කර නොතිබුණි. | ගිණුම්වල අවශ්‍යා ගැලපීම් කර අවිනිශ්චිත ගිණුම නිරවුල් කළ යුතුය. | ජර්නල් සටහන් අංක 03,06,07 යටතේ අවිනිශ්චිත ගිණුමට කරන ලද ගැලපීම් නිවැරදිව කර ඇත. | අඩුපාඩු නිවැරදි කර නොමැත. |

**26. මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| වටිනාකම රු 480,000.ක් වූ ජීව වායු ඒකකය වර්ෂ ක 05කාලයක් නිෂ්ක්‍රීයව පැවතුණි. | වත්කම් භාවිතා කළ යුතු වේ. | යථා තත්ත්වයට පත් කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | නිෂ්ක්‍රීයව පවතී. |

**27. උඩපළාත ප්‍රාදේශීය සභාව**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | ජල යෝජනා ක්‍රම 07 කින් වර්ෂ ගණනාවක සිට අයවිය යුතු රු.775,528 ක ජල ගාස්තු අයකර ගෙන නොතිබුණි. | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ජල සමීක්ෂණයක් සිදු කිරීමට තීරණය කරන ලදී. | රු 40,472.ක් අය කර ඇත. ඉතිරි මුදල් අය කර නැත. |
| (ආ) | ක්‍රියාකාරී තත්ත්වයේ පැවති ජල යෝජනා ක්‍රම 14 කින් අය වියයුතු රු.1,239,000 ක ජල ගාස්තු දීර්ඝ කාලයක සිට හිඟව පැවතුණි. | හිඟ ජල ගාස්තු අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ජල සමීක්ෂණයක් සිදු කිරීමට තීරණය කරන ලදී. | රු 40,472.ක් අය කර ඇත. ඉතිරි මුදල් අය කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | පුස්සැල්ලාව නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 14 කින් 2015 වර්ෂයේ නව තක්සේරුව මත අය වියයුතු රු.9,648,000 ක කඩ කුලී අයකර නොතිබුණි. | අය විය යුතු ආදායම් රැස් කළ යුතු වේ. | ගිවිසුම්ගත පරිදි හිඟ කඩ කුලී ගෙවන ලෙස දැනුවත් කර ලිපි යවා ඇත. | නව තක්සේරුව මත කුලී අය කර නොමැත. |

**28. පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | ග්‍රීන් වුඩ් කළුගල් ව්‍යාපෘතියට අදාළ ඉඩම් භාවිතය වෙනුවෙන් පසුගිය වර්ෂ සඳහා රු.1,650,000 ක මුදලක් ඉඩම් ප්‍රතිසංස්කරණ සභාවට ගෙවා තිබූ නමුත්, ව්‍යාපෘතිය මඟින් ආදායම් ඉපයීමට කටයුතු කර නොතිබුණි. | ව්‍යාපෘතිය නියමිත පරිදි කළමනාකරණය කිරීම මඟින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | බලපත්‍ර ලබා ගැනීමට අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කර ඇත. | අඩුපාඩුව නිවැරදි කර නොමැත. |
| (ආ) | දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබාගත් ණය මුදලක් මඟින් 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලය තුළ මිලදී ගන්නා ලද රු.2,176,440 ක් වටිනා ජල මනු 480 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට ද ජල සම්බන්ධතා ලබාදීමට උපයෝගී කර නොගෙන නිෂ්කාර්යයව පැවතුණි. | වත්කම් මඟින් උපරිම ප්‍රයෝජන ලබා ගත යුතු වේ. | ජල මනු සවි කිරිම | ජල මනු 466 ක් සවි කර නැත . |

29. **තුම්පනේ ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| ලියාපදිංචි ත්‍රීරෝද රථ 447 ක් සඳහා ලැබිය යුතු ගාස්තු රු.1,576,090 ක් අයකර නොතිබුණි. | ත්‍රීරෝද රථ ගාස්තු අය කළ යුතු වේ. | හිඟ අය කිරීමට කටයුතු කිරිම | අය කර නොමැත. |

**30. පූජාපිටිය ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| සභාව සතුව භාවිතයට නොගන්නා රු.19,527,492 ක් වටිනා වාහන 10 ක් සම්බන්ධව ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි. | පරීක්ෂා කර, නිවැරදි ක්‍රියාමාර්ගයන් ගතයුතු වේ. | විධිමත් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව | විධිමත් ක්‍රියාමාර්ග ගෙන නැත. |

**31. පාතහේවාහැට ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| ත්‍රීරෝද රථ 506 ක් සඳහා අයවිය යුතු රු.4,493,500 ක් හා සංදේශන කුළුණු 07 ක් සඳහා අයවිය යුතු ගාස්තු ගණනය කර, අයකර නොතිබුණි. | අය කළ යුතු ආදායම් ලබා ගත යුතු වේ . | විධිමත් සංගණනයක් සිදු කිරීම | ගාස්තු අය වී නොමැත. |

**32. අකුරණ ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| පළාත් පාලන කොමසාරිස්ගේ 2013 ජූලි 31 දිනැති අංක 07 දරන චක්‍රලේඛය ප්‍රකාරව 2020 වර්ෂය වන විට ප්‍රාදේශීය සභාව විසින් ත්‍රීරෝද රථ නැවතුම්පල 29 ක ත්‍රීරෝද රථ 570 ක් ලියාපදිංචි කර තිබූ අතර එමගින් සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,543,000 ක් වූ හිඟ වාර්ෂික ගාස්තු අයකර ගතයුතුව තිබුණි. | ලියාපදිංචි කර ඇති සියලු ත්‍රීරෝද රථවලින් ගාස්තු අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | 2020 වර්ෂයේදී ප්‍රාදේශීය සභාව විසින් ත්‍රී රෝද රථ සමීක්ෂණයක් ආරම්භ කල අතර පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් අවසන් කර ගැනීමට නොහැකි වී ඇත. එම වර්ෂයේ වාර්ෂික ගාස්තු වශයෙන් රු.514,400.00 ක් අයකර ඇත. | විධිමත් කර නියමිත ගාස්තු අයකර නොමැත. |

**33. මැදදුම්බර ප්‍රාදේශීය සභාව**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | සභාව සතු ඉඩම් තක්සේරු නොකර බදු දී තිබුණු අතර, බදුකරුවන් 10 දෙනෙකුගෙන් මාස 8 සිට අවුරුදු 09 ක් දක්වා කාලයකට අදාල රු.468,815 ක් හිග මුදල් අයකර නොතිබුණි. | තක්සේරු බදු කුලිය අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | විධිමත් කිරීමට කටයුතු කර ඇත. | අඩුපාඩුව නිවැරදි කර නොමැත. |
| (ආ) | සභාව සතු වත්කම් බදු දීමෙන් 2004 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අයකර ගැනීමට පවතින හිඟ බදු කුලී රු.1,081,396 ක් විය. | මෙම හිඟ බදු සම්බන්ධයෙන් කඩිනමින් ක්‍රියාමාර්ගයක් ගතයුතු වේ. | හිඟ බදු අය කිරීමට කටයුතු කරමින් පවතී. | 2021.12.31 දිනට හිඟය රු.1,075,621.49 වේ. |

**34. පන්විල ප්‍රාදේශීය සභාව**

| | | | | |
|---|---|---|---|---|
| | සභාව සතු කඩකාමර 30 ක කඩ කුලී අය කිරීමේදී 2009 හා 2016 වර්ෂවල අදාල තක්සේරු අනුව කුලී අය නොකර ඊට පෙර වර්ෂවලට අදාල තක්සේරුව අනුව කුලී අය කිරීම නිසා රු.3,110,500 ක ආදායම අහිමි වී තිබුණි. | තක්සේරු කර වටිනාකම අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මේ වන විට කඩ කාමර 30 සම්බන්ධ නඩුව 2022 අප්‍රේල් මස වන විටත් විභාගවීමට නියමිතයි. | නිරවුල් වී නොමැත. |

**35. මිනිපේ ප්‍රාදේශීය සභාව**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | හිටපු සභාපතිවරයා අත්තිවාරමක් කඩා ඉවත් කිරීම හේතුවෙන් සිදු වූ රු.24,709 ක අලාභයට පැවති නඩුවෙන් පැමිණිලිකරුට රු.500,000 ක මුදලක් හා ඊට අදාළ නෛතික පොළියක් ගෙවීමට තීන්දු ලබා දී තිබුණි. ප්‍රාදේශීය සභාව මුදල් නොගෙවීම හේතුවෙන්, ප්‍රාදේශීය සභාව සතු රු.1,500,000 ක් | අලාභ සම්බන්ධයෙන් පරීක්ෂණ සිදුකර මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සහකාර පළාත් පාලන කොමසාරිස් මගින් පරීක්ෂණ මණ්ඩලයක් පත් කර පරීක්ෂණයක් සිදු වෙමින් පවතී. | සභා අරමුදලට සිදුවූ පාඩුව අයකර ගැනීමට කටයුතු කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | වටිනාකම වූ කැබ් රථය හා හසලක නගරයේ අංක 14 දරන කඩ කාමරය අධිකරණයේ භාරයට ගෙන තිබුණු අතර, නඩුව සමථයකට පත් කරගෙන 2018 ජූලි 26 දින රු.530,500 ක වන්දි මුදලක් ගෙවා තිබුණි. මෙම නඩුව හේතුවෙන් සභාවට සිදු වි ඇති රු.2,030,500 ක අලාභය සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | | |
| (ආ) | පුර නැගුම ව්‍යාපෘතිය යටතේ රු.59,078,700 ක් වැය කර ඉදි කළ බහුකාර්ය ගොඩනැගිල්ලේ මහජන පුස්තකාලය, තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය, සෞඛ්‍ය මධ්‍යස්ථානය, මාතෘ හා ආයුර්වේද මධ්‍යස්ථානය හා ප්‍රජා ශාලාව යනාදිය ස්ථාපිත කිරීමට යෝජනා කර තිබුණද, පළමු මහල කාර්යාල පරිශ්‍රය සඳහා භාවිතයට ගෙන තිබුණු අතර මෙම ගොඩනැගිල්ලෙහි බිම් මහලේ හා දෙවන මහලේ වර්ග අඩි 14000 ක ප්‍රමාණය කිසිදු ප්‍රයෝජනයක් නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | කඩිනමින් ඵලදායී කටයුත්තකට යොදාගත යුතු බව. | පළමු මහල මහවැලි සංවර්ධන ආයතනයට හා ස.තො.ස. ආයතනය වෙත බදු දීමට අවශ්‍ය කටයුතු සලසා ඇත. | දෙවන මහල නිශ්කාර්යව පවතී. |

36. **උඩුදුම්බර ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| සභාව සතු කඩ කාමර 19 ක මාසික කුලිය 2018 මැයි 22 දින තක්සේරු කර ඇතත්, එම තක්සේරුව ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් අයකර ගතයුතු | නව තක්සේරුව අනුව කඩ කුලී අයකර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතු වීම. | නඩු මාර්ගයට එළඹ අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කිරීම. | කඩ කාමර 05 ක් නව තක්සේරුව අනුව මුදල් ගෙවීමට අකමැති වී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | රු.1,656,640 ක මුදලක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | | | |

**37. කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | සිරිමල්වත්ත නිවාස යෝජනා ක්‍රමයේ අංක 9 දරන ඉඩම් කට්ටි මිලදී ගැනීම සඳහා 2015 වර්ෂයේදී රු.1,230,910 ක් ගෙවා ඇතත්, ගෙවිය යුතු ඉතිරි මුදල් ගෙවා ඉඩම පවරා ගැනීමට හෝ ගෙවූ මුදල් නැවත ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම මිලට ගැනීමට හෝ ගෙවූ මුදල් නැවත අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සභාව මගින් නිවාස සංවර්ධන අධිකාරියට ගෙවීම් කරන ලද මුදල ආපසු ලබාදෙන ලෙසත් පොදු කටයුතු සඳහා වෙන් කරන ලද ඉඩම් කොටස සභාවට පවරා දෙන ලෙසත් දැනුම් දී ඇත. | නිරවුල් වී නොමැත. |
| (ආ) | බලගොල්ල මොරගහපිටිය බහුකාර්ය ගොඩනැගිල්ලේ හා දිගන බහුකාර්යය ගොඩනැගිල්ලේ කඩ කාමරවල තක්සේරුව ක්‍රියාත්මක නොකිරීම නිසා රු.19,080,000 ක ආදායමක් අහිමි වී තිබුණු අතර, නව තක්සේරුවක් ලබා ගැනීමටද කටයුතු කර නොතිබුණි. | තක්සේරු වටිනාකම මත කඩ කුලී අය කිරීම හා නව තක්සේරුවක් ක්‍රියාත්මක කළ යුතු වේ. | මෙම කඩ කාමර සඳහා නව තක්සේරුව ලැබී ඇති අතර, ඒ අනුව අදාළ බදු කරුවන් වෙත ගිවිසුම් ගත වීමට දැනුම් දෙන ලදී. එහෙත් එම නව තක්සේරුව මගින් ලබා දී ඇති ගාස්තු පිළිගත නොහැකි බව දන්වා කඩ හිමියන් විසින් විරෝධතා ඉදිරිපත් කර ඇත. තක්සේරු දෙපාර්තමේන්තුව වෙත මෙම විරෝධතා යොමු කර ඇති අතර, මෙතෙක් ඔවුන්ගේ අවසන් තිරණය ලබා දී නොමැත. | නිරාකරණය වී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | පෞද්ගලික හෝටලයක් විසින් ව්‍යාජව සැකසූ ගිණුම් කට්ටලයක් මත 2015, 2016, 2017 වර්ෂවල රු.2,358,313 ක බදු මුදලක් ගෙවා තිබූ නමුත්, සංචාරක මණ්ඩලයට ඉදිරිපත් කළ ගිණුම් ප්‍රකාශනවලට අනුව රු.14,462,640 ක ආදායමක් අඩුවෙන් අයකර ඇති බව අනාවරණය වී තිබියදීත් එම ආදායම අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණු අතර 2018, 2019 වර්ෂ සඳහා ද අදාළ ආයතනය විසින් සභාවට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ වර්ෂයන්හි මූල්‍ය ප්‍රකාශන ලබා ගැනීමට කටයුතු කිරීම හා ඒ අනුව අයවිය යුතු නියමිත බදු මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | 2015 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා එක් එක් වර්ෂයට වෙන් වෙන් වශයෙන් නඩු පවරා ඇති බව දන්වමි. | නියමිත ආදායම අයකර ගැනීම ගැටළුකාරීව පවතී. |
| **38.** | **කොටගල ප්‍රාදේශීය සභාව** | | | |
| | 2015 මැයි 11 දින රු.83,373,432 ක වියදමින් සභාව නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ගිවිසුමකට එළඹ තිබුණු අතර, 2016 දෙසැම්බර් 31 දින වන විට ඒ සඳහා රු.21,559,211 ක් ගෙවා තිබුණි. පරිපාලන තාක්ෂණික ගැටළු හේතුවෙන් එහි වැඩ වසර 03 කට අධික කාලයක සිට නතර කර දමා තිබුණි. | අදාළ පාර්ශවයන් සමඟ එකඟතාවයන්ට පැමිණ ව්‍යාපෘතිය නිම කරවා ගැනිමට කටයුතු කළ යුතු වේ. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත. | නිවැරදි කර නොමැත. |
| **39.** | **කොත්මලේ ප්‍රාදේශීය සභාව** | | | |
| (අ) | 2018 අගෝස්තු 09වන දින වනවිට ප්‍රාදේශීය සභාවේ නව දෙමහල් ගොඩනැගිල්ලේ පළමු අදියර ඉදිකිරීම් සඳහා | ව්‍යාපෘතිය ඉක්මනින් නිමකරවා ගැනීමට කටයුතු කළයුතු වේ. | පළමු අදියර අවසන් කර දෙවන අදියර සඳහා ඇස්තමේන්තුවක් ලබාදෙන ලෙස පළාත් පාලන කොමසාරිස් | නිවැරදි කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | රු 11,112,792.ක මුදලක් වැයකර තිබුණි .නමුත් සභාව සතුව ප්‍රමාණවත් අරමුදල් පැවතියද එහි ඉතිරි වැඩ කොටසේ ඉදිකිරීමේ 2020 අප්‍රේල් වනවිටද ආරම්භ කර නොතිබීම හේතුවෙන් යොදවා ඇති මහජන මුදල්වලින් ප්‍රතිලාභ ලැබීම ප්‍රමාදවීම සහ අනාගත මිළ ගණන් ඉහළයාමේ අහිතකර ප්‍රතිවිපාකයන්ට මුහුණදීමේ තත්ත්වයක් ඇති වී තිබුණි . | | මඟින් මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලීම් කර ඇත. | |
| (ආ) | නවංගම පානීය ජල ව්‍යාපෘතිය 2020 දෙසැම්බර් 01 දින ආරම්භ කර 2020 දෙසැම්බර් 13 දින වැඩ නිම කර රු.1,979,598 ක බිල්පත් ඉදිරිපත් කර තිබූ අතර 2021 ජුනි 26 දින රු.1,067,766 ක මුදලක් ගෙවීම් කර තිබුණි. නමුත් ව්‍යාපෘතිය මගින් පානීය ජලය ලබාදීමට අපොහොසත් වී තිබුණි. | ඇස්තමේන්තු හා නියමිත පිරිවිතර අනුව අරමුණු ඉටුවන පරිදි ව්‍යාපෘති ක්‍රියාවට නැංවිය යුතු වීම. | සංවර්ධන යෝජනාවේ අඩුපාඩු නිසා කොන්ත්‍රාත්කරුට කොටස් ගෙවීමක් කර ඇති බව. | නිවැරදි කර නොමැත. |

**40. හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| හඟුරන්කෙත පොදු වෙළඳපොළ සංකීර්ණයේ කඩ කාමර 12 කින් වසර 04 සිට 09 දක්වා කාලයක් තිස්සේ පැවත එන රු.2,214,537 ක හිඟ කඩ කුලී අයකර ගෙන නොතිබුණි. සන්තකය පවරා ගැනීමට ලිපිගොනු සකස් කිරීම පමණක් සිදුකර තිබුණි. | හිඟ ආදායම් අය කිරීමට කටයුතු කළයුතු වීම. | නිත්‍යානුකූලව සන්තකය පවරා ගැනීමට නඩු පැවරීම සඳහා ලිපි ගොනු සකස් කර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයට 2020 පෙබරවාරි 05 වන දින භාර දී ඇත. | නිවැරදි කර නොමැත. |

**41. අක්මීමන ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| සභාව විසින් තලගහ හෙට්ටිය ගම්මැද්ද කුඹුර ඉඩමෙන් කොටසක් අයිතිකරුගේ අකමැත්ත මත සභාවේ නමට 1997 දෙසැම්බර් 11 දින පවරා ගැනීමෙන් අයිතිකරු ගොනු කර නඩුව මත රු.1,187,475 ක මුදලක් ගෙවීමට සිදු වී ඇති අතර, අදාළ ඉඩමේ ගොඩනැගිල්ල ඉවත් කිරීම මත රුපියල් ලක්ෂ 46 ක වන්දි ඉල්ලා නඩුවක් ද ගොනුකර තිබුණි. | නීති, රීති වලට අනුකූලව කටයුතු කළ යුතුවේ. | අදාළ මන්ත්‍රීවරුන්ගෙන් අධිභාර කොට අයකර ගැනීමට අදාළව පළාත් පාලන කොමසාරිස් වෙත දන්වා ඇතත්, මෙතෙක් පිළිතුරු ලැබී නොමැති අතර, අංක 657 නඩුව තවමත් අධිකරණයෙහි විභාග වෙමින් පවතින බව ද, සඳහන් කරමි. | 2022.02.10 දින දක්වා පළාත් පාලන කොමසාරිස් වෙතින් උපදෙස් ලැබී නොමැති අතර, අංක 657 නඩුව තවමත් අධිකරණයේ විභාග වෙමින් පවතී. |

**42. ඇල්පිටිය ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| දිගු කාලයක සිට මුල්‍යා ප්‍රකාශනවල ඉදිරියට ගෙනෙමින් තිබෙන බැකෝ යන්ත්‍ර ආදායම් රු.940,837 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීම කළයුතු වේ. | ආදායම් අයකිරීම් සම්බන්ධව දිගින් දිගටම දැනුවත් කර ඇත. ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරමි. | අයකර ගැනීමට කටයුතු කරමින් පවතියි. |

**43. කරන්දෙණිය ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| 2006 වර්ෂයේ දී දකුණු පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් විශාල වටිනාකමකින් යුත් කාය වර්ධන ක්‍රීඩා භාණ්ඩ තොගයක් සභාවට ලබා දී තිබූ අතර, 2011 වර්ෂයේ දී එම අමාත්‍යාංශයේම ප්‍රතිපාදන මඟින් රු.1,470,000 ක් වැයකර සභාව සතු ඉඩමක ශාරීරික සුවතා, කාය වර්ධන මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණි. භෞතික විගණන පරීක්ෂාවේ දී හා සභාවෙන් ලද තොරතුරු අනුව 2011 වර්ෂයෙන් පසු මෙම උපකරණ ප්‍රයෝජනයට ගෙන නොතිබූ අතර, මේ සම්බන්ධයෙන් කිසිදු තොරතුරක් සභාව සතුව නොතිබුණි. | උපකරණ ලේඛනගත කළයුතු අතර, ව්‍යාපෘතියෙන් ප්‍රදේශයේ ජනතාවට සේවයක් ලබා දිය යුතු වේ. | ඉදිරියේ දී උපකරණ ලේඛනගත කර ජනතාවට සේවයක් ලබා දීමට කටයුතු කරමි. | මෙහි භූමිය පමණක් සභාව සතු වන අතර, අදාළ ක්‍රීඩා උපකරණ කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් අතර, එහි ලේඛන තුළ ඇතුලත් කර ඇති බව සඳහන් කරමි. |

.

**44. බද්දේගම ප්‍රාදේශීය සභාව**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු අක්කර 02 පර්චස් 14.4 ක විශාල ලේල්වලවත්ත පන්විල ඉඩම පවරා ගැනීම සඳහා රු.2,044,000 ක් ගෙවා තිබුණ ද, පවරා ගැනීම් සිදුව නොතිබුණි. | ඉඩමේ අයිතිය නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කල යුතුවේ. | නීතිමය කටයුතු ආරම්භ කර ඇති බව දන්වමි. | මෙම ඉඩම සම්බන්ධ නඩුවක් පවතින අතර, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ගෙවූ මුදල් නැවත අප වෙත ගෙවන මෙන් අවස්ථා ගණනාවකදී ඉල්ලීම් කර ඇත. |
| (ආ) | මාකුරුගොඩවත්ත ඉඩම සතිපොල ඉදිකිරීම, කසළ අංගනයක් ඉදිකිරීම හා නගර ශාලාව ඉදිකිරීමට ඉඩම් පවරා ගැනීමට අදාල රු.500,000 ක මුදලක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට ගෙවා තිබූ නමුත්, ඉඩම පවරා ගැනීම සිදුව නොතිබුණි. | ඉඩමේ අයිතිය නීත්‍යානුකූලව පවරාගෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුවේ. | මේ වන තුරු ඉඩම පවරා ගැනීමට නොහැකි වී ඇත. | මේ සම්බන්ධයෙන් ලිඛිතව මෙන්ම වාචිකව ද ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත දැනුවත් කර ඇත. |
| (ඇ) | 2003 වර්ෂයේ සිට බදු ගිවිසුමකින් තොරව ලංකා ධීවර සංස්ථාවට බදු දී තිබුණු මාළු වෙළඳසැල 2018 වර්ෂයේ ජනවාරි මාසයේ සිට වසා දමා තිබුණි. එකී වෙළඳසැල 2018 වර්ෂයේ මැයි 31 දින නැවත | කඩ කාමරය ගිවිසුම්ගතව බදු දීමට ද හිඟ බදු මුදල් අයකර ගැනීමට ද කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂය තුළ නිවැරදිව ආදායම් ඉපයීමට කටයුතු කරමි. | රු.34,875 ක මුදලක් කපා හැරීමට සභා අනුමැතිය ලැබී ඇති අතර, ගරු ආණ්ඩුකාරතුමා |

| | | | |
|---|---|---|---|
| සභාවට පවරාගෙන තිබුණ ද, අයවිය යුතු හිඟ බදු කුලිය වූ රු.652,723 ක් අයකර ගෙන නොතිබුණි. | | | ගේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කර ඇත. |

**45.** **බලපිටිය ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| සභා බල ප්‍රදේශය තුල එකතු කරනු ලබන කසළ සම්බන්ධයෙන් සභාවට ස්ථිර විසඳුමක් නොතිබුණ අතර, එකතු කරනු ලබන කසල පස් දමා වසා දැමීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු.626,520 ක මුදලක් වැයකර තිබුණි. | කසළ කළමනාකරණය සඳහා දීර්ඝකාලීන වැඩපිළිවෙලක් සකස් කළ යුතුවේ. | ඉදිරියේදී රජයේ ඉඩමක් පවරාගෙන කසළ කළමනාකරණයට ස්ථිර විසඳුමක් ලබා ගැනීමට කටයුතු කරන බව දන්වමි. | කසළ කළමනාකරණය සඳහා දීර්ඝකාලීන විසඳුමක් ලෙස කොස්ගොඩ නානතොට රජයේ ඉඩමේ කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා යෝජනා වී තිබුණ ද, මධ්‍යම පරිසර අධිකාරිය නිර්දේශය ලබා දීම සිදු කර නැත. |

**46.** **බෙන්තොට ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| සභා කැබ් රථයක එන්ජිම සම්පූර්ණ අළුත්වැඩියාව සඳහා රු.802,884 ක් වැයකර තිබුණ ද, වසරක වගකීම් කාලයට පෙර එන්ජිම අක්‍රිය තත්ත්වයට පත්ව තිබුණි. | මූලික විමර්ශනයක් සිදුකර, වගකිව යුතු පුද්ගලයන් හඳුනාගෙන අලාභයන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පළාත් පාලන දෙපාර්තමේන්තුව හරහා මූලික විමර්ශනයක් සිදුවෙමින් පවතී. | දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ අංක 04/03/01/08(3) |

| | | | | |
|---|---|---|---|---|
| | රියදුරන්ට ලබාදුන් උපදෙස් පිළි නොපැදීම නිසා මෙහි වගකීම භාරගත නොහැකි බව අළුත්වැඩියා ආයතනය සභාවට දන්වා තිබූ අතර, නැවත අළුත්වැඩියාව සඳහා වාහන නියෝජිත ආයතනය මඟින් රු.2,682,755 ක ඇස්තමේන්තුවක් ලබාගෙන තිබුණි.මේ සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් පැවැත්විය යුතු බවට යාන්ත්‍රික ඉංජිනේරුවරයා 2018 අප්‍රේල් 05 ලිපියක් මඟින් දැනුම් දී තිබුණ ද, 2019 පෙබරවාරි 15 දින දක්වා මූලික විමර්ශනයක් සිදුකර නොතිබුණි. | | | හා 2019.08.09 දිනැතිව මූලික විමර්ෂණ වාර්තාවක් ලබා දී ඇති අතර, ඒ අනුව අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතියි. |
| **47.** | **හබරාදූව ප්‍රාදේශීය සභාව** | | | |
| | අහංගම පොදු වෙළඳ සංකීර්ණයේ බදු දී තිබූ කඩ කාමර 77 කින් එක්වන් මුදල් ලෙස රු.17,055,200 ක් හා බදු කුලී ලෙස රු.410,149 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟ එක්වන් මුදල් රු.2,742,400 ක් හා හිඟ බදු කුලී රු.260,210 ක් තවදුරටත් අයවීමට පවතියි. මුදල් ගෙවීම් පැහැර හරින ලද කඩ කාමර සඳහා |

| | | | | |
|---|---|---|---|---|
| | | | | මාස 03 ක සහන කාලයක් ලබා දී ඇති අතර, එය අවසන් වූ පසු ගිවිසුම් ප්‍රකාරව කටයුතු කරමි. |
| **48.** | **දෙවිනුවර ප්‍රාදේශීය සභාව** | | | |
| (අ) | 2014 දෙසැම්බර් 11 වැනි දින සභාව විසින් දෛනිකව රැස්කරන කසළ බැහැර කිරීම සඳහා සභා අරමුදලින් රු.2,700,000 ක් වැයකර අපරැක්ක ප්‍රදේශයෙන් අක්කර 04 ක ඉඩමක් මිලදී ගෙන තිබුණු අතර මහජන විරෝධය නිසා එය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. මාතර තංගල්ල ප්‍රධාන මාර්ගයට යාබඳ පෞද්ගලික ඉඩමකට අවිධිමත් ලෙස කසළ බැහැර කිරීම නිසා අවට පිහිටි විශ්වවිද්‍යාලයට, පාසලට හා මහජනයාට පාරිසරික ගැටළු වලට මුහුණ දීමට සිදු වී ඇත. | විධිමත් ලෙස කසළ බැහැර කළ යුතුවේ. | දිරන කසළ පමණක් විධිමත්ව බැහැර කිරීමට කටයුතු කරන බව. | දෛනිකව එකතු වන කසළ වැල්ලමඩම මෝල්වත්ත පෞද්ගලික ඉඩමකට බැහැර කරන අතර එය කලපුව ආශ්‍රිතව පවතින ඉඩමක් වන අතර දැනට 2019 වර්ෂයේ සිට පොලිතීන්, ප්ලාස්ටික් වෙන් කර එකතු කිරීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කර ඒ අනුව දිරන කසළ පමණක් එම ස්ථානයට බැහැර කරන අතර නොදිරන කසල කොටවිල ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයට භාරදීම සිදු කරනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | දෙවිනුවර කපුගම පිහිටි මැදගොඩහේන වත්ත නමැති ඉඩමෙහි බෙදා වෙන් කරන ලද පර්චස් 15.33 ක අංක 34 කැබැල්ල 2004 ජුනි 21 දිනැති පැවරුම්කරයෙන් සභාවට ලබා දී තිබූ අතර සභාපති විසින් 2006 පෙබරවාරි 13 දින අංක 10980 විකුණුම්කරයෙන් බාහිර පුද්ගලයෙකුට විකුණා තිබුණි. | අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගෙන ඉඩම සභාවට පවරා ගත යුතුවේ. | සභා දේපළ විකිණීම සම්බන්ධව විකුණුම්කරුට එරෙහිව නඩු පැවරීම සඳහා අදාල ලිපි ලේඛන සහිත ගොනුව නීතිඥවරයාට භාර දී තිබුණද නීතිඥවරයා ලබා දෙන ලද උපදෙස්වලට අනුව වර්තමාන තත්ත්වයට අදාල අනෙකුත් ලේඛනද ඇතුළත් කර 2019 නොවැම්බර් 28 දින නැවත නීතිඥවරයාට භාර දෙන ලදී. | නිතිමය කටයුතු සඳහා ලිපි ගොනු නීතිඥවරයාට භාරදී ඇත. කොවිඩ් 19 හේතුවෙන් මේ දිනවල උසාවි කටයුතු ප්‍රමාද වී ඇත. |
| (ඇ) | 2020 වර්ෂයේ දෙවිනුවර ඇසළ සල්පිල් සඳහා තාවකාලික කඩ හා බිම් අල්ලි ලබාදීමේදී නියමිත ක්‍රමවේදය අනුගමනය නොකිරීම හේතුවෙන් සභාවට රු.4,016,300 ක ආදායමක් අහිමි වී තිබුණි. | ටෙන්ඩර් කැඳවා බඳුදීම කළ යුතුවේ. | 2017 වර්ෂයේ ටෙන්ඩර් ක්‍රියා පටිපාටිය අනුව කටයුතු කිරීමට සැලසුම් කර ආරම්භ කලද ප්‍රධාන අමාත්‍යතුමාගේ නියෝගය හා කමිටු නිර්දේශය අනුව එම ක්‍රමවේදය අතරමඟ නතර කර දැමීමට සිදු විය. ඇතැම් අවස්ථාවල භූමියේ තිබූ පිහිටීම අනුව කඩ අලෙවි කර ගැනීමට නොහැකි වූ අතර ඇතැම් වෙළෙඳුන් තම වෙළෙඳ ස්ථානයට ආසන්නව නොවිකුණූ කඩවල වෙළෙඳ ද්‍රව්‍ය තබා තිබුණි. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ඇසළ සල්පිල් කටයුතුවලට අදාළව වෙළඳ කටයුතුවල නිරත වූ තාවකාලික කඩ කාමර හා බිම් අල්ලි 84 කින් රු.2,026,800 ක කඩකුලී මුදල් අයකරගෙන නොතිබුණි. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | විකුණා නොමැති සියලුම තාවකාලික කඩ හා බිම් අල්ලිවල අනවසරයෙන් රැඳී සිටින ජංගම වෙළෙඳුන් නිරන්තරයෙන් ඉවත් කිරීමට කටයුතු කරන බව. | විකිණීමට නොහැකි තාවකාලික කඩ හා බිම් අල්ලි 84 ඉදිරි කාලයට අදාල ගාස්තු ගෙවා වෙළෙඳාම් කිරීමට එකඟ වූ වෙළෙඳුන් හට එකඟ වූ දා සිට ඉදිරියට ගාස්තු අය කර වෙළඳාම් කිරීමේ අවස්ථාව ලබා දෙන ලදී. |

## 49. කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව

| | | | | |
|---|---|---|---|---|
| (අ) | 2014 මාර්තු 20 දිනැති සැලසුම් කමිටු තීරණය මගින් අනුමත කර තිබූ අංක BA/2014/05 ගොඩනැගිලි සංවර්ධන බලපත්‍රයේ වාණිජ භාවිතය සඳහා වර්ග මීටර් 1306.93 ක සිව්මහල් ගොඩනැඟිලි සැලැස්මේ මෝටර් රථ නැවතුම් ස්ථාන 06 ක් පෙන්නුම් කර තිබුණද මෝටර් රථ නැවතුම් ස්ථාන 01 ක් සඳහා පමණක් ඉඩ වෙන්කර තිබුණි. නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යාංශයේ 2009 අප්‍රේල් 17 හා අංක 1597/8 දරන ගැසට් පත්‍රයේ 05 ඡේදය පරිදි භාවිතය වෙනස් කිරීම වෙනුවෙන් නැවතුම් ස්ථාන එකකට රු.500,000 ක් බැගින් වාහන නැවතුම් ස්ථාන 05 ක් සඳහා රු.2,500,000 ක් අය කරගෙන නොතිබුණි. | අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතු වේ. | BA/2014/05 ගොඩනැඟිලි අයදුම් පත්‍රයේ ගොඩනැඟිලි සැලැස්මේ පෙන්නුම් කර ඇති මුත් ඉඩ වෙන් කර නොමැති මෝටර් රථ නැවතුම් ස්ථාන 05 සඳහා එක් ස්ථානයකට<br><br>රු. 500,000 බැගින් රු.2,500,000ක් ගෙවන ලෙස එම ගොඩනැඟිල්ල අයිතිකරු වන ස.ණ.ස. සමිතිය වෙත දන්වා යවා ඇත. | නීති උපදෙස් පතා දකුණු පළාත් නීති අධ්‍යක්ෂ වෙත යොමු කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2006 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවති රු.1,168,845 ක අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය 2020 වර්ෂයේදී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඒ පිළිබඳ සොයා බලා අවශ්‍ය ගැලපීම් කර අවිනිශ්චිත ගිණුම නිරවුල් කළ යුතුය. | මේ වන තෙක් නිරවුල් කිරීමට නොහැකි වී ඇති බව. | මේ දක්වා නිරවුල් කිරීමට කටයුතු කර නොමැත. |

**50. කොටපොළ ප්‍රාදේශීය සභාව**

| | | | | |
|---|---|---|---|---|
| | සභාව විසින් මිලදී ගෙන තිබූ රු.900,900 ක් වටිනා ප්ලාස්ටික් පුටු 1300 ක් ගිවිසුම් පත්‍රයක් මගින් පුටුවකට රු.8 ක ගාස්තු අයකර කුලියට ලබා දීමට සභාව තීරණය කර තිබුණද 2020 වර්ෂයේ දෙසැම්බර් 08 දින වන විට රු.450,450 ක් වටිනා පුටු 650 ක් කුමන පාර්ශවයන් වෙත ලබා දුන්නේද යන්න අනාවරණය කර නොතිබුණි. | සභා තීරණය අනුව පුටු ලබා දීම විධිමත් ලෙස සිදු කළ යුතුය. | ඉදිරියේදී ලේඛනයක් නඩත්තු කර විධිමත් පරිදි පුටු ලබාදීමට කටයුතු සිදු කරන බව. | ඉතිරි පුටු කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කරන බව. |

**51. දික්වැල්ල ප්‍රාදේශීය සභාව**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | කෝට්ටගොඩ පාතේගම හන්දියේ සිට උඩුපිටිය මාර්ගයේ ජලනල එලීමේදී පළුදු කරන ලද මාර්ග කොටස් නවීකරණයට අදාළව රු.1,774,650 ක ඇස්තමේන්තුවක් 2016 නොවැම්බර් 15 දින ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ඉදිරිපත් කර තිබුණු අතර ඒ සඳහා එකී ආයතනයෙන් රු.1,632,150 ක මුදලක් 2017 ඔක්තෝබර් 19 දින සභාවට ලැබී තිබුණි. තවද ජලනල එලීමේ කටයුතු 2019 මැයි 29 දින අවසන් වී තිබුණ ද අදාළ මාර්ගයේ නවීකරණ කටයුතු අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ මාර්ගයේ නවීකරණ කටයුතු කඩිනමින් අවසන් කළ යුතුවේ. | මාර්ගයේ නවිකරණ කටයුතු ආරම්භ කිරීමට කටයුතු ආරම්භ කරන බව. | තවමත් නවීකරණ කටයුතු සිදුකර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන හෝටල් 02 කින් 2020 වර්ෂය අවසන් වන විට රු. 14,640,260 ක් අඩුවෙන් අයකර තිබුණු අතර, හෝටල් 12 කින් ගාස්තු අය කරගෙන නොතිබුණි. | පනත ප්‍රකාරව බදු මුදල් අය කළ යුතුය. | ගාස්තු අඩුවෙන් අය කර ඇති හෝටල්වලින් හිඟ මුදල් අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව | හිඟ ගාස්තු අය කර ගැනීම සම්බන්ධයෙන් ඉදිරියේදී නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සලකා බලනු ලබන බව. |

## 52. හක්මන ප්‍රාදේශීය සභාව

| | | | |
|---|---|---|---|
| වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පැවති රු.873,211 ක අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය හඳුනාගෙන ගිණුම්වලට ගැලපීමට පියවර ගෙන නොතිබුණි. | ඒ පිළිබඳව සොයා බලා ගිණුම්වල අවශ්‍ය ගැලපීම් කර අවිනිශ්චිත ගිණුම නිරවුල් කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කිරීම | නිවැරදි කිරීමට අවශ්‍ය තොරතුරු සොයමින් පවතී. |

## 53. සූරියවැව ප්‍රාදේශීය සභාව

| | | | |
|---|---|---|---|
| 2017 වර්ෂයේ සමුච්චිත අරමුදලට ගලපා තිබූ රු.589,343 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | අවශ්‍ය ගැලපීම් කර ගිණුම් නිවැරදි කළයුතු වේ. | ඉදිරියේදී හඳුනා ගැනීමට උත්සහ ගන්නා බව | අවිනිශ්චිත ගිණුමේ ශේෂය හඳුනා ගැනීමට නොහැකි වූ බැවින් ඒ සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස්වර යාගේ සහාය ඉල්ලා ඇති බව. |

## 54 කටුවන ප්‍රාදේශීය සභාව

| | | | | |
|---|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයන් වලදී කඩ කාමර 05 කින් ලැබිය යුතු එක්වන් මුදල් රු.8,745,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | ලැබිය යුතු රු.200,000 ක් සඳහා නඩු පවරා ඇති බවත්, ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට සමත මණ්ඩලය වෙත යොමු කරමි. | හිඟ එක්වන් මුදල් නිදහස් කිරීම සඳහා ආණ්ඩුකාරතුමා ගේ උපදෙස් ලබාගැනීම සඳහා ඉදිරිපත් කළ බව. |
| (ආ) | 2015 වර්ෂයේදී සභාවට භාර දී තිබුණු වටිනාකම රු.9,984,179 ක් වූ කටුවන සති පොළ ගොඩනැගිල්ල වර්ෂ 05 ක කාලයක් සහ කිරම බස් නැවතුම්පලේ කඩ කාමර 2020 වර්ෂය අවසානය වන විටත් නිශ්කාර්යව පැවතුණි. | සභාව සතු වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කළයුතු වේ. | ජලය නොමැති වීම හා භූමියේ කැටගල් ඇල්ලීම ප්‍රමාද වීම මත පොළ ගොඩනැගිල්ල විවෘත නොකළ බවත්, බස් නැවතුම්පොළ කඩ කාමර තක්සේරු කිරීම සඳහා ලිපි සකසමින් සිටින බව දන්වමි. | සභාවට බාරදුන් සතිපොළ ගොඩනැගිල්ලෙහි අඩුපාඩු පැවති අතර ඒවායින් කිහිපයක් සකස් කළ බවත් ඉදිරියේදී භාවිතයට ගැනීමට කටයුතු කරමි. |

## 55. ජාඇල ප්‍රාදේශීය සභාව

| | | | | |
|---|---|---|---|---|
| (අ) | 2000 වර්ෂයේ සිට පැවත එන නිරවුල් නොකළ අවිනිශ්චිත ගිණුමේ ශේෂය රු.236,425 ක් විය. | පෙර සිට පැවත එන ශේෂ නිරවුල් කළ යුතුය. | ගිණුම් කටයුතු ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සිදුකිරීමට හා නිවරදිව ගිණුම් සැකසීමත් සිදු කරමි. | පළාත් පාලන සහකාර කොමසාරිස් මගින් යොමුකර ඇති අතර ඒ සඳහා අනුමැතිය ලද පසු මෙම ශේෂ නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |
| (ආ) | කදාන දුම්රිය පොළ පාරේ පදිංචිකරුවෙකු විසින් ගොඩනැගිල්ලකින් තම නිවසට සිදුවන අලාභහානි සම්බන්ධයෙන් සභාව ක්‍රියාත්මක නොවී තිබීම නිසා සභාවට විරුද්ධව නඩු පවරා තිබූ අතර, නඩුවට | සභාවට වූ පාඩුව වගකිව යුතු පාර්ශ්වයන්ගෙන් අය කර ගැනීමට පියවර ගත යුතුවේ. | වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගැනීමට කමිටුවක් පත් කර ඇති බව දන්වා ඇත. | මෙම නඩුවේ තීන්දුව අනුව පැමිණිලිකාර පාර්ශවය වෙත වන්දි මුදල් ලෙස රු.4,168,015 ක |

| | | | | |
|---|---|---|---|---|
| | සභාව වෙනුවෙන් නියෝජිතයෙකු පෙනී නොසිටීම හේතුවෙන් 2003 ජූලි 31 දින ඒකපාර්ශවීය තීරණයක් ලබා දී තිබුණි. නඩු විභාගයට සභාවේ නියෝජනයක් නැත යන්න අධිකරණය විසින් සනාථ කොට ඒකපාර්ශිකව පැමිණිල්ලේ වාසියට නඩුව තීන්දු කොට තිබුණි. අධිකරණයෙන් 2003 වර්ෂයේදී ගෙවීමට නියම වූ රු.500,000 ක මුදල හා මාසික අලාභ ගාස්තු රු.10,000 ක් ගෙවීම සම්බන්ධයෙන් සහනයක් ලබා ගැනීමට කටයුතු නොකිරීම නිසා 2020 වර්ෂය වන විට ගෙවිය යුතු ගාස්තු රු.4,168,015 දක්වා වැඩිවී තිබුණි. 2020 දෙසැම්බර් 31 දින වන විටත් මෙම මුදල ගෙවීමට හෝ අවම ගාස්තුවක් නියම කර ගැනීමට කටයුතු කර නොතිබූ අතර ඒ සම්බන්ධයෙන් වගකිව යුතු නිළධාරීන්ට එරෙහිව කටයුතු කර නොතිබුණි. | | | මුදලක් වාරික තුනකින් ගෙවීම් කිරීම සිදු කර ඇත. |
| (ඇ) | රාගම හා කඳාන පොදු වෙළඳ පොලේ මස් වෙළඳසැල් පිළිවෙලින් 03 ක් හා 02 ක් 2019 වර්ෂය සඳහා ටෙන්ඩර් ක්‍රියාවලියෙන් බැහැරව ගිවිසුම්ගතවීමකින් තොරව ලබාදී තිබූ අතර හා 2018 වර්ෂය සඳහා එම රු.8,473,590 ක හිඟ බදු මුදල් අයවී නොතිබියදී සභා තීරණයක් මත ඔවුන් වෙතම ලබාදී තිබුණි. තවද 2019 වර්ෂය සඳහා හිඟ බදු මුදල වූ රු.29,294,407 ක් අය වී නොතිබීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව බදු ලබාදීමට හා හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ නොගෙවීම නිසා කඩ මුද්‍රා තැබීමට තීරණයක් ලබා ගැනීම සඳහා 2022 පෙබරවාරි මස ගරු.මහා සභාවට යොමුකර ඇත. | මෙම මස්කඩ 2021 වසරේදී ටෙන්ඩර් කර ලබා දුන්නද ටෙන්ඩර් මුදල් ගෙවා නැත.මුදල් ගෙවන ලෙස ටෙන්ඩර්කරුවන්ට දැනුම් දුන්නද ඔවුන් කොවිඩ් වසංගතය නිසා කඩ වසා තැබීමට සිදු වූ බවත් ආදායම් උපයා ගැනීමට නොහැකි වූ බවත් දන්වා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ස්ටාටන් එස්ටේට් ඉඩම කට්ටි කර විකිණීමේදි අක්කර 10 ක භූමි ප්‍රමාණයක් පොදු කටයුතු සඳහා වෙන්වී තිබුණද 1986 ප්‍රාදේශීය සභාව පිහිටුවීමේදී එම පොදු ඉඩම පවරා ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් එය බාහිර පාර්ශවයන් විසින් අත්පත් කර ගෙන තිබුණි.මේ වන විට පෞද්ගලික ආයතනයක් විසින් භුක්ති විදින මෙම ඉඩමෙන් පර්චස් 69 ක් ප්‍රාදේශීය සභාවට පවරා දීමට එකඟ වී තිබුණද එම බිම් ප්‍රමාණය හෝ පවරා ගෙන නොතිබුණි. | ප්‍රාදේශීය සභාවට හිමිවිය යුතු ඉඩම්වල අයිතිය තහවුරු කර ගැනීමට කඩිනමින් පියවර ගත යුතුවේ. | වර්තමානයේ පොදු පහසුකම් ඉඩම් ඔප්පු මගින් පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කෙරේ. | ඒ අනුව මෙම ඔප්පුව එම ආයතනය මගින් ලබා ගැනීමට කටයුතු කර නැත. |
| (ඉ) | කුඩහකපොල බහු කාර්ය ගොඩනැගිල්ල ඉදි කිරීම රු.8,400,000 ක ඇස්තමේන්තුවක් මත රු.7,215,474 ක මුදලකට 1999 දෙසැම්බර් 10 දින ගිවිසුම්ගතව අත්තිවාරම පමණක් ඉදි කර 2000 දෙසැම්බර් 20 වන විට රු.2,775,657 ක බිල්පත් ඉදිරිපත් කර තිබුණි. ගම්පහ ප්‍රාදේශීය ඉංජිනේරු නිර්දේශ කර තිබූ මුළු කළ වැඩ ප්‍රමාණය මත රු.402,291 ක් 2006 මැයි 02 දින ගෙවා තිබුණි. මේ සඳහා 1999 වර්ෂයේ ජනාධිපතිතුමිය වෙන් කළ ලක්ෂ 25 ක මුදල වැය නොකිරීම නිසා ආපසු හරවා යවා නැවත 2000 වර්ෂයේදී ගම්පහ නගර සංවර්ධන වැඩ සටහන යටතේ රු.ලක්ෂ 25 ක මුදලක් ජාඇල ප්‍රාදේශීය ලේකම් වෙත නිදහස් කර තිබුණද සභාව විසින් කාර්ය නිම නොකොට සාවද්‍ය ලෙස වවුචර ඉදිරිපත් කර තිබීම නිසා ප්‍රතිපාදන නිදහස් නොකරන ලෙස බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් විසින් ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා තිබුණි. එම මුදල් වැය නොකිරීමේ වගකීම ප්‍රාදේශීය සභාවේ සභාපති දැරිය යුතු බවත් නැවත ප්‍රතිපාදන වෙන් කිරීමට අපහසු බව වැඩිදුරටත් දන්වා තිබුණි. බිල් පත | සභාවට වූ පාඩුව වගකිව යුතු පාර්ශ්වයන්ගෙන් අය කර ගැනීමට පියවර ගත යුතුවේ. | මේ සම්බන්ධව වගකිවයුතු පාර්ශවයන් හදුනා ගැනීමට පරික්ෂණයක් සිදුකර දෙන ලෙසට පළාත් පාලන සහකාර කොමසාරිස් (ගම්පහ) වෙත ලිඛිතව ඉල්ලීම් කරඇත. | මෙම විගණන ඡේදයට අදාල කරුණු පිළිගෙන ඇති අතර සභාවට සිදු වූ පාඩුවට වගකිවයුතු අය හදුනා ගැනීමට අදාල කටයුතු සිදු කිරීම සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත යොමුකර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | නොගෙවීමේ ගැටළුව මත අදාල කොන්ත්‍රාත්කරු විසින් අංක HC/ARB/2516/10 යටතේ පවරා තිබූ නඩුව පරාජයට පත්වීම හේතුවෙන් නඩු ගාස්තු හා ගෙවිය යුතු මුදල වන රු.2,903,319 ක් අදාල කොන්ත්‍රාත්කරුට ගෙවන ලෙස දුන් අධිකරණ නියෝගයට අනුව රු.967,773 බැගින් වාරික 03 කින් 2012 හා 2013 වර්ෂවල ගෙවීම් කර තිබුණි. 2005 නොවැම්බර් 30 දින වන විට ඉදි කර තිබූ අත්තිවාරම කඩා ඉවත් කර තිබූ අතර මෙම කාර්ය නිසා සභාවට රු.2,903,319 ක පාඩුවක් සිදුව තිබුණි. | | | |
| (ඊ) | කණුවන සමගි මාවත 1 වන පටුමග සංවර්ධනය කිරීමේ 1 වන අදියර සඳහා පිළිවෙලින් රු.3,866,537 ක් හා රු.2,228,787 ක් ගෙවීම් කර තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.1 හා 2.4.1 ප්‍රකාරව මේ සඳහා ජාතික වශයෙන් ලංසු කැඳවීමක් සිදු කර ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික ඇගයීම් කමිටු මගින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කර නොතිබුණි. මේ සඳහා ලංසු සුරක්ෂණය, කොන්ත්‍රාත්කරුට අවසාන මුදල් ගෙවූ දින වන 2020 මාර්තු 27 දිනෙන් පසු 2020 මැයි 18 දින 2020 මාර්තු 08 දින යෙදූ චෙක්පතක් ලැබී තිබුණි. මීටර් 0.225 ක් උසට ඝන මීටර් 235 ක රෙඩි මික්ස් කොන්ක්‍රීට් යෙදූ බවට ගෙවීම් කර තිබුණද 2020 ජුනි 12 දින විගණනය විසින් ලබාගත් කොන්ක්‍රීට් හරස් කැපුම් 04 ක සාමාන්‍ය උස මීටර් 0.191 ක් විය. ඒ අනුව ගණනය කිරීමේදී යොදා තිබූ කොන්ක්‍රීට් ප්‍රමාණය ඝන මීටර් 200.28 ක් වුවද ඝන මීටර් 33.72 කට වැඩිපුර ගෙවූ | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධි විධාන අනුව කටයුතු කළ යුතුවේ.<br><br>නියමිත ප්‍රමිතියට අනුව ව්‍යාපෘතිය නිම කළ යුතුවේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කිරීමට අදාල උපදෙස් ලබා දී ඇති බව දන්වා ඇත.<br><br>ඇස්තමේන්තු විධිමත්ව සකස් කිරීම සම්බන්ධව තාක්ෂණ නිලධාරීන් දැනුවත් කර ඇති අතර අධීක්ෂණ කටයුතු සඳහා වැඩ අධිකාරී වෙත උපදෙස් ලබා දී ඇති බව දන්වා ඇත. | මෙම කාලසීමාව තුල චෙක්පත් බැංකුගත කිරීමේදී යම් ප්‍රමාදයක් සිදුව ඇති බව පිළිගෙන ඇති අතර ඒ සඳහා කොවිඩ් වසංගත තත්වය යම් බලපෑමක්ව පැවතීම හේතුවෙන් නිලධාරීන්ගේ පැමිණීම අඩාල වීමෙන් එය සිදුව ඇති බවද දන්වමි.<br><br>වැඩිපුර ගෙවා ඇති මුදලින් රු.487,716 ක් පමණක් අය කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | මුදල රු.565,148 ක් විය. 02 වන අදියරේ වූ මාර්ගයේ එක් කොටසක් වන දිග මීටර් 35 ක්, 1 වන අදියරේදී කොන්ක්‍රීට් කර තිබූ බැවින් 2 වන අදියරේදී රු.949,539 ක් වැඩිපුර ගෙවා තිබුණි. | | | |

## 56. කටාන ප්‍රාදේශීය සභාව

| | | | | |
|---|---|---|---|---|
| (අ) | අක්කරපනහ, සම්පත් පෙදෙස පිහිටි පර්චස් 17.5 ක ඉඩම් කොටසක් පොදු පහසුකම් සඳහා සභාවට පැවරී වර්ෂ 25 ක් ගතව තිබුණද ආරක්ෂා කර ගැනීමට කටයුතු නොකිරීම නිසා එම ඉඩමේ දැවයෙන් හා බ්ලොක් ගලින් නිමවූ කුඩා ප්‍රමාණයේ නිවාස 02 ක් අනවසරයෙන් ඉදිකර භාවිතා කරමින් පැවතුණි. | සභාව සතු දේපල ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සභාව සතු ඉඩම් ආරක්ෂා කිරීම සඳහා සෑම වසරකම ප්‍රතිපාදන වෙන්කර අවශ්‍ය වූ විට මිනින්දෝරු සටහන් ද සහිතව කම්බි ගැසීමට කටයුතු කර ඇති බව දන්වා ඇත. | මීගමු මහේස්ත්‍රාත් අධිකරණයේ පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් නඩු කටයුත්තක් ගොනුකර සන්තකය පවරා ගැනිමට අධිකරණ ක්‍රියාමාර්ගයකට යොමු වී තිබේ. |
| (ආ) | කොන්දගම්මුල්ල ප්‍රදේශයේ පිහිටි පර්චස් 40 ක බිම් ප්‍රමාණයක් ඉදිකිරීම් ද්‍රව්‍ය සැපයීමේ ව්‍යාපාරයක් පැවැත්වීම සඳහා ව්‍යාපාරිකයෙකුගේ ඉල්ලීම මත රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව බදු දී තිබූ අතර මාසික බදු කුලිය රු.2,000 ක් ලෙස ගිවිසුම් ගත වී තිබුණි. ඒ සඳහා උපයෝගි කර ගත් පදනම අනාවරණය නොවූ අතර බදු කාල සීමාව, 2019 නොවැම්බර් 15 දින සිට 2020 නොවැම්බර් 14 දක්වා තවත් වර්ෂයකින් දීර්ඝ කර තිබුණි. | බදු දීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කළ යුතුවේ. | ගොනුව පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයෙන් ලද පසු සන්තකය පවරා ගැනීමට කටයුතු කිරීමට නියමිතය. | ලිපි ගොනුව විමර්ශන නිලධාරීන් විසින් විමර්ශන කටයුත්තක් සඳහා රැගෙන ගොස් ඇති හෙයින් ලිපි ගොනුව ලද වහාම ඉඩමේ සන්තකය ආපසු ලබා ගැනීම සඳහා අවශ්‍ය නීතිමය කටයුතු ඉදිරියේ දී සිදු කරනු ලබන බව දන්වා ඇත. |

## 57. මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව

| | | | |
|---|---|---|---|
| ජාපාලවත්ත කර්මාන්ත පුරයේ වානේ සෙවිලි කළ මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්ත ශාලාවක වරිපනම් තක්සේරුව සම්බන්ධයෙන් ව්‍යාපාරික ආයතනය විසින් නඩු කටයුත්තකට ගොස් තිබූ අතර එහිදී උසාවිය විසින් සංශෝධිත තක්සේරුව ස්ථිර කර තිබුණද 2018 දෙසැම්බර් 31දිනට වූ රු 557,600.ක අයවිය යුතු හිඟ වරිපනම් මුදල අය කර ගැනීම සම්බන්ධයෙන් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | වරිපනම් හිඟ අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. | අදාළ හිඟ මුදල ගෙවන ලෙස දැනුම් දී ඇතත් මේ වන තෙක් අදාළ ආයතනයේ ව්‍යාපාර කටයුතු ආරම්භ කර නැති අතර හිඟ මුදල් ගෙවන බවටත් පොරොන්දු වී ඇත. | නිකුත් කර ඇති රතු නිවේදනයේ ප්‍රතිඵලයක් ලෙස හිඟ මුදල් ගෙවීමට අදාළ ආයතනය එකඟ වූ අතර 2019 නොවැම්බර් 19 දින රු.100,000 ක මුදලක් ගෙවන ලද අතර ඉදිරියේදී හිඟ අය කර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. |

## 58. බියගම ප්‍රාදේශීය සභාව

| | | | |
|---|---|---|---|
| කඩවත උප කාර්යාලයේ නඩු කටයුතු පවතින කඩ කාමර 6 කින් 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු කඩ කුලි ශේෂය රු.6,959,107 ක් විය. | හිඟ මුදල් අයකරගැනීමට කටයුතු කළයුතු වේ. | කඩකාමරවලට අදාලව නඩුවක් පවතින බැවින් එම කඩ 6 ක හිග මුදල් අයකරගත නොහැකිව බිල් වෙමින් පවතී. | කඩකාමරවලට අදාලව නඩුවක් පවතින බැවින් එම කඩ 6 ක හිග මුදල් අයකරගත නොහැකිව බිල් වෙමින් පවතී. |

## 59. අත්තනගල්ල ප්‍රාදේශීය සභාව

| | | | | |
|---|---|---|---|---|
| (අ) | වේයන්ගොඩ උපකාර්යාලයට අයත් කඩකාමර 23 කින් අයවිය යුතු වර්ෂ 10 කට වඩා පැරණි රු.3, 276,363 ක් වූ පෙර මුදල් ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කඩ කාමර බදු දීමට පථම නිත්‍යානුකූලව ගිවිසුමකට එළඹිය යුතු වේ. | මෙම පෙර මුදල් නොගෙවූ කඩ කාමර හිමියන් සඳහා නීතිමය කටයුතු කිරීමට නොහැකි වන්නේ විධිමත් ගිවිසුමක් නොමැතිවීම මතය. වර්තමානයේ ඔවුන් නව ගිවිසුමකට ඇතුලත් කර | කඩ 05 ක් වර්ෂ 10 වැඩි කඩ කුලි නොගෙවීම හේතුවෙන් මුද්‍රා තබා සභාවට පවරාගෙන ඇත. කාමර 18 හි හිමිකරුවන් කඩකුලි |

| | | | | |
|---|---|---|---|---|
| | | | ගැනීමට සාකච්ඡා පැවැත් වුවද එම වෙළඳපලේ භෞතික සැලැස්මේ ඇති දෝෂවල ඇති ගැටළු නිසා එම උත්සහයද අසාර්ථක වී ඇත. උක්ත පෙර මුදල් කපා හැරීම සඳහා සභාවට ඉදිරිපත් කර ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කිරීමට කටයුතු කරමින් පවතී. | ගෙවමින් පවතී. එම මුද්‍රා තැබූ කඩ කාමර 05 හි පෙර මුදල් හිඟය රු.661,414.98 කි. කඩ හිමියන් කඩ කුලී ගෙවමින් සිටියත් ගිවිසුම්ගත වීම ප්‍රතික්ෂේප කරයි. ඊට හේතුව වන්නේ වෙළඳාමට අවශ්‍ය පසු බිම එනම් ජලය, ප්‍රවේශ මාර්ගයක්, රථ ගාලක් නොමැති වීමය. සැලසුමට පටහැනිව ඉදිකිරීම සිදු කර ඇත. |
| (ආ) | අංක 39/380 දරන ඉඩම් නඩුව සම්බන්ධව සභාව ක්‍රියාකර ඇති ආකාරය අවිධිමත් හා නොසලකිලිමත්වීම හේතුවෙන් සභා අරමුදලින් පැමිණිලිකරුට 2019 මැයි 16 දින රු.1,876,800 ක් ගෙවා තිබුණි. 2021 අප්‍රේල් 10 | හැකි ඉක්මණින් පරීක්ෂණ වාර්තාව ලබාගෙන පාඩුව අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | 1996 වර්ෂයේ සිදු වූ මාර්ගයක ආරවුලක් වෙනුවෙන් 39/380 දරන ඉඩම් නඩුවට අදාලව උසාවි තීන්දුව ක්‍රියාත්මක කිරීමට සිදුවිය. ඒ අනුව 2019 | පරීක්ෂණ වාර්තාව ලබා ගැනීම සඳහා සහකාර කොමසාරිස් කාර්යාලය වෙත සිහි කැඳවීම් යවා |

| | | | | |
|---|---|---|---|---|
| | දින වන විටත් වගකීම් නිශ්චය කරන පරීක්ෂණයක් සිදුකර සභාවට වූ පාඩුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | මැයි මස 16 දින ගෙවන ලද රු.1,876,800 ක මුදල පියවා ගැනීමට එහි වගකීම් නිශ්චය කිරීමට පරීක්ෂණයක් සිදු කිරීම සඳහා සහකාර කොමසාරිස් කාර්යාලය වෙත ලබා දී ඇත. එම වාර්තාව ලබාගැනීම සඳහා සිහිකැඳවීම් යවා ඇත. | ඇතත් මෙතෙක් පිළිතුරු ලැබී නොමැත. |
| **60.** | **බේරුවල ප්‍රාදේශිය සභාව** | | | |
| | රාජ්‍ය නොවන සංවිධානයක මුදල් ආධාරයෙන් 2013 වර්ෂයේදී අළුත්ගම සති පොළ පවතින ස්ථානයේ නවීකරණය කළ කඩ කාමර 38 කින් විවෘත කර තිබුණේ කඩ කාමර 03 ක් පමණි. මාර්ගයට විවෘත වන සේ සැලසුම් කර නොතිබීමෙන් කඩ කාමර බදු දීමට නොහැකි වී තිබුණි. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදි කරනු ලබන ඉදි කිරිම් සඳහා නිසි පරිදි සැලසුම් කර ඉදි කිරිම් කටයුතු සිදු කරමි. | දැනට කඩ කාමර 08 ක් බදුදී ඇති අතර ඉතිරි කඩ කාමර 30 බදු දීමට නොහැකි වී ඇත. |
| **61.** | **දොඩන්ගොඩ ප්‍රාදේශිය සභාව** | | | |
| | ඉඩම් වෙන්දේසියක් මගින් 2000 වර්ෂයේ පොදු කටයුතු සඳහා ලැබි තිබූ රූඩ් 03 පර්චස් 14 ක ඉඩමෙන් කොටසක අනවසර පදිංචිකරුවන් විසින් ස්ථිර නිවාස 02 ක් ඉදිකර පදිංචි වී තිබුණි. | අනවසර පදිංචිකරුවන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුවේ. | වසර ගණනාවක සිට පදිංචිව ඇති බැවින් ස්ථානීය පරික්ෂණවක් සිදු කර ඉදිරියේදී ඒ සම්බන්ධව කටයුතු කරමි. | මේ දක්වා අනවසර පදිංචිකරුවන් ඉවත් කර නොතිබුණි. |

## 62. බුලත්සිංහල ප්‍රාදේශීය සභාව

| | | | |
|---|---|---|---|
| පුද්ගලික සමාගමක් විසින් සභාවට එරෙහිව ගොනු කළ නඩුවේ මුල් අවස්ථාවේදී වාසිදායක තීන්දුවක් ලැබී පසුව අදාළ සමාගම විසින් කරන ලද අභියාචනයෙන් පසු සභාව විසින් අදාළ නඩුව නොසලකා හැරීම තුලින් සභාවට අවාසිදායක තීන්දුවක් ලැබීම නිසා එකී සමාගම වෙත වන්දි ලෙස රු.7,840,000 ක් ගෙවීමට සිදුවී තිබුණි. | සභා අරමුදලින් දරන ලද වියදම වගකිව යුතු නිලධාරින්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මේ කරුණ සම්බන්ධව විමර්ශනයක් පළාත් පාලන කොමසාරිස් වෙතින් ඉල්ලා ලිපියක් යොමු කර ඇත. | වර්තමානය වන විටත් ගැටළුව අවසන් වී නොතිබුණි. |

## 63. මදුරාවල ප්‍රාදේශිය සභාව

| | | | |
|---|---|---|---|
| සභාව සතු කැබ් රථයකට 2016 වර්ෂයේදී සිදු වු රිය අනතුරට අදාලව දෙහිවල ගල්කිස්ස යාන්ත්‍රික ඉංජිනේරුවරයා විසින් තක්සේරු කරන ලද මූල්‍ය හානිය රු.1,134,037 ක් එයට වගකිව යුතු අයගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුල්‍ය හානියට වගකිව යුතු අයගෙන් අය කල යුතුය. | පළාත් පාලන කොමසාරිස්ගෙන් උපදෙස් ඉල්ලා ඇති අතර උපදෙස් ලැබුණු පසු ඉදිරි කටයුතු කරමි. | කිසිදු පරීක්ෂණයක් මේ දක්වා සිදුකර නොතිබුණි. |

**64. හෝමාගම ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| මීගොඩ ආර්ථික මධ්‍යස්ථාන භාරකාර මණ්ඩලය වෙත රු.300,000 වාර්ෂික බදු කුලියකට පවරා තිබූ අක්කර 01 රූඩ් 02 පර්චස් 10 ක වපසරයකින් යුත් ඉඩම් කොටස සඳහා 2013 වර්ෂයේදී කර තිබූ රු.900,000 ක් වූ නව තක්සේරු මුදල නොලැබීම හේතුවෙන් 2014 සිට 2018 දක්වා වර්ෂ වෙනුවෙන් ලැබිය යුතු හිඟ බදු මුදල හා දඩ මුදල රු.14,750,000 ක් විය. මේ සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ආදායම් නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම හිඟ මුදල් ගෙවන ලෙස දන්වා මීගොඩ ආර්ථික මධ්‍යස්ථානයේ භාරකාර මණ්ඩලයේ සාමාජිකයන් වෙත 2020.12.28 දිනැතිව සහ නීතිඥතුමිය මගින් එන්තරවාසි ලිපි යොමු කරන ලද නමුත් මෙතෙක් ඊට ප්‍රතිචාර දක්වා නොමැති බැවින් ඉදිරි පියවර වශයෙන් නඩු පැවරීමට කටයුතු කරනු ලැබේ. | මීගොඩ ආර්ථික මධ්‍යස්ථානයේ භාරකාර මණ්ඩලයේ මෙතෙක් සාමාජිකත්වය දැරූ සාමාජිකයන් වෙත 2020.12.28 දිනැතිව එන්තර වාසි ලිපි යවා ඇතත් එම සාමාජිකයින් නැවත වෙනස් වී ඇති බැවින් නව සාමාජිකයින් වෙත සහා නීතිඥතුමිය මගින් එන්තරවාසි ලිපි යැවීමට කටයුතු කරන බව සඳහන් කරමි. |

**65. පොතුවිල් ප්‍රාදේශීය සභාව**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කුලී රු.6,197,567 ක් වූ අතර මෙය වර්ෂ 1-20 දක්වා කාලපරිච්ඡේදයට අදාල වේ. | හිඟ කුලි අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අතහැරීමේ නියෝගය නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. | හිඟ කුලි අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | සභාවේ ආදායම් ඉහළ නැංවිම සහ රැකියා අවස්ථා ලබාදීමේ අරමුණින් 2008 වර්ෂයේ World Vision ආයතනයෙන් රු.1,231,600ක අරමුදල් සහ 2011 වර්ෂයේදී සභාවේ අරමුදල් රු.1,612,127ක් යොදවා ඉදිකළ ලිපිද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය භාවිතා නොකර විනාශයට පත්වෙමින් පැවැතුණි. | අදාල වත්කම් නියමිත අවශ්‍යතා සඳහා භාවිතා කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. | මෙම ලිපිද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය මෙහෙයවීමට සේවකයින්ට පුහුණුව ලබාදිය යුතුවේ. එසේම, ක්‍රියාත්මක කිරීම සඳහා විදුලිය එම මාර්ගයේ නොමැත. එහි සවිකර ඇති උපකරණත් වර්තමානයේ භාවිතා කළ නොහැකි ලෙස මල බැඳී අක්‍රිය වී ඇත. එම නිසා මේවා විකිණීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගනු ලැබේ. | වත්කම් අක්‍රියව පැවතුණි. |

**66. අඩ්ඩාලචේනයි ප්‍රාදේශීය සභාව**

| | | | | |
|---|---|---|---|---|
| | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ 2014 වර්ෂයේ සභාව විසින් රු.1,400,000ක පිරිවැයකින් ඉදිකළ කටු ඇඹරීමේ මධ්‍යස්ථානයට අධිබලැති විදුලිය සම්බන්ධතාවය ලබාගැනීමේ කාල ප්‍රමාදය හේතුවෙන් මෙම මධ්‍යස්ථානය නිෂ්කාර්යව පැවැතුණි. | කටු ඇඹරීමේ මධ්‍යස්ථානය කඩිනමින් භාවිතා කිරීමට පියවර ගත යුතුවේ. | කඩිනමින් මෙය භාවිතා කිරීමට පියවර ගනිමින් පවතී. | වත්කම් නිශ්කාර්යව පැවතුණි. |

**67.** **නින්දවූර් ප්‍රාදේශීය සභාව**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට හිඟ කුලී රු.3,173,466 ක් වූ අතර මෙය වර්ෂ 8 - 40 දක්වා කාලපරිච්ඡේදයකට අදාල වේ. | හිඟ කුලි කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙය අයකර ගැනීමට පියවර ගෙන ඇත. | හිඟ කුලි අයකර ගෙන නොතිබුණි. |
| (ආ) | විදුලි පහනක් රු.15,400 ක් බැගින් 328 ක් සහ විදුලි පහනක් රු.15,850 ක් බැගින් 72කුත් සවිකර තිබුණි. මෙම ගුණත්වයෙන්ම වූ විදුලි පහන් කාරෙයිතිවු ප්‍රාදේශීය සභාව විසින් රු.9,600 ක් බැගින් සවිකර තිබුණි. මේ අනුව සභාව විසින් රු.2,352,400 ක් අනාර්ථික ලෙස ගෙවීම් කර තිබුණි. | මිලදී ගැනීමේදි අනෙකුත් ආයතන සමග සැසදීම් කර ආර්ථික ලෙස සිදු කළ යුතුවේ. | අපගේ තාක්ෂණික නිලධාරීන් අප දිස්ත්‍රික්කයේ පවතින අදාල භාණ්ඩ තිබෙන කඩවලින් මිලගණන් විමසීමෙන් පසුව මෙම ඇස්තමේන්තු සකස් කර තිබුණි. | ආර්ථික ලෙස මිලදී ගෙන නොතිබුණි. |

**68.** **ආලෙයියඩිවේම්බු ප්‍රාදේශීය සභාව**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | වර්ෂ 05කට අධික කාලයක සිට නිෂ්කාර්යව/අක්‍රීයව පවතින එකතුව රු.2,365,914ක බැංකු ජංගම ගිණුම් 02ක ගිණුම් ශේෂ, ආදායම් ඉපැයිය හැකි මූලාශ්‍රවල යෙදවීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නිෂ්කාර්යව/අක්‍රීයව පවතින බැංකු ගිණුම් ශේෂ, ආදායම් ඉපැයිය හැකි මූලාශ්‍රවල යෙදවිය යුතුය. | මේ සඳහා ක්‍රියාමාර්ග මේ වන විට ගනිමින් පවතී. | ආදායම් ඉපැයිය හැකි මූලාශ්‍රවල යෙදවීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ආ) | පළාත් නිෂ්චිත සංවර්ධන ප්‍රදාන වැඩසටහන යටතේ 2016 වර්ෂයේ රු.1,253,940ක වියදමින් කන්නගිපුරම්හි කාබනික පොහොර සැකැසීමේ මධ්‍යස්ථානය ඉදිකර ඒ සඳහා 2018 වර්ෂයේ රු.1,210,000ක් වටිනා යන්ත්‍ර සවිකර තිබුණත්, එම මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීමට වර්ෂ | වත්කම් ඵලදායිව උපයෝජනය කළ යුතුය. | මහජන විරෝධතාවය හේතුවෙන් මෙම මධ්‍යස්ථානය ක්‍රියාත්මක කළ නොහැකිව පැවතුණි. | මධ්‍යස්ථානය ප්‍රයෝජනයට නොගෙන අතහැර දමා තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | දෙකකට අධික කාලයක සිට කිසිදු ක්‍රියාමාර්ගයක් සභාව විසින් ගෙන නොතිබුණි. | | | |
| (ඇ) | සමාගම් මාර්ගයේ සිට පනංකාඩු පාලම දක්වා මීටර 425ක් දුරට පානීය ජලය බෙදාහැරීමේ නළ එළීමේ වැඩසටහන වෙනුවෙන් 2017 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන වැඩසටහන යටතේ ප්‍රතිපාදිත මුදලින් රු.1,498,183ක් 2018 ජනවාරි 10 දින ජාතික ජලසම්පාදන හා මලාපවහන මණ්ඩලයට ගෙවීම් කර තිබුණි. නමුත් එම නළ එළීමේ කාර්යයන් විගණන දිනය වන 2021 නොවැම්බර් 17 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. | පානීය ජලනළ එළීමේ වැඩසටහන කඩිනමින් ආරම්භ කිරීමට පියවර ගත යුතුවේ. | ජාතික ජලසම්පාදන හා මලාපවහන මණ්ඩලය සමග සාකච්ඡා පවත්වා පානීය ජලනළ එළීම් සඳහා කටයුතු කරනු ලැබේ. | පානීය ජලනළ එළීම් කටයුතු සිදුකර නොතිබුණි. |

## 69. නාවිදන්වේලි ප්‍රාදේශීය සභාව

| | | | |
|---|---|---|---|
| අයකළ යුතු මස්කඩ හිඟ බදු සහ වෙළෙඳ පොල කඩකාමර හිඟ කුලී රු.1,379,930ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. ඒවා වර්ෂ 1 – 3 දක්වා කාල පරාසයට අදාල වේ. | අයකළ යුතු කුලි ආදායම් කඩිනමින් අයකිරිමට පියවර ගත යුතුවේ. | අයකිරීමට සහ කපාහැරීමට පියවර ගෙන ඇත. | කුලී ආදායම් අයකිරීමට පියවර ගෙන නොතිබුණි. |

**70. තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට හිඟ කුලී රු.2,556,847 ක් වූ අතර මෙය වර්ෂ 1-20 දක්වා කාලපරිච්ඡේදයට අදාල වේ. | කුලි ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙය අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ. | කුලි ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

**71. සමන්තුරේ ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| 2019 වර්ෂයේ සභාවේ භාවිතා කිරීම සඳහා මිලදී ගත් රු.2,407,500ක් වටිනා ඉලෙක්ට්‍රෝනික ප්‍රචාරක දැන්වීම් පුවරුව නියමිත තත්ත්වයෙන් සවිනොකර මාස 08ක කාලයක් නිෂ්කාර්යව පැවැතුණි. | ප්‍රචාරක දැන්වීම් පුවරුව කඩිනමින් භාවිතයට ගැනීමට පියවර ගත යුතුවේ. | ප්‍රචාරක පුවරුව සවි කළ ආයතනයට එය ක්‍රියාත්මක කිරීමට නොහැකිව පැවැතුණු අතර ඔවුන්ට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. | ප්‍රචාරක දැන්වීම් පුවරුව භාවිතයට ගැනීමට පියවර ගෙන නොතිබුණි. |

**72. කාරෙයිතීවු ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| ඊසාන වෙරළ තීරය ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ රු.14,347,200 ක වියදමින් ඉදිකර 2009 වර්ෂයේදී සභාවට භාරදී තිබූ කඩ කාමර සංකීර්ණයේ කඩකාමර 17ක් වර්ෂ 12 ක කාලයක සිට කුලියට දීමට සභාව විසින් පියවර ගෙන නොතිබුණි. | කඩකාමර කුලියට දිමට පියවර ගත යුතුවේ. | කඩකාමර කුලියට දිමට පියවර ගනු ලැබේ. | කඩකාමර කුලියට දිමට පියවර ගෙන නොතිබුණි. |

**73. දමන ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| වර්ෂ 08 කට වැඩි කාලයක් කඩ කුලී නොගෙවන කඩ කාමර 02 කින් අය විය යුතු රු.208,440 ක මුදල අයකර ගැනීමට හෝ නීතිමය කටයුතු සිදුකර කඩ කාමර පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කඩකුලී අයකර ගැනීමට හෝ කඩකාමර නැවත පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ගිවිසුම්වල ඇති අඩුපාඩු නිවැරදි කර ඒ සම්බන්ධව කටයුතු කරමි. | අයකර ගැනීමට හෝ නීතිමය කටයුතු සිදුකර කඩ කාමර පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 74. නාමල්ඔය ප්‍රාදේශීය සභාව

| | | | |
|---|---|---|---|
| සභාවට අයත් මුවංගල ග්‍රාම 07 වැව අසළ පොදු උද්‍යානය සංවර්ධනය කර හංස බෝට්ටු යෙදවීමේ ව්‍යාපෘතියට අදාලව 2019 හා 2020 වර්ෂවල වැව පිරිසිදු කිරීමට හංස බෝට්ටු 02 ක් හා උද්‍යාන පුටු 04 ක් සඳහා රු.1,323,500 ක් දරා තිබුණ ද අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. | ව්‍යාපෘතිය ක්‍රියාවට නංවා දරන ලද වියදමට සරිලන ලෙස ප්‍රතිලාභ ලබා ගත යුතු වේ. | 2020 වර්ෂයේ සිට පවතින කොවිඩ් වසංගය හේතුවෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. |

## 75. ඉරක්කාමම් ප්‍රාදේශීය සභාව

| | | | | |
|---|---|---|---|---|
| (අ) | පළාත් සඳහා වූ නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ 2015 වර්ෂයේදී රු.1,338,328ක පිරිවැයකින් ඉදි කළ සත්ව ඝාතකාගාරය ඒ ආසන්නයේ පිහිටි සුසාන භූමිය සැලකිල්ලට නොගෙන ඉදිකිරීම හේතුවෙන් මහජන විරෝධතාව මත මේ දක්වා භාවිතා නොකර පවතී. | අදාල අරමුණු සඳහා හෝ වෙනත් අවශ්‍යතා සඳහා ගොඩනැගිල්ල භාවිතා කිරීමට පියවර ගත යුතුවේ. | මෙම ඝාතකාගාරය වර්තමානයේ ඝන අපද්‍රව්‍ය ප්‍රති චක්‍රීකරණය කිරීම සඳහා භාවිතා කිරීමට සැලැසුම් කර ඇත. | ගොඩනැගිල්ල භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | UNDP වැඩසටහන යටතේ රු. මිලියන 4.975ක වියදමින් 2017 වර්ෂයේ ඉදිකළ මහජන වෙළෙඳ පොලෙහි ඉහළ කොටස 2020 මැයි 28 දින වන විටත් භාවිතයකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | වත්කම් ඵලදායිව භාවිතා කළ යුතුය. | 2020 PSDG වැඩසටහන යටතේ වෙනස්කම් සිදුකර කුලියට දීමට සුදුසු පරිදි වෙනස් කිරීමට යෝජනා ඉදිරිපත් කර ඇත. | වෙළඳපොළ භාවිතයට ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ සංවර්ධන මූල්‍ය වැඩසටහන යටතේ රු. මිලියන 4.690ක වියදමින් 2018 වර්ෂයේ ඉදිකළ කඩකාමර සංකීර්ණය 2020 මැයි 28 දින වන විටත්අදාල අරමුණ සඳහා භාවිතා නොකර නිෂ්කාර්යව පැවැතුණි. | කඩකාමර සංකීර්ණය භාවිතා කිරීමට පියවර ගත යුතුය. | මෙම කඩකාමර සංකීර්ණය කුලියට දීම සඳහා විවිධ බැංකු වෙත ගොස් තිබූ අතර මහජන බැංකුව එහි ශාඛාව මාරු කිරීමට කැමැත්ත පල කර මෙම කඩකාමර සංකීර්ණය ඉතාමත් අඩු වටිනාකමට ඉල්ලුම් කිරීම නිසා මෙය ලබානොදී තිබුණි. | කඩකාමර සංකීර්ණය භාවිතා කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

## 76. වෙරුගල් ප්‍රාදේශීය සභාව

| | | | |
|---|---|---|---|
| සභාවට අයත් විවෘත වෙළඳ පොළ ගොඩනැගිලි 02 ක් සහ රු.2,272,800 ක් වටිනා කඩකාමර 07 ක් සහ රු.1,483,472 ක් වටිනාකමැති කර්මාන්ත ශාලා ගොඩනැගිල්ල 2004 වර්ෂයේ සිට උපයෝජනය නොකර 2020 දෙසැම්බර් 31 වන විටත් නිශ්කාර්යව පැවතුණි. | වත්කම් ඵලදායීව උපයෝජනය කළ යුතුය. | වෙළඳ පොළ ගොඩනැගිලි සහ ICE කර්මාන්ත ශාලාව ප්‍රතිසංස්කරණය කිරීම පිළිබඳ සාකච්ඡා කරමින් පවතී. | ගොඩනැගිලි භාවිතයට ගෙන නොතිබුණි. |

**77. තඹලගමුව ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| සභා බල ප්‍රදේශයේ පවතින මස් කඩවලින් හිඟ බදු ආදායම් රු.395,255 ක් 2020 දෙසැම්බර් 31 දින වන විටත් අය කිරීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කුලී අයකිරීමට කටයුතු කළ යුතුවේ. | අයකිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගෙන ඇත. | හිඟ කුලී අයකරගෙන නොතිබුණි. |

**78. ත්‍රිකුණාමලය නගර හා කඩවත් සතර ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| වෙළඳ පොල කුලී හිඟ ආදායම් රු.1,188,570 ක් අඛණ්ඩව වර්ෂ 05 කට අධික කාලයක සිට ගිණුම්වල ඉදිරිපත් කර තිබූ අතර 2020 දෙසැම්බර් 31 දින වන විටත් හිඟ මුදල් අය කිරීමට හෝ කපා හැරීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කුලී අයකර ගත යුතුවේ. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | හිඟ මුදල් අයකර ගෙන නොතිබුණි. |

**79. මූතූර් ප්‍රාදේශීය සභාව**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | 2014 සිට 2019 දක්වා අයකර ගතයුතු රු.922,250 ක බස් නැවතුම් පොළේ කඩ කුලිය 2020 වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කඩකුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ . | හිඟ කුලී කොටස් වශයෙන් අයකර ගනිමින් පවතින අතර ගෙවීම් නොකළ අයට එරෙහි නීතිමය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | වෙළඳපොළ කඩ කුලී හිඟ රු.506,000 ක් 2020 දෙසැම්බර් 31 වන විට අයකර නොතිබුණි. | හිඟ කුලී අයකිරීමට කටයුතු කළ යුතුවේ. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු සිදු කරන අතර හිඟ කුලී පැහැර හරින්නන්ට | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර නීතිමය |

| | | | | |
|---|---|---|---|---|
| | | | එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවත් දන්වමි. | ක්‍රියාමාර්ගයද ගෙන නොතිබුණි. |
| (ඇ) | වල්ලිකේනි ප්‍රධාන මාර්ගය ඉදිකිරිම සඳහා ප්‍රජා මූල සංවිධානයකට රු.1,926,960 ක කොන්ත්‍රාත්තුවක් 2017 වර්ෂයේදී ලබාදී තිබූ නමුත් 2020 වර්ෂය අවසන් වන විට මෙම කොන්ත්‍රාත්තුව අතරමග නවතා දමා තිබුණි. | කොන්ත්‍රාත් කටයුතු මනා අධීක්ෂණයකින් කාලීනව ඉටු කළ යුතුය. | මාර්ගයේ ඉදිරි වැඩ කඩිනමින් සිදු කර නිම කරනු ලැබේ. | ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි. |
| (ඈ) | පළාත් නිශ්චිත සංවර්ධන මූලා ප්‍රතිපාදන යටතේ රු.1,115,226 ක වියදමින් 2016 දෙසැම්බර් 07 දින ඉදි කළ ගෑස් වායු ගොඩනැගිල්ල 2020 දෙසැම්බර් 31 වන විටත් නිෂ්පාදන කටයුතු සඳහා භාවිතයට ගෙන නොතිබුණි. | වත්කම් ඵලදායීව උපයෝජනය කළ යුතුය. | සභාවට අයත් ගව සාතකාගාරය පරීක්ෂා කොට ඉන් ජීව වායු නිෂ්පාදනය කරන බව සහතික කර ලිපි මඟින් ලබා දී තිබුණි. එය භාවිතා කිරිමට ඉක්මණින් කටයුතු සිදු කෙරේ. | ගොඩනැගිල්ල භාවිතයට ගෙන නොතිබුණි. |
| (ඉ) | සාම්පූර් ප්‍රදේශයේ පුරනැගුම ව්‍යාපෘතියේ මූලා ප්‍රතිපාදන යටතේ රු.4,094,702 ක වියදමින් 2017 වර්ෂයේදී ඉදි කළ මාතෘ | වත්කම් ඵලදායීව උපයෝජනය කළ යුතුය. | මධ්‍යස්ථානය නඩත්තුකිරීම සඳහා සේවක හිඟයක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී | මධ්‍යස්ථානය භාවිතයට ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ළදරු රැකබලා ගැනීමේ මධ්‍යස්ථානය අදාළ අවශ්‍යතාවය සඳහා භාවිතා නොකර ප්‍රජා මධ්‍යස්ථානයට ලබා දී තිබුණි. | | කාර්යාලයේ පවතින බැවින් මෙම මධ්‍යස්ථානය ක්‍රියාත්මක කළ නොහැකි විය. | |

**80. මොරවැව ප්‍රාදේශීය සභාව**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | 2011 වර්ෂයේ සිට පැවත එන රු.7,864,759 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය නිරවුල් කිරීමට කටයුතු නොකර එම වටිනාකම 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ සමුච්චිත අරමුදල හා සංචිත යටතේ දක්වා තිබුණි. | අවිනිශ්චිත ගිණුම නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | එම ශේෂය ඉවත් කරගැනීම පිළිබඳව කටයුතු කෙරෙමින් පවතී. | අවිනිශ්චිත ගිණුම නිරවුල් කර නොතිබුණි. |
| (ආ) | 2017 වර්ෂයේ අත්තිකාරම් ලෙස ලබා දී තිබූ රු.1,826,485 ක් 2020 වර්ෂය අවසන් වන විටත් නිරවුල් කර නොතිබුණි. | අත්තිකාරම් ශේෂ කාලීනව නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු යොදා ඇත. | අත්තිකාරම් මුදල් නිරවුල් කර නොතිබුණි. |
| (ඇ) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නළ ළිං 15 ක් 2019 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කර 2020 දෙසැම්බර් 15 දින වන විට රු.1,426,528 ක් ගෙවා තිබූ නමුත් 2020.12.31 දින වන විටත් නළ ළිං 15 භාවිතයට ගත හැකි වන පරිදි වැඩ අවසන් කර නොතිබුණි. | කඩිනමින් ව්‍යාපෘතියෙහි වැඩ නිම කර අදාළ වත්කම් භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. | ළිං කිහිපයකට මේ වන විට මෝටර් සවිකර ජලය ලබාගැනීමට හැකි පරිදි සකස් කර ඇත. | නල ළිංවල වැඩ අවසන් කර නොතිබුණි. |

**81. කුච්චවේලි ප්‍රාදේශීය සභාව**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | 2020 වර්ෂය අවසානයට වර්ෂ 10 ක් ඉක්ම වූ රු.1,108,043 ක් වූ හිඟ වරිපනම් බදු, ව්‍යාපාර බදු හා අක්කර බදු ආදායම් අයකර නොතිබුණි. | අදාළ ලේඛන සොයා අඩුපාඩු නිවැරදි කළ යුතුය. | හිඟ වරිපනම් බදු, ව්‍යාපාර බදු හා අක්කර බදු තොරතුරු සහ ලේඛන නොමැත. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2020 වර්ෂය අවසානයට වර්ෂ 10 ක් ඉක්ම වූ රු.1,648,791 ක් වූ හිඟ කුලී සහ මස්කඩ කුලී ආදායම් අයකර නොතිබුණි. | අදාළ ලේඛන සොයා අඩුපාඩු නිවැරදි කළ යුතුය. | හිඟ කුලී, මස් කඩ කුලී තොරතුරු සහ ලේඛන නොමැත. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | මධ්‍යම පරිසර අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරන පිළිසරු ව්‍යාපෘතිය මඟින් නිලාවේලිහි රු.17,943,879 ක වියදමින් අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයක් ඉදිකර 2016 මාර්තු 26 ප්‍රාදේශීය සභාව වෙත භාර දී තිබුණත් 2020 වර්ෂය අවසන් වන තෙක් එහි පොහොර නිෂ්පාදන ක්‍රියාවලියක් සිදු වී නොතිබුණි. | වත්කම් ඵලදායීව උපයෝජනය කළ යුතුය . | අදාළ ස්ථානයේ ලුණු වතුර පවතින බැවින් එම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකිව තිබුණි . | පොහොර නිෂ්පාදන ක්‍රියාවලිය සිදුවී නොතිබුණි. |
| (ඈ) | ප්‍රාදේශීය සභාව විසින් පුල්මුඩේවල රු.24,444,588 ක වියදමින් කඩ කාමර 35 ක් සහිත වෙළඳපොල ගොඩනැගිල්ල පුල්මුඩේ වැවේ පස් පුරවා ඉදි කළ බැවින් මධ්‍යම පරිසර අධිකාරිය සහ වරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය | වත්කම් ඵලදායීව උපයෝජනය කළ යුතුය. | කඩකාමර භාවිතයට ගැනීමට කටයුතු කරනු ලැබේ. | කඩකාමර භාවිතයට ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ලබාදීම ප්‍රතික්ෂේප කර තිබුණි. තවද, මෙම කඩකාමර ඉදිකිරීමට ප්‍රථම වෙළඳාම සඳහා සුදුසු ඉඩමක්ද යන්න පරීක්ෂා නොකර කඩ කාමර ඉදිකර තිබුණි. එබැවින්, එම කඩකාමර ඉදි කළ දිනයේ සිට 2020 දෙසැම්බර් 31 දින වන විටත් භාවිතයට නොගෙන වර්ෂය අවසන් වන විටත් නිශ්කාර්යව පැවතුණි. | | | |
| **82.** | **කින්නියා ප්‍රාදේශීය සභාව** | | | |
| (අ) | මස් කඩ බදුකරුවන් බදු මුදල් ගෙවීම් පැහැර හැරීම් ඔවුන්ගේ ඇප තැන්පතුවලින් අයකර නොගැනීම නිසා 2020 වර්ෂය අවසානයේදී පැවති හිඟ මුදල රු.6,486,417 ක් විය. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධයෙන් පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගේ උපදෙස් ලබා කටයුතු කරනු ලැබේ. | හිඟ මුදල් අය කර ගෙන නොතිබුණි. |
| (ආ) | පුර නැගුම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ රු.21,510,853 ක පිරිවැයකට 2014 වර්ෂයේ ඉදි කළ පොදු වෙළඳපොල ගොඩනැගිලි සංකීර්ණයේ කඩකාමර 36 ක් සහ විවෘත කඩකාමර 32 ක් කින්නියා ප්‍රාදේශීය සභාව විසින් සතිපොළ කටයුතු සඳහා කඩයකින් රු.30,000 ක් ද විවෘත කඩකාමරයකින් රු.20,000 ක් ද වශයෙන් එකතුව | ආපසු ගෙවන තැන්පතු සම්පූර්ණයෙන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධයෙන් සභාව විසින් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | තැන්පතු මුදල් අයකර ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | රු.1,720,000 ක් ආපසු ගෙවන තැන්පතු වශයෙන් අය කළයුතුය. එසේ වුවත්, 2020 වර්ෂය අවසාන වන විට රු.593,000 ක් පමණක් සභාව අයකර ගෙන තිබුණි. | | | |
| (ඇ) | 2020 වර්ෂය අවසානයට වූ රු.7,284,748 ක හිඟ බදුවලින් රු.7,273,841 ක් වර්ෂ 10 කට පෙර කාලයකට අදාළ විය. | හිඟ මුදල් අයකිරීමට සුදුසු පියවර ගත යුතුවේ. | ඉදිරියේදී මෙම කරුණ පිළිබඳ අවධානය යොමුකර කටයුතු කරනු ලැබේ. | හිඟ මුදල් අයකර ගෙන නොතිබුණි. |
| (ඈ) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ උප්පාරු ප්‍රදේශයේ සංචාරකයින්ගේ සුභසාධනය පිණිස මහජන වැසිකිළියක් රු.1,000,000 ක පිරිවැයකට ඉදිකර, කොන්ත්‍රාත්කරු විසින් 2016 දෙසැම්බර් 31 දින භාරදෙනු ලැබූ නමුත් 2020 වර්ෂය අවසාන වන විටත් භාවිතයෙන් තොරව නිෂ්කාර්යව පැවතිණි. මෙම ගොඩනැගිල්ල එම ප්‍රදේශයේ ආගමික ස්ථානයක මායිමේ ඉදිකර තිබුණි. මෙලෙස ඉදි කළ ගොඩනැගිල්ලෙහි අයිතිය පිළිබඳව විධිමත් ලියකියවිලි සභාව විසින් ලබාගෙන නොතිබුණි. | සැලැස්මෙහි අරමුණ ළඟාකර ගැනීම සඳහා කටයුතු කළ යුතුවේ. | වර්තමානයේ මෙය මහජන භාවිතය සඳහා භාරදීමට කටයුතු කරමින් පවතින අතර ඉඩම් සම්බන්ධයෙන් ලිපිලේඛන ලබාගැනීම සඳහා ඉල්ලීම් කිරීමේ ලිපිය කින්නියා ප්‍රාදේශීය ලේකම්වරයාට යවා ඇත. | ගොඩනැගිල්ල භාවිතයට ගෙන නොතිබුණු අතර අයිතිය පවරාගෙනද නොතිබුණි. |

**83. හලාවත ප්‍රාදේශීය සභාව**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | 2005 වර්ෂයේ කට්ටිකර අලෙවිකර තිබුණු කරුක්කුවටවන කජුකැලේවත්ත නැමති ඉඩමෙන් පොදු කටයුතු සඳහා සභාවට වෙන්කර දී තිබුණු නමුත් ඔප්පුවකින් පවරා දී නොතිබුණු පර්චස් 115 ක බිම් කොටසින් පර්චස් 60 ක් පමණ දේපළ සමාගම විසින් කූඨ ලේඛන සකසා 2018 වර්ෂයේ වෙනත් පුද්ගලයෙකු වෙත අලෙවි කර තිබුණි. | පොදු කටයුතු සඳහා සභාවට වෙන්කර ඇති ඉඩම් කොටස් පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ශක්ති දේපල නමින් හඳුන්වන ආයතනය මේ වනවිටත් අසාධු ලේඛන ගත කර අතර පොදු කටයුතු සඳහා වෙන්කල Lot 23 හා 24 පුවරුවක් යොදා සභාව සතු ඉඩමක් ලෙස වෙන් කර ඇත. | කූඨ ලේඛන සකසා සභාව සතු ඉඩම් විකුණූ අය පිළිබඳව 2022 ජනවාරි මාසය වනවිටත් නීතිමය කටයුතු සිදුකර නොතිබුණු අතර ඉතිරි කොටස් සභාව වෙත පවරා ගැනීමටද කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2010 සැප්තැම්බර් 25 දින සිට 2013 සැප්තැම්බර් 24 දින දක්වා කාලසීමාව සඳහා මුන්නේශ්වරම විශ්‍රාම ශාලාව සඳහා බදුකුලී ගෙවීම බදුකරු විසින් පැහැර හැර තිබුණු අතර තව දුරටත් රු.181,347 ක කුලී මුදලක් සභාවට අයවීමට තිබුණි. අදාළ බදුකරු සමඟ සභාව විසින් එළඹ තිබූ බදු ගිවිසුමෙහි වලංගුභාවයක් නොමැතිවීම මත බදුකරුට එරෙහිව නීති මගින් කටයුතු කිරීමට සභාව අපොහොසත් වී තිබුණි. | සභාව විසින් එළඹෙන ගිවිසුම් නිසි වලංගුභාවයකින් හා නීති මගින් කටයුතු කළ හැකි ඒවා විය යුතුවේ. | 2013 වර්ෂයේ මුන්නේශ්වරම විශ්‍රාම ශාලාවෙහි පවතින රු.181,347 ක බදු මුදල සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් සිදු කළ අතර මේ වන විට අදාල හිටපු විෂයභාර නිලධාරිනිය ගැන විනය පරීක්ෂණයක් සිදු කරන බව දන්වා සිටිමි. | හිඟ බදු කුලී අයකර ගැනීමේ කටයුතු අවසන් වී නොමැත. |

**84. වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව**

| | | | | |
|---|---|---|---|---|
| **(අ)** | එකතුව රු.1,414,145 ක් වූ බැංකු ජංගම ගිණුම් 03 ක් වර්ෂ ගණනාවක සිට අක්‍රීයව පැවතුණි. | අක්‍රීය බැංකු ජංගම ගිණුම් සම්බන්ධව කඩිනමින් පියවර ගත යුතු වේ. | මෙම ගිණුම් තුනෙන් එක් ගිණුමක් මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කරන අතර ඉතිරි ගිණුම් දෙකෙහි අරමුදල් සභා අරමුදලට ගෙන ගිණුම් වසා දැමීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | 2022 ජනවාරි මස අග වනවිටත් අක්‍රීය බැංකු ජංගම ගිණුම් සම්බන්ධව කිසිදු පියවරක් ගෙන නොතිබුණි . |
| **(ආ)** | සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්ති භාර අරමුදලට දායක මුදල් ගෙවීම ප්‍රමාද කිරීම මත අධිභාර ලෙස සභාව විසින් දරන ලද රු.326,355 ක් අදාළ නිලධාරීන්ගෙන් අයකර ගන්නා ලෙස 2016 ඔක්තෝබර් 13 දිනැති ගිණුම්කාරක සභාව මගින් උපදෙස් ලබාදී තිබුණද, මේ දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගිණුම්කාරක සභා නිර්දේශය අනුව කටයුතු කළ යුතු වේ. | අදාළ නිලධාරියා බස්නාහිර පළාත් සභාවට ස්ථාන මාරු වී ගොස් ඇති අතර මේ වන තෙක් අවශ්‍ය කටයුතු සිදු වී නොමැති බැවින් 2021.11.19 දින අප විසින් පළාත් පාලන කොමසාරිස් මගින් අදාළ ආයතනය වෙත සිහි කැඳවීමේ ලිපියක් යොමු කර ඇත. | 2022 ජනවාරි මස අග වනවිටත් අදාළ මුදල සභාවට අය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | සභාව විසින් පාලනය කරණු ලබන පෙර පාසල් 15 ක් සඳහා 2018 හා 2019 වර්ෂවලදී පෙර පාසල් සංවර්ධන සමිතිය නමින් රු.14,900 ක වියදමක් දරා බිල්පොත් 150 ක් සභාව මඟින් මුද්‍රණය කරවා තිබුණු අතර 2021 අප්‍රේල් මාසය වන විට අදාල පෙර පාසල් වලට අයත් ළමුන්ගෙන් සභාවේ නම් සඳහන් කුවිතාන්සි මඟින් රු.6,821,408 ක මුදලක් එකතු කර තිබුණි. විධිමත් අනුමැතියකින් තොරව බැංකු ගිණුම් 15 ක් විවෘත කර එම මුදල් තැන්පත් කර එම මුදල් වලින් වියදම් දරා තිබුණු අතර ඊට අදාළ ආදායම් හා වියදම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු අතර අදාල ගිණුම් කිසිදු විගණනයකට ලක් වී නොතිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය තුලදී සභා අරමුදලින් රු.15,731,976 ක මුදලක් සභාව විසින් පෙර පාසල් වියදම් වෙනුවෙන් දරා තිබුණි. | ආදායම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු අතර, වියදම්වලට අදාළ ගිණුම් සභාවට ඉදිරිපත් කළ යුතුවේ. | එකී ගිණුම් හා අරමුදල් වටිනාකම් වර්ෂ අවසාන මූල්‍ය ප්‍රකාශන මඟින් වෙනත් හෙළිදරව් කිරීම යටතේ වාර්තා කිරීමට ද, අවශ්‍ය කටයුතු සිදුකර ඇත. | සභාවේ නම් සඳහන් කුවිතාන්සි මගින් එකතුකරන ලද මුදල් විධිමත් පරිදි ගිණුම් ගත කිරීමටත් අදාළ ආදායම් හා වියදම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරිමටත් කටයුතු කර නොතිබුණු අතර අදාල ගිණුම් කිසිදු විගණනයකට ලක්කිරීමටද කටයුතු කර නොතිබුණි |

## 85. නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව

| | | | | |
|---|---|---|---|---|
| (අ) | සෝගාතකාගාරයක් ඉදිකිරීම සඳහා 2002 වර්ෂයේදී පුද්ගලයින් 04 දෙනෙකු වෙත ලබාදුන් රු.600,000 ක මුදලක් 2020 වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධ නිලධාරීන්ගෙන් අයකර ගන්නා ලෙස 2016 ඔක්තෝබර් 13 දිනැති පළාත් ගිණුම්කාරක සභාව මගින් උපදෙස් ලබාදී තිබුණද මේ දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගිණුම්කාරක සභා තීරණය අනුව කටයුතු කළ යුතු වේ. | අදාළ පුද්ගලයින් සිව්දෙනාට නඩු පවරා ඇත. | අදාළ පුද්ගලයින් සිව්දෙනාට නඩු පවරා ඇති අතර මේ වන විට නඩු වාර 2 ක් අවසන් වී ඇත. අධිකරණය මගින් ඉදිරි නඩු වාරය ලෙස 2022.02.23 දිනය ලබා දී ඇත. |
| (ආ) | හෙක්ටයාර 204 ක් වූ මාවිල කීනකැලේවත්ත සම්පූර්ණ ඉඩම හෙක්ටයාර් එකකට අඩුවන සේ පිඹුරුපත් 02 ක් ලෙස අනු බෙදුම් කර පුද්ගලික වෙන්දේසි සමාගමක් විසින් 2019 ඔක්තෝබර් 26 දින මිලදී ගෙන ඉඩම් අනු බෙදීම සඳහා ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ගෙන් අනුමැතිය 2020 මාර්තු 12 දින ලබාගෙන තිබුණි. සම්පූර්ණ ඉඩම අනුබෙදීම් කිරීම සඳහා පිඹුරුපත් 02 ක් ඉදිරිපත් කිරීම අදාළ නීතිරීති වලින් ගැලවී යාමට කල උත්සාහයක් බවත් ඒ හේතුවෙන් ඉඩමෙන් පොදු | ඉඩම් අනුබෙදුම් කිරීමට අදාළ නීති රීති අනුව කටයුතු කළ යුතුය. | 2020.10.20 වන දින නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව මගින් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ලිපියක් යොමු කොට අදාළ ඉඩම සඳහා පොදු පහසුකම් වෙන් කළයුතු ද යන්න විමසා ඇත. | පොදු පහසුකම් පවරා ගැනීමක් සිදු නොකර පිඹුරු අනුමත කර ඇත. එහෙත් සම්පූර්ණ ඉඩම හෙක්ටයාර් එකකට අඩුවන සේ පිඹුරුපත් දෙකක් ලෙස අනුබෙදුම් කිරීමෙන් ඉඩමෙන් පොදු පහසුකම් සඳහා හිමි වියයුතු |

| | | | |
|---|---|---|---|
| පහසුකම් සඳහා හිමිවිය යුතු පර්චස් 64 ක පමණ බිම් කොටස් සභාවට අහිමි වී තිබුණි. | | | පර්චස් 64 පමණ බිම් කොටස සභාවට අහිමි කර ඇත. |

**86. වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| රු.3,209,301 ක් වටිනා ගොඩනැගිලි හා රු.2,811,200 ක් වටිනා කායවර්ධන උපකරණ තොගයක් 2019 වර්ෂයේ සිට නිශ්කාර්යව පැවතුණි. | වත්කම් පූර්ණ ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළයුතු වේ. | කරතිව් ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල අබලන් තත්ත්වයේ පවතින බැවින් හා ස්මයිල් පුරම් මහජන උපයෝගිතා මධ්‍යස්ථානය හා 6 කණුව සේවා මධ්‍යස්ථානය අසල ගොඩනැගිල්ල බදු ලබා ගැනීමට අයදුම්කරුවන් ඉදිරිපත් නොවීම නිසා භාවිතයට ගැනීමට නොහැකි වී ඇත. කායවර්ධන උපකරණ මගින් ප්‍රයෝජනයට ගැනීමට ගොඩනැගිල්ලක් නොමැති වීම නිසා ප්‍රයෝජනයට ගත නොහැකි වී ඇත. | 2022 ජනවාරි මාසය වන විටත් අදාල ගොඩනැගිලි හා කායවර්ධන උපකරණ උපයෝජනය කර නොතිබුණි. |

**87.** **කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| රු.18,000,000 ක් වැයකර 2014 වර්ෂයේ ඉදිකර තිබුණු නීල බැම්ම නිවාඩු නිකේතනය හා සති පොළවල් 02 ක් නිශ්ක්‍රීයව පැවතුණි. | සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමේ ක්‍රමවේද සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු වේ. | නීල බැම්ම නිවාඩු නිකේතනය - පෞද්ගලික ව්‍යාපාරිකයෙකුට ටෙන්ඩර් මඟින් දීර්ඝ කාලීන බද්ධට ලබාදීමට සැලසුම් කර ඇත. ඒ සඳහා ව්‍යාපෘති වාර්තා කැඳවා ඇත.<br><br>සති පොළවල් 02 - කීපවරක් ටෙන්ඩර් කැඳ වූ අතර කිසිදු අයඳුම්කරුවෙක් ඉදිරිපත් වී නොතිබුණි. අමතර පන්ති සඳහා ලබාදීමට මහ සභාවේ යෝජනා සම්මත කර ඇත. | 2022 ජනවාරි මස අග වන විටත් නීල බැම්ම නිවාඩු නිකේතනය හා සති පොළවල් 02 ක වර්ෂ ගණනාවක සිට නිශ්ක්‍රීයව පැවතුණි. |

**88. පන්නල ප්‍රාදේශීය සභාව**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | කදානේ ගෙදර වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 08 කින් රු.4,636,771 ක් හා වැටකෙයාව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 02 කින් රු.220,332 ක් වන හිඟ යතුරු මුදල් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කීමනී අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ දක්වා අය වී නොමැති හිඟ යතුරු මුදල් අයකර ගැනීම සඳහා කටයුතු සිදුකරමින් පවතී. | යතුරු මුදල් අයකර නොමැත. |
| (ආ) | සභාව සතු කඩ කාමර 326 න් කඩ කාමර 317 ක් පමණක් සමාලෝචිත වර්ෂයේ බදු දී තිබූ අතර 2021 අප්‍රේල් 30 දිනට හිඟ ශේෂය රු.105,980 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුවේ. | හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | රු.105,980 ක හිඟ ශේෂ අය කර නොමැත. ඉතිරි කඩ කාමර 09 බදු දී නොමැත. |

**89. බිංගිරිය ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| 2015 නොවැම්බර් 04 දින වැඩ ආරම්භ කර තිබූ ඇස්තමේන්තුගත වටිනාකම රු.8,528,443 ක් වූ බෝවත්ත බස් නැවතුම්පොළ ඉදිකිරීම් කටයුතු සඳහා 2017 වර්ෂය වන විට රු.8,917,462 ක වටිනාකමක් ගෙවීම් කර රු.886,746 ක් රැඳවුම් මුදලක් ලෙස තබාගෙන පැවති අතර, ගොඩනැගිල්ලට ටයිල් ඇල්ලීම, අත්වැට සැකසීම සහ භූමිය සකස් | මහජනතාවට එම වත්කම්වල ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කල යුතු වේ. | එම ගොඩනැගිල්ලේ හා භූමියේ ඉතිරි වැඩ සම්පූර්ණ කිරීම සඳහා ප්‍රතිපාදන ප්‍රාදේශීය සභාව සතුව නොපවතින බැවින් අමාත්‍යාංශය මගින් මුදල් වෙන්කර ගැනීම සඳහා දළ ඇස්තමේන්තු සමග යෝජනා ඉදිරිපත් කර ඇත. | ප්‍රතිපාදන නොමැති බැවින් ඉතිරි වැඩ නිම කිරීමට නොහැකි වී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | නොකිරීම හේතුවෙන් භාවිතා කිරීමෙන් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි. | | | |

**90. ඉබ්බාගමුව ප්‍රදේශීය සභාව**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | 2015 දෙසැම්බර් 30 දිනැති අංක 2016/01 දරන මුදල් කොමිෂන් සභා චක්‍රලේඛයේ 1.2 ඡේදයට පටහැනිව පළාත් පාලන මාර්ග ඉදිකිරීමේ දී මෙන්ම වැඩි දියුණු කිරීමේදී ඒවා කල් පවත්නා අයුරින් පවත්වා ගැනීම සඳහා කාපට් කිරීම, තාර දැමීම හෝ කොන්ක්‍රීට් කිරීම කළයුතු වුවද, 2018 වර්ෂයේ මාර්ග 38 ක් සඳහා රු.12,172,648 ක් වැයකර බොරළු යොදා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මන්ත්‍රීවරු 22 සිට 43 දක්වා වැඩිවීම, කොට්ඨාශ සංවර්ධනය කිරීමට දක්වන කැමැත්ත, බල ප්‍රදේශය විශාල වීමත්, මාර්ග පද්ධති අධිකවීමත්, මහජන ඉල්ලීම් මත චක්‍රලේඛය අභිබවා යාමට සිදුවිය. | 2020,2021 යන වර්ෂවලදීද මාර්ග 04 කට රු.1,042,218 වැයකර බොරළු දමා තිබුණි. |
| (ආ) | මැල්සිරිපුර බස්නැවතුම්පල කඩ කාමර පෙර ගෙවුම් ක්‍රමයට ලබාදීමේදී ගිවිසුම් සහගතව නොතිබුණු අතර 2018 පෙබරවාරි 09 දින අත්සන් කර තිබූ ගිවිසුම ප්‍රකාරව මාස 03 ක් ඇතුලත ඉතිරි පෙර ගෙවුම් මුදල් නොගෙවුවහොත් නැවත ටෙන්ඩර් කිරීමට බදු දීමනාකරුට බලය ඇතත්, එපරිදි කටයුතු කර නොතිබීම නිසා රු.3,703,596 ක් අයවීමට තිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අදාල පාර්ශවයන් දිගින් දිගටම මේ සම්බන්ධයෙන් දැනුවත් කර ඇති අතර ඉදිරියේදී නීතිමය කටයුතු සිදුකර ඉතිරි හිඟය අයකර ගැනීමට කටයුතු කරමි. | 2022 වර්ෂය වනවිට රු.2,155,711 ක මුදලක් අයකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2015 හා 2016 වර්ෂවල පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.13,075,000 ක් වටිනා ගලිබවුසරය හා කම්පැක්ටරය නිෂ්කාර්යයව පැවතුණි. | ඵලදායී ලෙස යොදා ගැනීමට නොහැකි නම් අවශ්‍යතාවය පවත්නා ආයතනයකට ලබා දීමට කටයුතු කළ යුතුවේ. | ව්‍යාපෘති යෝජනාවක් සකසා මල ද්‍රව්‍ය බැහැරලන ස්ථානයක් සඳහා ප්‍රතිපාදන ලබාගැනීමට යෝජිතය. ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානය ආරම්භ කළ පසු කම්පැක්ටරය ප්‍රයෝජනයට ගතහැකි බව කාරුණිකව දැනුම් දෙමි. | මෙම යන්ත්‍ර 02 භාවිතයට ගැනීමක් සිදු නොවේ. |
| (ඈ) | ආයතන සංග්‍රහයේ ix වැනි පරිච්ඡේදයේ පළමු වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු 1990 ජුනි 05 දිනැති පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 3(ආ) විධිවිධානවලට පටහැනිව 2017 වර්ෂයේ සිට 2019 වර්ෂයේ පෙබරවාරි 26 දින දක්වා ඉබ්බාගමුව, ගනේවත්ත ප්‍රාදේශීය ලේකම්ගෙන් ලැබී තිබුණු පරිපාලන වියදම් මුදලින් සියයට 25 ක් සභා අරමුදලට බැර කර ඉතිරි සියයට 75 ක මුදල වන රු.943,842 ක් සභාවේ සේවයේ නියුතු කාර්යය මණ්ඩලයේ 19 දෙනෙකු අතර සභා තීරණ මත බෙදා දී තිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන හා චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු වේ. | ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා චක්‍ර ලේඛනයට පටහැනි වුවද රජයට පාඩුවක් නොමැති බව දන්වන අතර අදාළ රාජකාරී ඉටු කිරීම වෙනුවෙන් එවන ලද මුදල් අදාළ පාර්ශවයන්ට ගෙවා ඇත. | මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

**91. කුරුණෑගල ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| ආයතන සංග්‍රහයේ IX වැනි පරිච්ඡේදයේ පළමු වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු 1990 ජුනි 05 දිනැති පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 3 (ආ) ප්‍රකාරව ආණ්ඩුකාරවරයාගේ අනුමැතියකින් තොරව රාජ්‍ය ආයතන වලින් ලැබෙන විවිධ ප්‍රතිපාදන මත සංවර්ධන කටයුතු සිදු කිරීම වෙනුවෙන් 2011 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා සභා අරමුදලට ලැබී තිබූ පරිපාලන වියදමින් රු.2,386,631 මුදලක් සභාවේ සේවයේ නියුතු නිලධාරීන් 22 නෙකු අතර බෙදා දී තිබුණි. | අනුමැතියකින් තොරව ගෙවූ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 1990 ජුනි 05 දිනැති පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය පිටපතක් ලබාගෙන අධ්‍යනය කිරීමෙන් අනතුරුව පිළිතුරු ඉදිරිපත් කරමි. | මෙම ගෙවීමට කටයුතු කරන ලෙස දන්වා ලිපි යොමුකර ඇති අතර මෙම මුදල් අයකරගෙන නොතිබුණි. |

**92. ගල්ගමුව ප්‍රාදේශීය සභාව**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | 2020 වර්ෂය අවසානයට මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය කුලියට දීමෙන් අයවිය යුතු හිඟ කුලී රු.3,235,919 ක් වූ අතර මෙහි වසර 01 කට වැඩි කාලයක් තුළ හිඟව පවතින රු.3,016,308 ක් විය. | සභා කර්මාන්ත සඳහා අයවිය යුතු මුදල් ගිණුම් අතර මාරු කිරීමටත් වෙනත් ආයතන හා පුද්ගලයන්ගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීමටත් කටයුතු කළ යුතු වේ. | සභා කර්මාන්ත ගිණුම් අතර මාරු කිරීමට කටයුතු කරන බවත් පුද්ගලයින්ගෙන් අය විය යුතු හිඟ මුදල් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරන බවත් දන්වා සිටිමි. | හිඟ මුදල් අයකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | තලන රෝල කුලියට දීමෙන් 2020 වර්ෂය අවසානයට ලැබිය යුතු රු . 1,314,972 ක් වූ හිඟ කුලී වලින් වසරකට වැඩි ශේෂය රු . 1,309,472 ක් විය. | මෙතෙක් අය වී නොමැති බැවින් ආයතන හා පුද්ගලයන්ගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මේ වන විට පුද්ගලයින්ගෙන් අය විය යුතු මුදල් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරන බවත් දන්වා සිටිමි. | හිඟ මුදල් විධිමත්ව අයකර නොතිබුණි. |
| (ඇ) | JCB යන්ත්‍රයෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු .2,665,358 ක් වූ හිඟ කුලී තුළ වසරකට වැඩි කාලයක සිට පැවත එන ශේෂය රු .1,302,656 ක් විය. | මෙතෙක් අය වී නොමැති බැවින් ආයතන හා පුද්ගලයන්ගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සභා කර්මාන්ත ගිණුම් අතර මාරු කිරීමට කටයුතු කරන බවත් පුද්ගලයින්ගෙන් අය විය යුතු හිඟ මුදල් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරන බවත් දන්වා සිටිමි. | හිඟ මුදල් විධිමත්ව අයකර නොතිබුණි. |
| (ඇ) | මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය කුලියට දීමෙන් 2020 ජුනි 17 දින වන විට තවදුරටත් අයවිය යුතු ශේෂය රු.5,256,064 ක් විය. | නියමිත කුලී මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සභා කර්මාන්ත ගිණුම් අතර මාරු කිරීමට ඉදිරි කටයුතු කරන බවත් පුද්ගලයින්ගෙන් අය විය යුතු හිඟ මුදල් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරන බවත් දන්වා සිටිමි. | හිඟ මුදල් අයකරගෙන නොතිබුණි. |

**93. ගිරිබාව ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| ගිවිසුම් අත්සන් කළ බදුකරුවන් 07 දෙනෙකු විසින් 2006 සිට 2018 වර්ෂය දක්වා කාලය තුළ කඩකාමර 07 ක් සභාව දැනුවත් කිරීමෙන් | ගිවිසුම් ගත කොන්දේසි අනුව කටයුතු කළයුතු වේ. | කඩ කාමර බාහිර පාර්ශවයන්ට විකිණීම සිදු නොකළ යුතු බවත්, බාහිර පාර්ශවයන්ට පවරන්නේ | වර්තමාන බදුකරුවන් සමග ගිවිසුම්ගතවී ඇත. |

| | | | |
|---|---|---|---|
| නොරව බාහිර පාර්ශවයන්ට රු.2,030,000 කට විකුණා තිබුණි. | | නම් ප්‍රාදේශීය සභාවේ එකඟතාව මත පැවරීම් සිදු කළයුතු බවත්, ගිවිසුම්කරුවන් දැනුවත් කර ඇත. | |

**94. නිකවැරටිය ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| සභාව සතු බස්නැවතුම්පල කඩ කාමර 05 ක් බදු දීමට කටයුතු කර නොතිබීමෙන් රු.420,000 ක ආදායමක් ද, සෞඛ්‍ය මධ්‍යස්ථානයේ බිම්මහල හා උඩුමහල කඩ කාමර 18 ක් බදු දීමට කටයුතු කර ඇතත් ගැණුම්කරුවන් ඉදිරිපත් නොවීම මත රු.1,434,000 ක ආදායමක්ද අහිමි වී තිබුණි. බස්නැවතුම්පල උඩුමහලේ කඩ කාමර විවෘත කර වසර 3 – 4 ක් පමණ ගත වී ඇතත්, විදුලිය නොමැති වීම, පරවියන් ලැගීම වැනි විවිධ හේතු මත වසා දමා ඇති බවත්, සභාව මෙම අඩුපාඩු සම්පූර්ණ කර දීමට කටයුතු කර නොතිබුණි. | සභාව සතු වත්කම් බදු දී ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදාල ගැටළු විසදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. | බදු දී නොමැති කඩකාමර තවදුරටත් පවතී. |

## 95. පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව

| | | | | |
|---|---|---|---|---|
| | 2016 වර්ෂය පෙර සිට කඩ කාමර 14 කින් අය වියයුතු රු.1,192,709 ක හිඟ කඩ කුලී මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් කාලීනව අයකර ගත යුතු වේ. | ප්‍රාර්ථනා කැෆේ කඩ කාමරයේ හිඟ මුදල රු.1,076,858.66 කි. එය අයකර ගැනීමට නඩුවක් පවරා ඇත. තැම්පත් ලේඛණයේ පවතින මුදල් වලින් හිලව් කළහැකි හිඟ මුදල් සඳහා හිලව් කිරීමට කටයුතු කළෙමි. ඉතිරි හිඟ අයකර ගැනීමට ආදායම් පරීක්ෂක වෙත යොමු කර ඇත. | රු.1,076,854 ක මුදලක් තවදුරටත් අයකර නොතිබුණි. |

## 96. බුත්තල ප්‍රාදේශීය සභාව

| | | | | |
|---|---|---|---|---|
| (අ) | 1988 සිට 2012 වර්ෂය දක්වා සභාවට අයත් සතිපොළ, ගවමස් කඩ, එළුමස් කඩ හා කුකුල් මස් කඩ බදුදීම වෙනුවෙන් රු.1,225,279 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ බදු කුලී අයකර ගැනීමටත් මෙවැනි තත්ත්වයන් වැලැක්වීමටත් ක්‍රියාමාර්ග ගතයුතුය. | 1988-2011 කාලයට අදාල ඒවා කාලීනව අය නොකිරීම නිසා මේ වන විට අයකර ගැනීම ගැටළු සහගත වී ඇත. | හිඟ කුලී අයකරගෙන නොමැත. |
| (ආ) | සභාව විසින් ඝන මීටර් 200 කට වැඩි ප්‍රමාණයක බොරළු යොදා ඉදිකර තිබුණු මාර්ග සංවර්ධන ව්‍යාපෘති 8 කට අදාළව ප්‍රවාහන විෂයය සඳහා ගෙවීම් කිරීමේදී බොරළු ඝන මීටර් 200 කට වැඩි ප්‍රමාණයේ ගෙවීම් ප්‍රමාණ රේට යොදා නොගෙන ඝන මීටර් 200 ට අඩු රේට යොදාගෙන ගෙවීම් කිරීම නිසා රු.434,630 ක් වැඩිපුර ගෙවා තිබුණි. | සභා අරමුදලට සිදුවී ඇති පාඩුව නැවත අයකර ගත යුතුවේ. | මෙම කර්මාන්තවල බොරළු ප්‍රවාහනය සඳහා මාර්ග මිල ගණන් වල අවසානයේ සඳහන් මිල ගණන් භාවිතා කර ඇති අතර, ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට කටයුතු කරමි. | මේ සම්බන්ධයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තු ව විසින් විමර්ශනයක් සිදු කරමින් පවතී. වැඩිපුර ගෙවීම් අයකර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | සභාවට අයත් වාහන/යන්ත්‍ර 09 ක් 2010 වර්ෂයේ සිට 2019 අගෝස්තු 31 දක්වා කාල පරිච්ඡේදය තුළ කුලියටදීම වෙනුවෙන් 2019 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.5,033,718 ක හිඟ කුලී ආදායම් අයකර නොතිබුණි. | හිඟ ආදායම් අයකරගත යුතුවේ. | අයකර ගැනිමට විවිධ පියවර ගෙන ඇති අතර නොගෙවන අයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. | නීතිමය ක්‍රියාමාර්ග ගෙන හෝ මුදල් අයකර හෝ නොමැත. |
| (ඈ) | සභාව විසින් දීර්ඝකාලීනව බදු දී තිබුණු කඩ කාමර 67 ක මාසික බදු කුලිය අය කිරීමේදී, ඌව පළාත් ප්‍රධාන තක්සේරුකරුගේ අංක එම්ඔ/ආර්ඩී/498 හා 2012 ජූලි 24 දිනැති තක්සේරුව අනුව කටයුතු කර නොතිබුණු බැවින් 2020 දෙසැම්බර් 31 දින වන විට සභා අරමුදලට රු.12,576,600 ක ආදායමක් අහිමි වී තිබුණි. | කඩ කාමර කාලීනව තක්සේරු කර එම තක්සේරු කුලිය අයකරගත යුතුයි. | දැනට අයකරනු ලබන තක්සේරු කුලිය අය කරන ලෙස පළාත් පාලන කොමසාරිස්වරයා දැනුම් දී ඇති බව දන්වා ඇත. | නව තක්සේරුව අනුව කඩ කුලී අයකිරීම් සිදුකර නොමැත. |

**97.** **තණමල්විල ප්‍රාදේශීය සභාව**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | සභාව විසින් ඝන මීටර් 200 කට වැඩි ප්‍රමාණයක බොරළු යොදා ඉදිකර තිබුණු මාර්ග සංවර්ධන ව්‍යාපෘති 12 කට අදාලව ප්‍රවාහන විෂයය සඳහා ගෙවීම් කිරීමේදී, බොරළු ඝන මීටර් 200 ට අඩු කර්මාන්තවලට අදාල අනුපාත යොදාගෙන ගෙවීම් කිරීම නිසා ඉකුත් වර්ෂවලට අදාලව රු.1,975,898 ක් වැඩිපුර ගෙවා තිබුණි. | සභා අරමුදලට සිදුවී ඇති පාඩුව කඩිනමින් නැවත අයකරගත යුතුය. | මෙම කර්මාන්තවලට අදාළව තව දුරටත් රු 947,814 .ක් අයකර ගත යුතු බව දන්වා ඇත. | රු 940,815 .ක් තව දුරටත් අයකරගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ප්‍රාදේශීය සභාවට අයත් මස් කඩ, මාළු කඩ හා සතිපොල බදුදීම වෙනුවෙන් අයවිය යුතු වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට ඉදිරියට ගෙනඑමින් පවතින රු.768,277 ක හිඟ බදු මුදල් අයකර ගෙන නොතිබුණි. | හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | හිඟ මුදල් කපා හැරීමට සහකාර පළාත් පාලන කොමසාරිස් මගින් ප්‍රධාන අමාත්‍යතුමා වෙත ඉල්ලීම් කර ඇති බව දන්වමි. | හිඟ මුදල් අයකරගෙන නොමැත. |

**98. බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| සභාවට අයත් දේපල 13 ක් බදුදීම වෙනුවෙන් ඉකුත් වර්ෂ සඳහා අයවිය යුතු රු.417,556 ක හිඟ බදු ආදායම් අයකරගෙන නොතිබුණු අතර දේපල 10 ක් 2020 වර්ෂයේදී බදු දී නොතිබුණි. | හිඟ බදු මුදල් අයකර ගැනීමට සහ දේපල බදු දීමට කටයුතු කළ යුතුය. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇති අතර බදු දී නොමැති කඩ කාමර සඳහා ටෙන්ඩර් කළද බදුකරුවකු ඉදිරිපත් නොවූ බව දන්වා ඇත. | හිඟ බදු මුදල් අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර දේපල 10 ක් මෙතෙක් බදුදීමට කටයුතු කර නොතිබුණි. |

**99.** වැල්ලවාය ප්‍රාදේශීය සභාව

| | | | |
|---|---|---|---|
| සභාවට අයත් කඩකාමර 119 කින් බදුදීම වෙනුවෙන් 2016 වර්ෂයට පෙර අයවිය යුතු රු.732,740 ක් සහ 2017 සිට 2019 දක්වා අයවිය යුතු රු.3,309,235 ක කුලී අයකර ගෙන නොතිබුණි. | හිඟ කඩ කාමර කුලී අයකර ගත යුතුය. | කොරෝනා වසංගත රෝග තත්වය හේතුවෙන් හිඟ කුලී අය කිරීම පසුබෑමකට ලක්වූ අතර ඉදිරියේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා ඇත. | 2016 වර්ෂයට පෙර සිට 2019 වර්ෂය දක්වා පැවත එන හිඟ කුලී රු.3,362,212 ක් තවදුරටත් අයකර ගත යුතුය. |

**100. කතරගම ප්‍රාදේශීය සභාව**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | සභාවට අයත් දේපල 12 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.5,458,237 ක බදු මුදල් අයකර ගෙන නොතිබුණි. | අයවිය යුතු බදු මුදල් අයකර ගත යුතුවේ. | නීතිමය පියවර ගැනීම සඳහා නීතිඥ මහතාට ලිපිගොනු භාරදීමට කටයුතු කරමි. | රු.5,458,237 ක බදු මුදල් අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර එකී හිඟ බදු මුදල් අයකර ගැනීමට නීතිමය පියවර ගෙන නොතිබුණි. |
| (ආ) | 2012 වර්ෂයේ සිට 2020 ජූලි මාසය දක්වා සභාව විසින් අයකර තිබුණු පරිසර ආරක්ෂණ බලපත්‍ර පරීක්ෂණ ගාස්තු වලින්, 2012 සිට 2019 වර්ෂය දක්වා ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතුවල නියුතු නිලධාරීන් 10 දෙනෙකුට රු.568,993 ක් ද 2020 වර්ෂයේ ජූලි මාසය දක්වා නිලධාරීන් 05 දෙනෙකු වෙත රු.35,000 ක දීමනාවක් විධිමත් අනුමැතියකින් තොරව ගෙවා තිබුණි. | විධිමත් අනුමැතියකින් තොරව නිලධාරීන්ට දීමනා ගෙවීම නතර කළ යුතු අතර ගෙවීම් කර ඇති දීමනාවන් අයකර ගතයුතුවේ. | මේ සම්බන්ධයෙන් තොරතුරු කඩිනමින් ලබා දෙන ලෙස විෂය නිලධාරීන් දැනුවත් කළ අතර එය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | ක්ෂේත්‍ර පරීක්ෂණ දීමනාව ගෙවීම නතර කර තිබුණු නමුත් 2012 වර්ෂයේ සිට 2020 දක්වා කාලයේ අවිධිමත් ගෙවීම් අයකරගෙන නොමැත. |

**101. බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| ආසියානු සංවර්ධන බැංකු මූල්‍ය අනුග්‍රහය යටතේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරන ලද පුරනැගුම ව්‍යාපෘතිය මඟින් රුපියල් ලක්ෂ 400 ක් වැයකර 2016 වර්ෂයේදී වැඩ නිමකර ප්‍රාදේශීය සභාවට භාරදී තිබුණු මහලක් සහිත බහු කාර්යය ගොඩනැගිල්ල ආදායම් | එම ගොඩනැගිල්ල ආදායම් උපයා ගැනීම සඳහා යොදා ගත යුතුය. | එම ගොඩනැගිල්ල ආදායම් උත්පාදන මාර්ගයක් ලෙස යොදා ගැනීමට යෝජනා කර ඇති බව සඳහන් කර ඇත. | පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් සහ සන්නිවේදන මධ්‍යස්ථානයක් අලුතින් ආරම්භ කර ඇත. |

| | | | |
|---|---|---|---|
| උපයා ගැනීමේ අරමුණින් ඉදිකර තිබුණද, මහජන පුස්තකාලයක් සහ සභාවේ රැස්වීම් කටයුතු සඳහා පමණක් යොදාගෙන තිබුණි. | | | |

**102. මහියංගණය ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| සභාවට අයත්, මහියංගණ නගරයේ පිහිටි ඉඩමක බදුකරුවන් විසින් මුදල් වැය කර ඉදිකර තිබුණු කඩ කාමර 31 කින් සමන්විත වෙළෙඳ සංකීර්ණයේ 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම වසර 09 ක කාලයක් විවිධ පාර්ශවයන් වෙළඳාම් කටයුතු සිදු කරමින් සිටින අතර, සභාව බදු කරුවන් සමඟ ගිවිසුම් වලට එළඹ හෝ බදු කුලී අයකරගෙන හෝ නොතිබුණි. | සභාව බදු කරුවන් සමඟ ගිවිසුම් වලට එළඹ බදු කුලී අයකර ගත යුතුය. | අදාළ බදු ගිවිසුමට පූර්ව අනුමැතිය ලබා ගැනීමට පළාත් පාලන කොමසාරිස් මඟින් ගරු ආණ්ඩුකාර තුමා වෙත ඉදිරිපත් කර ඇති බව සඳහන් කර ඇත. | ගිවිසුම් වලට එළඹ බදු කුලී අය කර ගැනීමක් සිදු කර නොතිබුණි. |

**103. සොරණාතොට ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| 2009 වර්ෂයේදී බහුකාර්ය ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබාගෙන තිබුණු රු.8,834,609 ක ණය මුදලින් ශ්‍රවණාගාරයක් සහ බාහිර පාර්ශවයන්ට කාමර කුලියට දී ආදායම් ඉපයීමේ අරමුණින් ඉදිකර තිබුණු ගොඩනැගිල්ල, සැලසුම් කරගත් ආකාරයට භාවිතයට නොගෙන ශ්‍රවණාගාරය සභාවේ මාසික රැස්වීම් පැවැත්වීමටත්, එහි කාමර කාර්යාල කටයුතු සඳහාත් යොදාගෙන තිබීමෙන් ප්‍රමාණවත් | නිවැරදි සැළසුමක් පිළියෙල කර එහි දක්වා ඇති අපේක්ෂිත අරමුණු සපුරා ගත යුතුය. | සභා කාර්යාල සඳහා මෙම ගොඩනැගිල්ලේ ඉහළ මහල සැලසුම් කර තිබුණ ද එය තවම ඉදිකර නොමැති බැවින් දැනට ඉදිකර ඇති ගොඩනැගිල්ලෙහි සභා කාර්යාලය පවත්වාගෙන යන බවත් ඒ හේතුවෙන් ගොඩනැගිල්ල ආදායම් උපයා ගැනීමේ කාර්යය සඳහා යොදා ගැනීමට නොහැකි වූ බවත් සඳහන් කර ඇත. | නිරීක්ෂණය එලෙසම පවතී. |

| | | | |
|---|---|---|---|
| ආදායම් උපයා ගැනීමට අපොහොසත්වීම හේතුවෙන් ලබාගෙන තිබූ ණය සඳහා වාරික ගෙවීමට නොහැකි වී තිබුණු අතර, ඒ හේතුව නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විට දේශීය ණය සහ සංවර්ධන අරමුදලට නොගෙවා ඇති ණය වාරික හා දඩ පොලී ප්‍රමාණය රු.5,795,722 ක් විය. | | | |

**104. රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| ආදාඋල්පත පොල භූමියේ වෙළඳාම් කිරීමේ අයිතිය බදුදීමේදී ඒ සම්බන්ධ ගිවිසුමේ 04 වැනි කොන්දේසිය අනුව කටයුතු සිදු නොකිරීම හේතුවෙන් 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.833,746 ක ආදායමක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | හිඟ පොල බදු ආදායම් අයකර ගත යුතුවේ. | අධිකරණයේ නඩු පවරා ඇති බව දක්වා ඇත. | අධිකරණයේ නඩු පවරා ඇති අතර, නඩු කටයුතු අවසන් කර නොමැත. |

**105. වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාව**

| | | | |
|---|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(i) වගන්තියට අනුකූලව සභා බල ප්‍රදේශයට අයත් දේපළවලින් පසුගිය වර්ෂ 05කට අධික කාලයක සිට රු.2,926,355ක හිඟ දේපළ බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | හිඟහිටි මුදල් කඩිනමින් අයකිරීමට ඵලදායි ක්‍රියාමාර්ග ගත යුතුවේ. | සුසාන භූමි 45ක් ලියාපදිංචි කිරීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතී. ලියාපදිංචි කිරීමේ කටයුතු අවසන් වීමෙන් පසුව ගාස්තු අයකිරීමට කටයුතු කරනු ලැබේ. | මේ දක්වාම එම ආදායම් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. |

**106. කරෙයිනගර් ප්‍රාදේශීය සභාව**

| | | | | |
|---|---|---|---|---|
| | කසුරිනා වෙරළතීරය අලංකාර කිරීම, පාරම්පරික භොජුන් හල, වැසිකිලි සහ ළමා උද්‍යානය ඉදිකිරීම යන ක්‍රියාකාරකම් සඳහා රු.15,827,506 ක් වැයකළ ද, එම වත්කම් මේ දක්වාම අභාවිතව පවතී. | වත්කම් අභාවිතව නොතැබිය යුතුය. | නැවතත් ලංසු කැඳවීමට කටයුතු කරනු ලැබේ. | තවදුරටත් එම වත්කම් අභාවිතව පවතී. |

**107. නල්ලූර් ප්‍රාදේශීය සභාව**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | රු. 5,354,000 ක් වැයකර මිලදී ගත් ඉඩම් වර්ෂ 07ක සිට භාවිතා කර නොතිබුණි. | ඉඩම් පරිහරණය කිරීමට උචිත ක්‍රියාමාර්ග ගත යුතු වේ. | මෙම වර්ෂ අවසානය තුළ මාර්ගය ඉදිකිරීමට කටයුතු කරනු ලැබේ. | තවදුරටත් එම වත්කම් අභාවිතව පවතී. |
| (ආ) | වර්ෂ 02කට වඩා පැරණි රු.6,263,614ක හිඟ වරිපනම් බදු අයකර නොතිබුණි. | ආදායම් රැස් කිරීම මනාව කළමනාකරණය කළ යුතු වේ. | වසංගත තත්ත්වය මෙයට හේතුව වී තිබුණි. | මේ දක්වාම එම ආදායම් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. |

**108. වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය සභාව**

| | | | | |
|---|---|---|---|---|
| | මුදලෙයික්කුලි පානීය ජලය බෙදාහැරීමේ ව්‍යාපෘතිය නිමකර වර්ෂ 05කට වැඩි කාලයක් ගත වී තිබුණ ද, පානීය ජලය බෙදාහැරීම සඳහා මේ දක්වාම කටයුතු නොකිරිම නිසා ඒ වෙනුවෙන් වැය කළ රු. 2,999,724ක් නිෂ්ඵල වියදමක් වී තිබුණි. | වැය කළ මුදලට ප්‍රමාණවත් උපයෝජනයක් ලබාගත යුතුය. | කළමනාකරු, ජාතික ජල සම්පාදන හා මලාපවහන මණ්ඩලයෙන් ලබාගත් වාර්තාව අනුව ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත. | පානීය ජලය බෙදාහැරීමට මේ දක්වාම කටයුතු කර නොතිබුණි. |

## 109. වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාව

| | | | |
|---|---|---|---|
| සාප්පු සංකීර්ණයක ඉදි කිරීම් මේ දක්වාම අභාවිතව පවතින බැවින් ඒ වෙනුවෙන් වැය කළ රු.3,794,808ක් නිෂ්ඵල වියදමක් වී තිබුණි. | වත්කම් අභාවිතව නොතැබීමට පියවර ගත යුතුවේ. | ඉදිරියේදී වැඩි වශයෙන් අවධානය යොමුකර ඉටු කරනු ලැබේ. | මේ දක්වාමත් අභාවිතව පවතී. |

## 110. වලිකාමම් උතුර ප්‍රාදේශීය සභාව

| | | | |
|---|---|---|---|
| මලාපද්‍රව්‍ය පවිත්‍රකරණ මධ්‍යස්ථානයක් ඉදි කිරීමට 2018 වර්ෂයේදී රු.10,262,245ක් වැය කළ ද, මලාපද්‍රව්‍ය පවිත්‍රකරණ කටයුතු මේ දක්වාම ඉටු වී නොතිබුණි. | ව්‍යාපෘතිවල ප්‍රතිලාභ අත්කර ගැනීමට උචිත ක්‍රියාමාර්ග ගතයුතු වේ. | ඉන්දීය තාක්ෂණික නිලධාරියා මෙය පරීක්ෂාකර ගොස් ඇත. එහෙත්, වසංගත තත්ත්වය හේතුවෙන් ප්‍රමාදයක් සිදු වී තිබේ. | මලාපද්‍රව්‍ය පවිත්‍රකරණ කටයුතු මේ දක්වාම ඉටු වී නොතිබුණි. |

## 111. වලිකාමම් නිරිත ප්‍රාදේශීය සභාව

| | | | | |
|---|---|---|---|---|
| (අ) | වර්ෂ 02ත් වර්ෂ 05ත් අතර පැරණි හිඟහිටි, වරිපනම් බදු රු. 25,498,555ක්, කුලී 2,800,311ක් හා ජලසම්පාදන සේවා ගාස්තු රු.161,030ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආදායම් රැස් කිරීම මනාව කළමනාකරණය කළ යුතු වේ. | වසංගත තත්ත්වය මෙයට හේතු වූ අතර මෙම ආදායම් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | මේ දක්වාම එම ආදායම් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. |
| (ආ) | වෙළඳ සංකීර්ණ, මළපවහන ව්‍යාපෘති හා ළමා උද්‍යාන ආදී කාර්යයන් 05ක් රු.22,670,268ක් වැය කර සම්පූර්ණ කර තිබුණ ද, ඒ සියලු ව්‍යාපෘති මේ දක්වාම අභාවිතව පවතී. | වත්කම් අභාවිතව නොතැබිය යුතුය. | උපයෝජනය කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | තවදුරටත් එම වත්කම් අභාවිතව පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2003 පෙබරවාරි 17 දින සභාව විසුරුවා හරින ලද අවස්ථාවේ දී එවකට සිටි සභාපතිවරයා විසින් රැගෙන ගිය සභාව සතු කැබ් රථයක් ආපසු ලබා ගැනීමට වර්ෂ 16ක කාලයක් තුළ කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | කැබ් රථය ආපසු ලබා ගැනීමට සුදුසු පියවර නොපමාව ගත යුතුය. | වාහනය ආපසු ගෙන්වා ගැනීමට පත් කළ කමිටුවට සුදුසු නිලධාරින් ඉදිරිපත් නොවීම හේතුවෙන් සහ සුදුසු මගපෙන්වීම් නොමැතිවීම හේතුවෙන් ක්‍රියාත්මක කළ නොහැකිව පවතී. | වර්ෂ 16කට පසු එම රථය අබලන්ව ලැබී තිබුණ ද, ඊට එරෙහිව ගත් ක්‍රියාමාර්ගයක් නොවුණි. |

**112. වේලනෙයි ප්‍රාදේශීය සභාව**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | රු.885,000ක් වැයකර ඉදි කළ සති පොළක් අභාවිතව පවතී | සති පොළ භාවිතා කිරීමට කටයුතු කළ යුතු වේ. | සතිපොළ බදු ගැනීමට කිසිවෙකු ඉදිරිපත් නොවීය. ඒ නිසා සතිපොළ, කඩ කාමර සංකීර්ණයක් බවට පත්කර කුලියට දීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | තවදුරටත් එම වත්කම් අභාවිතව පවතී. |
| (ආ) | මන්ඩතිව් ප්‍රදේශයේ සංචාරක කර්මාන්තය සංවර්ධනය සඳහා 2016 වර්ෂයේ රු. 30,880,937කට මිල දී ගත් යන්ත්‍රෝපකරණ වර්ෂ 04කට වැඩි කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සලසා තිබුණු අරමුදල් ලද පසු එම යන්ත්‍රෝපකරණ භාවිතා කරනු ලැබේ. | තවදුරටත් එම වත්කම් අභාවිතව පවතී. |

**113. පුනාකරි ප්‍රාදේශීය සභාව**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | කුඹුරු ඉඩම්වල නිවාස 42 ක් ඉදිකර තිබුණද, 2000 අංක 46 දරන කෘෂිකර්ම සංවර්ධන පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව ඊට එරෙහිව පියවර ගෙන නොතිබුණි. | පනතේ ප්‍රකාරව කටයුතු කළයුතුය. | නීතිමය වශයෙන් ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | මේ පිළිබඳ දිස්ත්‍රික් ලේකම්වරයා දැනුවත් කර තිබීම හැර වෙනත් කාර්යයක් සිදුකර නොතිබුණි. |
| (ආ) | වර්ෂ 01 ත්, වර්ෂ 07 ත් අතර කාලයක සිට හිඟහිටීව පවතින රු.2,446,753 ක කුලී හා බදු ආදායම් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | හිඟ ආදායම් නොපමාව රැස් කළයුතු වේ. | කුලී හිමියන් 08 දෙනෙකුට එරෙහිව 2017 වර්ෂයේදී සමථ මණ්ඩලයේ පැමිණිලි කර ඇත. | වර්තමාන තත්ත්වය පිළිබඳ සාක්ෂි නොලැබුණි. |

**114. වවුනියාව දකුණ දෙමළ ප්‍රාදේශීය සභාව**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | ආසික්කුලම්හි ජල ටැංකි සැපයුම් පද්ධතියේ ඉදිකිරීම් කටයුතු 2018 වර්ෂයේදී රු.1,883,353 ක වියදමින් අවසන් කර තිබුණද එය මේ දක්වා භාවිතා කර නොතිබුණි. | භාවිතයට පියවර ගතයුතුය. | අදාළ දෙපාර්තමේන්තු සමඟ සාකච්ඡා කර භාවිතයට ගැනීමට පියවර ගනිමින් සිටී. | මේ දක්වාම අභාවිතව පවතී. |
| (ආ) | එකතුව රු.2,324,340 ක් වූ හිඟහිටි කඩකාමර හා බරවාහන කුලී වර්ෂ 01 ත් 09 ත් අතර කාලයක් පැරණි විය. | ආදායම් රැස්කිරීම මනාව කළමනාකරණය කළයුතු වේ. | වසංගත තත්ත්වය නිසා හිඟ කුලීවලින් කොටසක් ආදායම් නිදහස් කිරීමේ අනුමැතියට යවා ඇති අතර ඉතිරිය යථා කාලයේදී අය කරනු ලැබේ. | මෙම ශේෂය අයකර නොතිබුණි. |

## 115. පච්චිලෙයිපල්ලි ප්‍රාදේශීය සභාව

| | | | |
|---|---|---|---|
| රු.933,223 ක් වැයකර ඉත්තාවිල්හි ඉදි කළ ළමා උද්‍යානය 2019 දෙසැම්බර් මාසයේදී සභාවට භාර දී තිබුණද, එය මේ දක්වාම අභාවිතව පැවතුණි. | සභාව සතු වත්කම් අභාවිතව නොතැබීමට පියවර ගතයුතු වේ. | ළමා උද්‍යානය භාවිතයට සුදුසු ලෙස සකස් කර නොතිබුණි. අවශ්‍ය කාර්යයන් සම්පූර්ණ කිරීමෙන් පසුව භාවිතා කිරීමට කටයුතු කරනු ලැබේ. | මෙම වත්කම තවදුරටත් අභාවිතව පවතී. |

## 116. කරච්චි ප්‍රාදේශීය සභාව

| | | | | |
|---|---|---|---|---|
| (අ) | වට්ටක්කච්චි ආයුර්වේද වෛද්‍ය ශාලාවට 2018 වර්ෂයේදී රු.700,000 ක් වැයකර ඉදිකර දුන් ජල ටැංකියට ජලය පිරවීමට නොහැකි වීමෙන් නිෂ්කාර්යව පැවතුණි. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. | දෙවරක් ජලය පිරවීමට නළ ළිං ඉදි කළද, එම ජලය මහජන භාවිතයට නුසුදුසු විය. මේ නිසා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ජලය පිරවීමට සැලසුම් කර ඇත. | මේ දක්වාම ජල ටැංකිය අභාවිතව පවතී. |
| (ආ) | ව්‍යාපෘති 12 ක ඉදි කිරීම් ප්‍රමාද වීම මත අය කළයුතු රු.1,420,409 ක් ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අය කළයුතු වේ. | මෙම ප්‍රමාද ගාස්තු තැන්පත් කර ඇත. පළාත් පාලන කොමසාරිස්වරයාගේ උපදෙස් මත කටයුතු කරනු ලැබේ. | අදාළ උපදෙස් මත කටයුතු කිරීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 මාර්ගෝපදේශය ප්‍රකාරව එල්ලෙන පාලම් ව්‍යාපෘතිය සඳහා මිල ගණන් කැඳවා නොතිබුණු අතර ගිවිසුම්ද අත්සන් නොකර රු.1,400,000 ක් ගෙවා තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව ක්‍රියා කළයුතු වේ. | එල්ලෙන පාලම් ඉදිකිරීම් සම්බන්ධයෙන් විශේෂඥයින් කිලිනොච්චිය ප්‍රදේශය තුළ සිටින බැවින් ප්‍රසම්පාදන ක්‍රියාවලියක අවශ්‍යතාවයක් පැන නොනැගිණි. | නීතිරීති වලට පටහැනිව සිදු කළ මෙම ක්‍රියාවට එරෙහිව අවශ්‍ය ඉදිරි පියවර ගෙන නොතිබුණි. |
| (ඈ) | කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ජනතාව පදිංචි කිරීමේ අරමුණින් ලබාදුන් කනගපුරම් මාර්ගයේ පිහිටි ඉඩම්වල අනවසර කඩකාමර 169 ක් ඉදිකර තිබුණද, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 52 වගන්තිය ප්‍රකාර ඒවා ඉවත් කිරීමට පියවර ගෙන නොතිබුණි. | පනතේ විධිවිධානවලට අනුව පියවර ගතයුතු වේ. | පදිංචි වීමට ලබාදුන් ඉඩම්වල කඩකාමර ඉදි කරන විට ගොඩනැගිලි අනුමැතිය ලබාදිය නොහැකි තත්ත්වයක් පවතී. | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් සාධනීය පියවර ගෙන නොතිබුණි. |
| (ඉ) | වර්ෂ 01 ත්, වර්ෂ 05 ත් අතර කාලයක් පැරණි හිඟ බදු හා කුලී රු.11,740,658 ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | හිඟ කුලී හා බදු මුදල් අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගතයුතු වේ. | නීතිමය පියවර ගනිමින් පවතී. | මෙම ණය ශේෂ මේ දක්වාම නිරවුල් වී නොතිබුණි. |
| (ඊ) | සභාව සතු රු.11,238,788 ක් වටිනා උද්‍යාන 02 ක් සහ කාබනික පොහොර සැකසීමේ ගොඩනැගිල්ල වර්ෂ 03 කට අධික කාලයක සිට අභාවිතව පැවතුණි. | සභාව සතු වත්කම් භාවිතා කිරීමට ඵලදායි පියවර ගතයුතු වේ. | භාවිතා කිරීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | මෙම වත්කම් අභාවිතව පැවතුණි. |

**117. වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව**

| | | | | |
|---|---|---|---|---|
| (අ) | වර්ෂ 06 ක් පැරණි කඩ කාමර කුලී රු.2,400,090 ක් ද, වර්ෂ 03 ක් පැරණි හිඟ බදු කුලී රු.885,917 ක්ද, වර්ෂයකට වඩා පැරණි අක්කර බදු හා වාහන කුලී එකතුව රු.557,785 ක් ද අයකර නොතිබුණි. | ආදායම් රැස් කිරීම මනාව කළමනාකරණය කළයුතු වේ. | හිඟ ආදායම් අය කිරීමට කටයුතු කරමින් පවතී. | මෙම කුලී අයකර නොතිබුණි. |
| (ආ) | උතුරු වසන්තය වැඩ සටහන මගින් 2011 වර්ෂයේදී ඉදිකර සභාවට භාරදුන් රු.26,137,591 ක් වූ නෙඳුර්කර්නි බස් නැවතුම්පොළ සහ කඩ කාමර වර්ෂ 10 කට අධික කාලයක සිට මේ දක්වාම අභාවිතව පවතින අතර පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන ව්‍යාපෘතිය යටතේ සභාවට භාරදුන් රු.825,697 ක් වූ බෝගස්වැව සතිපොළ ගොඩනැගිල්ල පසුගිය වර්ෂ 05 කට අධික කාලයක සිට භාවිතයට ගැනීමට පියවර ගෙන නොතිබුණි. | සභාව සතු දේපළ භාවිතා කිරීමට ඵලදායි ක්‍රියාමාර්ග ගතයුතු වේ. | කඩකාමර සහ සතිපොළ ගොඩනැගිල්ල වෙනත් සුදුසු කටයුතු සඳහා භාවිතා කිරීම පිළිබඳ පරීක්ෂා කරමින් පවතී. | මේ දක්වාම එම වත්කම් අභාවිතව පවතී. |